# පුස්තකාල ප්‍රවෘත්ති

ශ්‍රී ලංකා ජාතික
පුස්තකාල සේවා මණ්ඩලයේ
ප්‍රවෘත්ති ප්‍රකාශනය

8 වන කලාපය 1/2 — 1987 ජනවාරි—ජූනි

## පටුන



| | |
|---|---|
| කතුවැකිය | 1—3 |
| ශ්‍රී ලංකාවේ බුද්ධිමය නීති සංග්‍රහය පනත පිළිබඳ විමසීමක් | 4—8 |
| ග්‍රන්ථ විචාර | 9—12 |
| Medical and Health Related Libraries in Sri Lanka | 13—18 |
| අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ක්‍රමය | 20—25 |
| පරිගණකය හා පුස්තකාල ග්‍රන්ථ සංසරණය | 26—28<br>33—34 |
| ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතියේ ග්‍රන්ථ නාමාවලිය | 29—30 |
| පුවත් ලුහුඬින් | 35—37 |


# පාසල් පුස්තකාල සංවර්ධනය

පාසල් පුස්තකාල, අධ්‍යාපන ක්‍රියාවලියේ ඉතාම වැදගත් අංගයක් ලෙස සැලකේ. ඉගැන්වීම් හා ඉගෙනීමේ කාර්යයේ නිරත ගුරු ශිෂ්‍ය දෙපක්ෂයටම අවශ්‍ය දැනුම, තොරතුරු සම්භාරය එහි ගබඩා කර ඇත. මෙතෙක් ලබා ගෙන ඇති දැනුමට නවතම තොරතුරු ඇතුළත් කර ගැනීමට පාසල් පුස්තකාල මගින් ගුරුවරයාට අවසථාව ලැබෙන අතර, පන්ති කාමරයේදී ලබා ගත් දැනුම තවත් පුළුල් කර ගැනීමට ශිෂ්‍යයාට අවස්ථාව සැලසේ. පාසල් පුස්තකාලය පාසල් අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය බවට පත් වී ඇත්තේ මේ පසුබිම මත ය.


පුස්තකාල ඇති පාසල්වල, එම පුස්තකාල ක්‍රමානුකූලව සංවිධානය කිරීමත්, පුස්තකාල නොමැති පාසල් වල පුස්තකාල ආරම්භ කිරීමත් එම පුස්තකාල ද ආරම්භයේ සිට ම ක්‍රමානුකූලව සංවිධානය කිරීමත් කළ යුතුව ම ඇති කාර්යයකි. මේ කාර්යයෙහිලා අධ්‍යාපන සේවා අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය ක්‍රමවත් වැඩ පිළිවෙළක් දියත් කර ඇත.

බොහොමයක් පාසල්වල පුස්තකාල ඇතත්, එම පුස්තකාල සඳහා වෙන් වුණු වෙන ම ගොඩනැගිල්ලක් නැත. මේ නිසා පුස්තකාලයේ පොත් පත් හා අනිකුත් මුද්‍රිත ද්‍රව්‍ය ක්‍රමානුකූලව සංවිධානය කිරීමට අපහසුවක් ඇති වේ. ශබ්ද තැටි, ශබ්ද පටි, කැසට්, ස්ලයිඩ්ස් චිත්‍රපට, වීඩියෝ කැසට්, වීඩියෝ තැටි, මුද්‍රිත ද්‍රව්‍යවලට අතිරේකව නව තොරතුරු මාධ්‍යයක් වශයෙන් පුස්තකාලවලට ඇතුළත්ව ඇති බැවින් පාසල් පුස්තකාලය




## සභාපති ධුරයට නැවතත්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති සුගුණදාස අතුකෝරාළ මහතා නැවතත් එම ධුරයට පත් කරනු ලැබ සිටී. 1982 වර්ෂයේ දී මුලින්ම සභාපති ධුරයට පත් වූ ඒ මහතාගේ පස්අවුරුදු සේවා කාලය 1987 ජනවාරි මාසයේ අවසන් විය. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවීමෙන් පසු එහි සභාපති ධුරයට පිට පිට ම දෙවතාවක් පත් වීමේ ගෞරවය හිමි වන්නේ අතුකෝරාළ මහතාට පමණකි.



## කොළඹ මහජන පුස්තකාලයේ නව පුස්තකාලයාධිපති

කොළඹ මහජන පුස්තකාලයේ පුස්තකාලයාධිපති තනතුරට එම පුස්තකාලයේ නියෝජ්‍ය පුස්තකාලයාධිපති තනතුර දරූ එම්. ඩී. එච්. ජයවර්ධන මහතා පත් වී ඇත. මහජන පුස්තකාල සේවයේ දැනට අවුරුදු විස්සක පමණ සේවා කාලයක් සපුරා ඇති ජයවර්ධන මහතා, මෙම තනතුරට පත්වීමට කලින් මාවතගම පිලැස්ස ගම්කාර්‍ය සභා මහජන පුස්තකාලයේත්, බදුල්ල – ඩී. එස්. සේනානායක අනුස්මරණ මහජන පුස්තකාලයේත්, දෙහිවල මධ්‍ය පුස්තකාලයේත් සේවය කර ඇත. කැලණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පරීක්ෂණයෙන් ද, ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අවසාන පරීක්ෂණයෙන් ද ඒ මහතා සමත් වී ඇත.




## පුස්තකාල මණ්ඩලයෙන් නව ප්‍රකාශන දෙකක්

### ඌවේ ජනකවි

1982 සිට ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ජන සංස්කෘතික අංශයට වාර්තාගත නොවූ ජන සාහිත්‍ය පිළිබඳ අත් ලිපි, රචනා සැපයූ අභාවප්‍රාප්ත පීටර් විජේසිංහ මහතාගේ එම අත් ලිපි අතුරින් ඌවට විශේෂිත කවි එකතු කර "ඌවේ ජනකවි" නමින් නව ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කර ඇත.

මෙම ග්‍රන්ථයේ ජනකවි 306 ක් ඇතුලත් වේ. එම ජනකවිවල ඇතුලත්ව ඇති ජනවහර, ස්ථාන නාම හා සංඥා නාම අකාරාදි පිළිවෙලට ග්‍රන්ථයේ අග සඳහන් කර ඇත. මෙම ග්‍රන්ථයේ කවරය සඳහා ලියවැල් රටාවකින් සැරසුම් ලද ග්‍රන්ථ කංචුකයක් යොදා ඇත.



**ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය. – හැඳින්වීමක්**

(12 පිටුව බලන්න.)

ශ්‍රී ලංකා ජාති[illegible] සේවා [illegible]ඩල[illegible]
[illegible]

සඳහා වෙන් වුණු ගොඩනැගිල්ලක් නොමැතිවීම බලවත් අපහසුවකට තුඩු දෙනු ඇත. පුස්තකාලයට ඇතුළු වූ අවස්ථාවේ සිට එය විශේෂ පරිසරයක් විය යුතුවේ. පාසල් පුස්තකාල මගින් මනස තුළ කියවීම් රුචිය වැඩි කළ යුතු අතර, එමගින් පන්ති කාමරයේ දී ලත් දැනීම තව දුරටත් පුළුල් කිරීමට අවකාශ සැලසිය යුතුය.

පාසල් පුස්තකාල ගොඩනැගිලිවල ඇති අඩුව සපුරාලීම සඳහා අධ්‍යාපන සේවා අමාත්‍යාංශය ගෙන ඇති වැඩ පිළිවෙළ අනුව රජයේ ආධාර හා මහජන ආධාර ලබාගෙන ඒ ඒ පාසල්වල පුස්තකාල ගොඩනැගිලි ඉදි කර ගෙන යනු ලැබේ. මේ කාර්යයේදී පාසල් සංවර්ධන සමිති, ඒ ඒ පාසල්වල අභිවෘද්ධිය පතන විවිධ ආයතන, සමිති සමාගම් හා සිසුන්ගේද ආධාර ලබා ගැනීමට කටයුතු කර ඇත. මේ අනුග්‍රහයන් මත ඉදි වන පුස්තකාල ගොඩනැගිල්ල තුළින් ඒ ඒ පාසල සඳහා අවශ්‍ය පුස්තකාලයන් සඳහා ස්ථිර පදනමක් දැමීම අමාත්‍යාංශයේ අරමුණ බව පැහැදිලි ය.

සංවිධානය වන පාසල් පුස්තකාල සඳහා අවශ්‍ය ලී බඩු උපකරණ මණ්ඩලය මගින් ප්‍රදානය කරනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවන්හිදී සාදා ගැනීම පිණිස පුස්තකාල ලී බඩු උපකරණවල සැලසුම් ද සපයනු ලැබේ. අලුතින් ආරම්භ වන පාසල් පුස්තකාලවලට පොත් කට්ටල පරිත්‍යාග කිරීම මෙන් ම සංවිධානය වෙමින් පවතින පුස්තකාලවලට එම පුස්තකාලවල ඇති පොත් සම්භාරය තව තවත් පුළුල් කිරීම සඳහා ද පොත් පරිත්‍යාග කරනු ලැබේ. ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අනුග්‍රහය ලබමින් ප්‍රකාශයට පත් පොත්වලින් මණ්ඩලය ලබාගත් පිටපත්, විශේෂ අඩු මිලකට පුස්තකාල සඳහා ලබා දීමට කටයුතු කිරීම ද, ඌන ආර්ථික ශක්තියක් ඇති පාසල් තම පුස්තකාලවල පොත් සංඛ්‍යාව වැඩි කර ගැනීමට හොඳ අවස්ථාවක් පාදා දීමකි.

එසේ ඉදි වූ ගොඩනැගිලිවල ක්‍රමවත්ව සංවිධානය වූ පුස්තකාල පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය පුහුණුවක් සහ විෂය පිළිබඳ අවබෝධයක් ඇති පුස්තකාලයාධිපතිවරුන් බිහි කිරීම මිළඟ කාර්යයයි. පාසල් පුස්තකාලයාධිපතිවරුන් මේ කාර්යයෙහිලා පුහුණු කිරීම ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් කරනු ලැබේ. අධ්‍යාපන සේවා අමාත්‍යාංශය සමග සහයෝගයෙන් පසුගිය වසර දෙක හමාර තුළ පාසල් පුස්තකාලයාධිපතීන් 2500 කට ආසන්න පිරිසක් මණ්ඩලය මගින් පුහුණු කර ඇත.

පාසල් පුස්තකාල සංවිධාන කටයුතු පරීක්ෂා කර බලා එහි ඌනතා පෙන්වා දීමත්, එම ඌනතා මගහරවා ලීම සඳහා තාක්ෂණික උපදෙස් දීමත් මණ්ඩලය මගින් මේ හා සම්බන්ධව කරනු ලබන තවත් සේවාවකි.

පාසල් පුස්තකාල සංවර්ධනය කිරීම සඳහා අධ්‍යාපන සේවා අමාත්‍යාංශයත්, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයත් සැලසුම් කර ඇති ක්‍රියා පිළිවෙළින් ප්‍රයෝජනයක් ලබා ගැනීම විදුහල්පතිවරුන්ගේ සහ පාසල් පුස්තකාලයාධිපතීන් ගේ එක් කාර්ය භාරයකි. පාසල් පුස්තකාල සංවර්ධනය කිරීම ජාතියේ අනාගතය භාර ගැනීමට සූදානම් වන පිරිස සඳහා ඉටු කරනු ලබන මහඟු කාර්යයක් වන්නේය.

## මණ්ඩලයේ සාමාජිකත්වයට පත්වෙයි.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ මාණ්ඩලීය සාමාජිකත්වයට, කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ටී. ඩී. ජේ, විතාරණ මහතා පත් කරනු ලැබ සිටී. ඒ මහතා පත් කරන ලද්දේ කලින් කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය නියෝජනය කළ පී. බී. වේරගොඩ මහතා වෙනත් අමාත්‍යාංශයකට පත්ව ගිය හෙයිනි.

# ශ්‍රී ලංකාවේ බුද්ධිමය නීති සංග්‍රහය පනත පිළිබඳ විමසීමක්

## පසුබිම

කර්තෘ සහ ප්‍රකාශන අයිතිය පිළිබඳ අදහස මෑතකදී ඇතිවූ වර්ධනයක් ලෙස පෙනී ගිය ද, එය මානව ශිෂ්ටාචාරය තරම් ම පැරණි බව පෙන්වා දිය හැකිය. ක්‍රි. ව. 6 වැනි සියවසේදී ශාන්ත කොලුම්බා සහ ඔහුගේ ගුරුවරයා වූ මොවිල්හි පීනියන් අතර ඇතිවූ කර්තෘ අයිතිය පිළිබඳ ආරාවුලකදී ඩයර්මෙඩ් රජු විසින් ගුරුවරයාට පක්ෂව දෙන ලද තීන්දුවකින් කර්තෘ අයිතිය පිළිබඳ ප්‍රශ්නය ලොවට හෙළිවූ බව පෙන්වා දෙති. මෙම නඩුවේදී සිදුවූයේ, ගුරුවරයා විසින් තම ගෝලයා වූ ශාන්ත කොලොම්බු හට දුන් පොතක් ඔහු මුළු රාත්‍රී කාලයම ගත කර පිටපත් කර ගැනීම නිසා ගුරුවරයා විසින් තම මුල් පිටපතත්, කොපි කරන ලද පිටපතත් ගෝලයාගෙන් ඉල්ලා සිටීමයි. **"සෑම එළදෙනෙකටම තම ගවපොව්වා හිමිවන්නාසේ, සෑම පොතකම පිටපත, එම පොතටම හිමිවිය යුතුය."** යන ප්‍රසිද්ධවූ ප්‍රකාශය කරමින් මුල් පොත හා පිටපත ද ගුරුවරයාට දිය යුතු යයි නියෝග කරමින් ප්‍රථම කර්තෘ අයිතියේ තීන්දුව ලොවට හෙළි කැරිණි. ඒ අතර, ඉන්දියාවේ මූගල් අධිරාජයා වූ අවුරත් සෙබ් පවා තම පෞද්ගලික වැයට මුදල් උපයා ගැනීමට, පිටපත් කරන්නන් ලවා කෝරානය පිටපත් කළ බව වාර්තා වේ. මෙයින් පෙනී යනුයේ, ඈත අතීතයේ සිට පොත පත අනවසරයෙන් පිටපත් කිරීමත්, ඒ සඳහා සීමා පැනවීමත් සිදුවී ඇති බවයි.

ජෝන් ගුටන්බර්ග් විසින් පහළොස් වැනි සියවසේදී මුද්‍රණ ශිල්ප යන්ත්‍රය වඩා දියුණු ක්‍රමයකට යොදා ගැනීමෙන් පසු පොත පත පළවීම සීඝ්‍ර වී යෑම හේතුකොට ගෙන කර්තෘ හා ප්‍රකාශක අයිතිය පිළිබඳ ප්‍රශ්න සමාජයේ වඩා කැපී පෙනෙන්නට විය. එහෙත්, තම කෘතීන් අනුන් විසින් උදුරා ගන්නා බව කර්තෘවරයාට මනාව දැනුණේ පසු කලෙකය.

මෑතකදී උගත්කම පැතිරී යාමත්, ජන සංනිවේදන මාධ්‍යය සීඝ්‍රයෙන් දියුණුවීමත් හේතු කොට ගෙන තත්වය සම්පූර්ණයෙන්ම වෙනස් වී ඇත. අද නිර්මාණාත්මක කෘතීන් ඉතා වාසිදායක ලාභ ගෙන දෙන අංශයක් බවට පත්ව ඇත.

අද සමාජය නිර්මාණාත්මක කෘතීන් සහ සංස්කෘතික කටයුතු සඳහා පුළුල් අනුග්‍රහයක් දක්වන නිසා, නිර්මාණාත්මක කෘතීන් බිහිකරන පුද්ගලයාගේ අයිතිය රැකීමත්, ඔහුට යහපත් තත්වයක් ලබාදීමත් සමාජයේ යුතුකමක් වී ඇත. මෙම යුතුකම කර්තෘගේ අයිතිය පිළිබඳ නීතියේ ගැබ්වී ඇති අතර, එය මුළු ලෝකයේ ම නිර්මාණාත්මක සහ සංස්කෘතික කටයුතු දියුණු කිරීම කෙරෙහි අතිශයින් වැදගත් ලෙස බලපා ඇත.

අද නීතියෙන් කර්තෘට සලසා ඇති ආරක්ෂාවක් ලෙස සැලකිය හැකි කර්තෘ අයිතිය, ඔහුගේ කෘතීන් භාවිතයට හෝ තහනම් කිරීමට කර්තෘවරයාට සලසා ඇති පරම අයිතියක් ලෙස ගිණිය හැකිය. මේ අනුව, කර්තෘ හිමිකම් පිළිබඳ නීතියේ සාරය වනුයේ, "නිර්මාණාත්මක කෘතියේ අයිතිය කර්තෘටම හිමිවිය යුතු බවය. එය ඔහුගේ පරම අයිතියකි." මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයෙන් වඩා අවධාරණය කරන ලද මෙම කර්තෘ අයිතිය, යටතේ "ඕනෑම විද්‍යාත්මක, සාහිත්‍යමයහෝ කලාත්මක නිෂ්පාදනයක කර්තෘවරයාට ඉන් උපදනා සදාචාරාත්මක සහ භෞතික වාසි සියල්ලටම අයිතිය ලබා ගැනීමේ පරම අයිතියක් තිබිය යුතු ය."

මේ අතර, කර්තෘවරයාගේ අයිතිය හා එම කෘතිය ප්‍රකාශකයාගේ අයිතිය සමග බද්ධව ක්‍රියා ගතවේ. ඊට හේතුව, කර්තෘගේ නිර්මාණාත්මක කෘතිය සමාජයට එළි දක්වා එයින් සමාජයට ලබාදෙන සෙත සහ කර්තෘවරයාට ඉන් ලැබෙන මානසික තෘප්තිය සහ ආර්ථික වාසි, ප්‍රකාශකයා එම නිර්මාණ කෘතිය ප්‍රසිද්ධ කිරීමට කරන අවදානම් ආයෝජනය මත රඳා පවතින නිසයි.

කර්තෘවරයාට ප්‍රකාශකයා වීමේ භාග්‍යය අද ලෝකයේ ලැබී ඇත්තේ ඉතා ස්වල්ප දෙනෙකුටය. එබැවින් කර්තෘ අයිතිය හා ප්‍රකාශන අයිතියත්, සමාජයේ දියුණුවට උපකාරී වන ලෙස නිර්මාණාත්මක කෘති විවිධ ආයතන සහ පුද්ගලයින් යොදා ගැනීමත් අතර, කර්තෘ අයිතිය පිළිබඳ නීති රීති සැකසිය යුතු වේ. ක්‍රියාගත කළ යුතු වේ. මෙසේ කර්තෘ, ප්‍රකාශක සහ සමාජය යන තුන් පක්ෂය අතර, නිර්මාණාත්මක කෘතීන් බිහි කිරීමෙහිලා යොදා ගන්නා කර්තෘ අයිතිය හෙවත් බුද්ධිමය දේපළ පිළිබඳ නීති රීති බොහෝ විට අතරමං වේ.

ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ නීති සංග්‍රහ පනත්, ඉහත දක්වා ඇති පසුබිම අනුව සලකා බැලීමට සිදුවන්නේ මේ නිසයි.

## 1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනත බිහිවීම

බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනත බිහිවූයේ, ශ්‍රී ලංකාවට දේශපාලන නිදහස ලැබී වර්ෂ 31 කට පසුවය. ඒ දක්වා ශ්‍රී ලංකාවේ පොත් පත් කර්තෘ හිමිකම් සහ ප්‍රකාශක අයිතිය පිළිබඳව බලපැවැත්වූයේ 1912 ජූලි මස 01 වෙනි දින සිට ශ්‍රී ලංකාවේ ක්‍රියාගත වූ 1911 බ්‍රිතාන්‍ය ප්‍රකාශන හිමිකම් පනත සහ 1886

# ආචාර්ය කේ. ඩී. ජී. විමලරත්න

**නියෝජ්‍ය අධ්‍යක්ෂ, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව**


සැප්තැම්බර් මස 09 වෙනි දින බිහිවූ, බ්‍රිතාන්‍ය යටත් විජිතයක් ලෙස ශ්‍රී ලංකාවටද බලපෑ, 1971 ජූලි මස 14 දින සංශෝධනය කළ අවස්ථාවේදී ශ්‍රී ලංකාවද අත්සන් කොට, ඇතුළත් වූ බර්න් සම්මුතියේ විධි-විධාන ද වේ. 1911 බ්‍රිතාන්‍ය කර්තෘ හිමිකම් පනත, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ අයිතිවාසිකම් හෙවත් විදේශ රටවලින් මෙරටට ආනයනය කරනු ලබන, පොත්-පත්වල අලෙවිය සහ සංසරණය පිළිබඳ සීමා පැනවූ පනතක් ලෙස හැඳින්විය හැකිය. මෙම පනත ශ්‍රී ලංකාවේ දේශීය කර්තෘවරුන්ගේ සහ ප්‍රකාශන පිළිබඳ වැඩි අවධානයක් යොමුකර නොතිබුණි. 1960 ගණන්වල ශ්‍රී ලංකාවට නව කර්තෘ / ප්‍රකාශන හිමිකම් පිළිබඳ පනතක් අලුතින් ඇති කිරීමේ අවශ්‍යතාවය උද්ගත වී, එවැනි පනතක් මූලික කෙටුම්පත් කළද එය නීතිගත නොවීය. එහෙත්, 1885 අප්‍රේල් මස පළමුවෙනි දින සිට ශ්‍රී ලංකාවේ ප්‍රකාශක කර්තෘ හිමිකම් ලියා පදිංචි කිරීමක් සිදුවූ බව 1885 අංක 01 දරන මුද්‍රණකරුවන්ගේ සහ ප්‍රකාශකයින්ගේ ආඥා පනතේ 05 වැනි ඡේදයේ (එෆ්) අනුඡේදය අනුව පැහැදිලි වේ.

කෙසේ වුවද, අද මෙරට ක්‍රියාගත වන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනත, මීට පෙර මෙරට ක්‍රියා-ගත වූ 1911 බ්‍රිතාන්‍ය ප්‍රකාශන අයිතිය පිළිබඳ පනතද, 1886 බර්න් සම්මුතිය හා 1952 ප්‍රකාශන අයිතිය පිළිබඳ විශ්ව සම්මුතියේ සඳහන් සමහර විධිවිධානද ලෝකයේ මෑතකදී ප්‍රකාශ කිරීමේ සහ පිටපත් කිරීමේ නව ශිල්පීය ක්‍රම හේතුකොට ගෙන ඇතිවූ නව ආනතීන්ද සැලකිල්ලට ගනිමින් සකස් කරන ලද පනතක් ලෙස හැඳින්විය හැකිය. එහෙත්, එම පනතේ සඳහන් විධිවිධාන පරීක්ෂා කිරීමේදී පහත සඳහන් ඌනතා, ගැටලු සහ අවශ්‍ය සාධාරණීය ප්‍රතිශෝධන හුවා දැක්විය හැකි ය.

**(1) ප්‍රකාශන අයිතිය**

ප්‍රකාශන අයිතිය (copyright) යනු කුමක්ද ? ඒ පිළිබඳව නිර්වචනයක් දීම සාමාන්‍යයෙන් සෑම ප්‍රකාශන අයිතිය පිළිබඳව පැනවී ඇති අණ පනත්-වල අඩංගු වේ. ඒ අනුව කර්තෘ හිමිකම් අයිතීන් පහක් දැක්විය හැකිය. (1) කෘතිය ප්‍රතිරූපණය කිරීම. (2) ව්‍යුත්පන්න කෘති සකස් කිරීම. (3) මහ-ජනයාට කෘතිය බෙදා හැරීම (4) මහජනයාට කෘතිය රඟ දැක්වීම සහ (5) මහජනයාට කෘතිය ප්‍රදර්ශනය කිරීමයි.

ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනතේ ''ප්‍රකාශන අයිතිය'' නිර්වචනය කර, නොතිබීමෙන් සමහර විට කර්තෘගේ අයිතිය නොව ප්‍රකාශන අයිතිය හෝ කර්තෘ ප්‍රකාශනයට ඇති අයිතිය පමණක් ආරක්ෂා වන බවට අදහසක් යමෙකු තුළ හට ගැනීමට ඉඩ ඇත. ඊට වඩාත්ම බල-පාන්නේ, පනතේ (copyright) යන ඉංග්‍රීසි වචනයේ සිංහල පරිවර්තනය ''ප්‍රකාශන අයිතිය'' යනුවෙන් සඳහන් කර තිබීමය. මේ අනුව (copy-right) යන වචනයට නියම නිර්වචනයක් දීම සලකා බැලිය යුතු කරුණකි.

**(II) කර්තෘ අයිතිය ආරක්ෂා කර ඇති කාලය**

1886 බර්න් සම්මුතිය සහ 1911 බ්‍රිතාන්‍ය කර්තෘ හිමිකම් පනත අනුව යමින්, යම් කෘතියක කර්තෘ අයිතිය, කර්තෘගේ ජීවිත කාලය තුළ සහ ඉන් ඉක්බිති අවුරුදු පනහක් ඉක්මවන තුරු පැවතිය යුතු බව පනතේ 11 (2) (1) වගන්තියෙන් පැහැදිලි කර ඇත. දැනට ගණන් බලා ඇති අයුරින්, ජීවිත කාලය තුළ සහ වර්ෂ 50 නීතිය අනුව, සාමාන්‍යයෙන් අවුරුදු 70 – 76 කාලයක් කර්තෘ අයිතිය පවතී. බර්න් සම්මුතිය ඉහත දීර්ඝ කාලය අඩංගු කළේ, කතුවරයාට ඔහුගේ ජීවිත කාලය තුළදීද, ඔහුගේ උරුමක්කාරයන්ටද යම් වාසි සලසාදීමටය. කර්තෘ හිමිකම් පිළිබඳ විශ්ව සම්මු-තියේ, කර්තෘගේ අයිතිවාසිකම් ඔහුගේ ජීවිත කාලය තුළ සහ මරණින් වර්ෂ 25 කට සීමාකර ඇති අතර, කෘතියේ අඩංගු දේ ඉක්මනින් සමා-ජයට ලබාදීමට ඉඩකඩ සලසන ලදී. කර්තෘ හිමිකම් පිළිබඳ නීතිය අනුව, යම් පුද්ගලයෙකුට ඔහුගේ කෘතිය සඳහා ආරක්ෂාව සලසන්නේ ඔහු තුළ තිබූ නිර්මාණාත්මක කුසලතාව නිසාය. මෙම කුසලතාව කර්තෘවරයාටම පමණක් හිමි-වන්නක් මිස, ඔහුගේ උරුමක්කාරයින්ට ඉන් අයිතියක් ඇද්ද යන්න සලකා බැලීම වටී. 1924 දී මැක්මිලන්ට එරෙහිව වී. කූපර් නඩුවේදී, ඇට්-කින්සන් සාමිවරයා කර්තෘ හිමිකමේ ස්වරූපය ප්‍රකාශ කළේ, ''කෘතියක් එක් පුද්ගලයෙකුගේ ශ්‍රමය, කුසලතාව හා ධනයේ නිෂ්පාදිතය බැවින් වන නිසා අන් අයෙකුට එහි ඵල නොලැබිය යුතුය'' යනුයි. මෙසේ උදාහරණයක් වශයෙන්, තම සීයාගේ කුසලතාවය හා නිර්මාණාත්මක භාවය නිසා නිපන් කෘතියකට, එම කෘතියේ බිහිවීමට කිසිදු සබඳතාවක් නැති ඔහුගේ මුනු-පුරෙකුට, එහි අයිතිවාසිකම් පැවරීම යුක්ති යුක්තද? මේ අනුව, කර්තෘ හිමිකම් අයිතිය, කර්තෘට ම පම-ණක් හිමිවන්නාවූ අයිතියක් ලෙස පිළිගන්නේ නම්, කර්තෘගේ මරණින් පසු තවත් වර්ෂ 50 ක දීර්ඝ කාලයක් ආරක්ෂා කර තැබීම වටනේදැයි සලකා බැලිය යුතුය.

**(III) අප්‍රකාශිත කෘතිවල ආරක්ෂාව**

1886 බර්න් සම්මුතියේ 15 (4) වගන්තිය අනුව, ආරක්ෂාව සලසන ලද්දේ ප්‍රකාශිත කෘතිවලට

පමණක් නොවේ. අප්‍රකාශිත කෘති ද ආරක්ෂා කළයුතු බවට නීතිගත වී ඇත. එහෙත් බුද්ධිමය දේපළ නීති සංග්‍රහ පනතේ, අප්‍රකාශිත කෘතිවල ආරක්ෂාව ගැන සඳහනක් නැත. බොහෝ විට කතුවරයෙකුගේ අප්‍රකාශිත කෘති සමහර ප්‍රකාශකයින්ගේ හෝ තම හිතවතෙකුගේ හෝ ඥාතියෙකුගේ ගොදුරක් බවට පත්වී, කර්තෘවරයාට ඉන් ලැබිය යුතු ගෞරවය සහ අනිකුත් වාසි නොලැබී යාමට ඉඩ ඇත. මේ පනතින් අප්‍රකාශිත සාහිත්‍ය හා කලාත්මක කෘති සඳහා ආරක්ෂාවක් සලසා නොතිබීම සලකා බැලිය යුතු කරුණකි.

අප්‍රකාශිත කලාත්මක හා සාහිත්‍යමය කෘතීන් සඳහා ලියා පදිංචි කිරීමේ ක්‍රමයක් සැකසීම ඉතා වැදගත් වේ. මේ මාර්ගයෙන් අප්‍රකාශිත කෘතියක් යමෙකු විසින් නීති විරෝධීව ප්‍රකාශ කළහොත්, ඒ සඳහා වැදගත් සාක්ෂියක් ලෙස සැලකීමට ලියාපදිංචි ක්‍රමය කර්තෘවරයාට මහෝපකාරී වනු ඇත. දැනට ජාතික ලේඛනාගාරවල සහ ජාතික පුස්තකාලවල තැන්පත් අප්‍රකාශිත කෘතීන් හා ලේඛන සඳහා ආරක්ෂාවන් සලසා ඇත. ඊට හේතුව, යමෙකු තමාගේ අප්‍රකාශිත කෘතියක් හෝ ලේඛන, ජාතික ලේඛනාගාරයක හෝ පුස්තකාලයක තැන්පත් කිරීමේදී ඒ සඳහා කර්තෘ හෝ හිමිකරුගේ වරය ප්‍රකාශ කිරීමේ පත්‍රයක් ( Franchise form ) සම්පූර්ණ කර, තැන්පත් කරනු ලබන ජාතික ආයතනයේ ප්‍රධානියා සමග සම්මුතියකට පැමිණීමයි. එහෙත් කර්තෘවරුන්, තමා ළඟ ඇති හෝ ප්‍රකාශනය සඳහා සලකා බැලීමට භාර දෙන ලද කෘති සඳහා ආරක්ෂා ක්‍රමයක් සලසා තිබීම වැදගත් ය.

## (IV) කෘතියක නාමය හා ප්‍රකාශන අයිතිය

සාමාන්‍යයෙන්, ප්‍රකාශන අයිතිය පිළිබඳ නීතිය යටතේ සාහිත්‍යමය කෘතියක විෂය නාමයට හෝ නාමයට ආරක්ෂාවක් නොසැලසේ. එහෙත්, යමෙක් යම් කෘතියක නාමය හෝ විෂය නාමය ප්‍රතිරූපණය කළේය, යන පදනම මත අභියෝගයක් එල්ල කළහොත්, විෂය නාමය ප්‍රතිරූපණය කිරීම පිළිබඳව නඩු මගට බැසිය හැකිය. ප්‍රසිද්ධ කෘතියක නාමය පිටපත් කිරීමෙන් ප්‍රකාශන අයිතිය උල්ලංඝනය කිරීමේ අවස්ථා උද්ගත වී ඇත. මුද්‍රණකරුවන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥා පනතේ ( 179 අධිකාරය 5 ඒ ) වගන්තිය අනුව, ප්‍රකාශකයා විසින් ග්‍රන්ථ නාමය පැහැදිලිව ලියා පොත් හා පුවත් පත් රෙජිස්ට්‍රාර්වරයා වෙත දැන්විය යුතුය. මෙම ආඥා පනතේ 6 වැනි වගන්තිය අනුව ග්‍රන්ථවල විෂය නාම, කර්තෘ නාම හා ග්‍රන්ථයට අදාළ විස්තර ගැසට් පත්‍රයේ පළ කරන බැවින්, එය නීතිගත වීමක් හා ලියාපදිංචියක් ලෙස සැලකිය හැකිය. එහෙත්, බුද්ධිමය දේපළ පනත, ලංකා ආඥා පනතේ ( 179 අධිකාරය ) 5 වැනි හා 6 වැනි වගන්තියට යොමු කිරීමක් කර නොමැති හෙයින් ඉහත ආඥා පනත යටතේ කෙරෙන ලියාපදිංචිය, ප්‍රකාශක අයිතිය පිළිබඳ නීති රීති යටතේ කෙරෙන ලියාපදිංචියක් ලෙස සැලකිල්ලට ගත නොහැකිය. මේ හේතුවෙන් ග්‍රන්ථයක විෂය නාමය, ප්‍රකාශන අයිතියට යටත්වේද යන්න අවිනිශ්චිත තත්වයක පවතී.

## (V) ඡායාරූපවල ප්‍රකාශන අයිතිය

ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනත අනුව, පොත පතේ පළ වන ඡායාරූපවල ප්‍රකාශන අයිතිය ඡායාරූපය ගන්නා ලද දින සිට පසු වර්ෂ 25 ක් යන තුරු ආරක්ෂා වේ. කෘතිවල ඡායාරූප ද, කෘතියේ කතුවරයාට දී ඇති දීර්ඝකාලීන ප්‍රකාශන හිමිකම් අයිතිය හා සමාන කාලයක් ආරක්ෂා කළයුතුද යන්න සලකා බැලීම වටී. ඡායාරූපවල ප්‍රකාශන හිමිකම් අයිතිය පිළිබඳව විශේෂත්වයක් කිරීමට අවස්ථාව පැමිණ ඇති බවද පෙනේ. ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ නීති සංග්‍රහ පනතේ ඡායාරූපවල ප්‍රකාශන අයිති අනිත් රටවලට වඩා ඉදිරියෙන් සිටින බව දක්වුව මනා ය. මෙසේ ඡායාරූපවල ආරක්ෂක කාලය පමණක් අවුරුදු 25 කට අඩු කෙළේ මන්දැයි සලකා බැලීම වැදගති.

## (VI) රජයේ ප්‍රකාශන සහ ප්‍රකාශන අයිතිය

බුද්ධිමය දේපළ නීති සංග්‍රහ පනත රජයේ ප්‍රකාශනවල ප්‍රකාශන හිමිකම් අයිතිය පිළිබඳව පැහැදිලි සඳහනක් කර නොමැති බව පෙනේ. එම පනතේ වගන්තිවලින්, රජයේ ප්‍රකාශනවල ප්‍රකාශන අයිතිය ගැන පැහැදිලි කිරීමක් නොමැති බැවින්, රජයේ ප්‍රකාශනවලට සදතනික හෙවත් කාල සීමාවක් රහිතව ප්‍රකාශන හිමිකම අයත් වන බව පෙනේ. රටක රජයේ ප්‍රකාශන රාශියක් බිහිවන නිසාත්, මෙම ප්‍රකාශන කලක් යාමෙන් මහජනයාට සොයා ගැනීමට නොහැකි වන නිසාත්, ප්‍රතිරූපණය කිරීම වැදගත් වේ. මේ සඳහා ඉදිරිපත් වන අයෙකුට හෝ ආයතනයකට මේ සඳහා රජයෙන් අවසර ගත යුතු වේ. සාමාන්‍යයෙන් පුද්ගලයෙකුට හෝ ආයතනයකට රජයේ ප්‍රකාශනයක් යළි ප්‍රකාශ කිරීමට අවසර දීම සිදු නොවේ. ඊට හේතුව රජය සතු ප්‍රකාශන අයිතිය එම කෘතියෙන් ගිලිහී යන බැවිනි. රජය විසින්ම මෙම ප්‍රකාශන නැවත ප්‍රකාශයට පත් කිරීම වඩා ගුණදායක බව වැටහී ඇත. බොහෝ රටවල රජයේ ප්‍රකාශන, එම කෘතීන් ප්‍රකාශිත දින සිට වර්ෂ 50 කට ප්‍රකාශන හිමිකම් සීමාවේ. (බලන්න, 1956 බ්‍රිතාන්‍ය ප්‍රකාශන හිමිකම් පනත II ඡේදය, ඉන්දීය ප්‍රකාශන හිමිකම් පනත, 28 ඡේදය)

## (VII) අචිර තැටිගත කිරීම් හා පටිගත කිරීම්

බුද්ධිමය දේපළ නීති සංග්‍රහ පනතේ 14 වැනි වගන්තිය අනුව රූපවාහිනියේ හෝ ගුවන් විදුලි විකාශනයේ පහසුකම් උපයෝගී කරගත් අයෙකු හෝ සංවිධානයක් සකස් කරනු ලබන අචිර තැටිගත කිරීමක් හෝ පටිගත කිරීමක් වන කල්හි

එහි පිටපත් ලබාගත් දින සිට මාස හයක් ඇතුළත එම සියලුම පිටපත් විනාශ කළ යුතු වන අතර, විශේෂ ලේඛනමය ස්වභාවයක් ඇති පටිගත කිරීම් හා තැටි ගතකිරීම්වල එක් පිටපතක් රාජ්‍ය ලේඛනාගාරයේ සුරක්ෂිත කොට තැබිය යුතු බව සඳහන් වේ.

මෙයින් කරුණු 2 ක් පැන නැගේ. (1) මෙම තැටිගත කිරීම් හා පටිගත කිරීම් අචිර බව හෝ විශේෂ වැදගත් ස්වභාවයකින් යුක්ත බව අපහරණයට පෙර තීරණය කරන්නේ කවුරුන් විසින්ද? (2) විශේෂ වැදගත් කමකින් යුත් තැටිගත කිරීම් හා පටිගත කිරීම්වල එක් පිටපතක් තැන්පත් කරන්නේ එකී රූපවාහිනී හෝ ගුවන් විදුලි ආයතනයේ ලේඛනාගාරයේද? නැතිනම් ජාතික ලේඛනාගාරයේද? බුද්ධිමය දේපල පනතේ ඉංග්‍රීසි පිටපතේ සඳහන් වන්නේ "Official Archives" යනුවෙනි. ඒ අනුව මෙහි පැහැදිලි බවක් ඇති නොවේ.

සමහර විට, රජයේ කාර්යාලයක් හෝ ආයතනයක් පටිගත කිරීමේ හෝ තැටිගත කිරීමේ කටයුතු සඳහා රූපවාහිනිය හෝ ගුවන් විදුලි සංස්ථාවේ පහසුකම් යොදා ගත් විට එකී පටිගත කිරීම් හෝ තැටිගත කිරීම්වල අචිර බව හෝ චිර බව තීරණය කිරීමේ බලයත්, කුමන පටිගත කිරීම් හා තැටිගත කිරීම් ජාතික ලේඛනාගාරයේ සුරක්ෂිත කළයුතුද යන්න තීරණය කිරීමේ බලයත් ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂවරයා සතුවේ. මේ බව 1974 අංක 48 දරන ජාතික ලේඛනාරක්ෂක පනතේ 9 (1) (අ) (ආ) ඡේදවල සඳහන් වේ.

**(VIII) සාධාරණ ප්‍රයෝජනයට ගැනීම**

කර්තෘ හිමිකම් මූලධර්මය නීතිගත වී ඇති ආකාරය අනුව, යමෙකුගේ නිර්මාණයක් කිසියම් ආකාරයකින් ප්‍රතිරූපණය නොකළ යුතු බව ලෝකයා පිළිගත්තත්, මේ "සාධාරණ ප්‍රයෝජනයට ගැනීම" නමැති කඩතුරාව යටතේ ඈත අතීතයේ සිට කර්තෘ හිමිකමට පහර වැදෙන නීති රීති අණ පනත්වලට ගැබ්වී ඇත. 1911 බ්‍රිතාන්‍ය ප්‍රකාශන අයිතිය පිළිබඳ පනතේද මෙම "සාධාරණ ප්‍රයෝජනයට ගැනීමේ" වගන්තිය ඇතුළත් වී ඇත.

පිටපත් කිරීමේ නූතන ක්‍රම බිහිවීම හේතුකොට "සාධාරණ ප්‍රයෝජනයට ගැනීමේ" වගන්ති, කර්තෘ හිමිකම් මූලධර්ම හා නීති රීති විනාශ කර දමීමේ අවදානම් තත්වයකට දැන් පත්වී ඇති බැව් පෙනේ. අද සමාජය ප්‍රතිරූපණ අයිතියට පයින් ගසා ක්‍රියාකර ඇත්තේ, "සාධාරණ ප්‍රයෝජනයට ගැනීමේ" ලිහිල් ප්‍රතිපත්තිය නිසාය. පර්යේෂකයිනට, පුද්ගලික ප්‍රයෝජනයට, අධ්‍යාපනයට හා වෙනත් සාධාරණ කටයුතු සඳහා ඉඩ දී ඇති "සාධාරණ ප්‍රයෝජනයට ගැනීමේ" වගන්ති සියල්ලම කර්තෘ හිමිකම් අයිතියට යටත්වන බව සැලකීම වැදගත්ය. සාධාරණ ප්‍රයෝජනයට ගැනීමේ විධිවිධාන කෙතරම් ව්‍යාකූලදැයි කිවහොත්, ඒ පිළිබඳව දෙන ලද එක් අධිකරණ තීරණයක්, තවත් ඒ හා සමාන නඩු තීන්දුවකදී වෙනස්විය හැකිය. මෙම අස්ථිර තත්වය යටතේ සාධාරණ ප්‍රයෝජනයට ගැනීම කෙතරම් අයුතු ලෙස ප්‍රයෝජනයට ගනු ලබන්නේද යත්, බ්‍රිතාන්‍ය කර්තෘ හිමිකම් පනත සංශෝධනයට පත් කළ කමිටුවේ සභාපති වූ විනිසුරු විට්පර්ඩ් මහතා කියා සිටියේ "සාධාරණ ප්‍රයෝජනයට ගැනීමේ" වගන්ති ප්‍රකාශන හිමිකම් පනතින් ඉවත් කළ යුතු බවය.

"සාධාරණ ප්‍රයෝජනයට ගැනීමේ" ලිහිල් ප්‍රතිපත්තිය අතර අතරමංවී ඇති බැවින්, අප ඒ සඳහා සමතුලිතතා ප්‍රතිපත්තියක් ඇති කර ගතයුතු වේ. සාධාරණ පර්යේෂණ හා අන්‍ය පෞද්ගලික අධ්‍යාපන කටයුතු සඳහා ඡායාරූප පිටපත් සැලසීමට ඉඩදීම් වස්, ඇමෙරිකාවේ පිහිටුවා ඇති කර්තෘ හිමිකම් පිළිබඳ අයිතිය, ඉඩ හැරීමේ මධ්‍යස්ථානයක් (copyright clearing agency) පිහිටුවා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම වටී. මෙම මධ්‍යස්ථානය ඡායාරූප පිටපත් කරන කෘතිවල විස්තර තබා ගන්නා අතර, එහි ලියාපදිංචි වූ පිළිගත් පුස්තකාල හා අධ්‍යාපන ආයතන වලට පමණක් ඡායාරූප පිටපත් ගත කිරීමේ බලය ලබා දෙයි. මෙසේ පිටපත් කිරීමට බලය දී ඇති ආයතන, යම් කෘතියක ඡායාරූප පිටපත් කිරීමක් කළ අවස්ථාවේදී ඒ බව එම මධ්‍යස්ථානයට වාර්ෂිකව දන්වනු ඇත. මේ මගින් ඡායාරූප ගත කළ කෘතිවල විස්තර මධ්‍යස්ථානය මගින් පාලනය වේ.

**සම්පිණ්ඩනය**

මේ ලිපියෙන් සලකා බලන ලද්දේ, ශ්‍රී ලංකාවේ වත්මන් බුද්ධිමය දේපල නීති සංග්‍රහය පනත පිළිබඳ අදහස් විමසීමකි. මෙම අදහස් මගින් බුද්ධිමය දේපල සංග්‍රහ පනත සාර්ථකව ක්‍රියාගත කිරීමට අවශ්‍ය කටයුතු කෙරෙහි අවධානය යොමු වීමෙන්, මෙරටේ කර්තෘ හිමිකම් අයිතියේ මූලධර්ම තවදුරටත් ආරක්ෂාවීමටත්, සමාජයට නිර්මාණාත්මක කෘතීන්වලින් ලැබිය යුතු උපරිම ප්‍රයෝජනය ලැබීමටත්, උපයෝගී වනු ඇතැයි උදක්ම බලාපොරොත්තු වෙමි.

(ආශ්‍රිත ග්‍රන්ථ හා ලිපි පහත සඳහන් වෙයි.)

## BOOKS AND ARTICLES REFERRED

1. British Copyright Act 1911.
2. Code of Intellectual Property Act No. 52 of 1979.
3. Copyright Bill (ciara 1965, Mimeographed)

4. International Berne Convention, 1886.
5. Universal Copyright Convention 1952. (revised in 1971)
6. Indian Copyright Act No. 14 of 1957.
7. National Archives Law, No. 48 of 1973.
8. Printers & Publishers Ordinance (Chapter 179).
9. Copyright, A symposium, New Delhi (1963).
10. Copyright, Modern Law & Practice, Carter-Ruck, S. James & F. E. S. James (1965).
11. United States Copyright Code (1952).
12. Copyright Handbook, (2nd edition), Donald F. Johnston, (1982).
13. The Protection of Literary Property, Philip Wittenberg (1968).
14. Copyright and the reproduction of published materials, Carl Braband, Unesco, Vol. xl (2-3), Feb. - March 1957, P: 48-52.
15. Copyright and Information Technology, Michael S. Keplinzer, P: 3-33.
16. The Law of copyright relating to the photocopying of unpublished manuscripts, D. S. Porter, Journal of the Society of Archivists. Vol. 6 (8), Oct., 1981, P: 493-497.
17. Copyright & Science publishing, Richard Fifield, in Chemistry & Industry, 18, March 1978, P: 197-198.
18. Photocopying and copyright, R. A. Wall, Aslib Information, Vol. 11 (5), May 1983, P. 137-142.
19. Copyright implications for reprographic services in libraries, J. E. Esegobor, Unesco, Vol. xxv (1), Jan.-Feb. 1971, P: 18-26.
20. Reprography & copyright in Standards for editing & Publishing scientific, Journals, K. D. G. Wimalaratne (1984, P: 76-91.



## ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සඳහා ග්‍රන්ථ රැස්කිරීම

නුදුරු අනාගතයේ විවෘත කිරීමට බලාපොරොත්තු වන ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සඳහා ග්‍රන්ථ රැස් කිරීම ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් දැන් කර ගෙන යනු ලැබේ.

ශ්‍රී ලංකාවට අදාල වන පොත පත, වාර සඟරා හා වෙනත් ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය ජාතික පුස්තකාලයේ තැන්පත් කිරීම සඳහා පරිත්‍යාග කරන මෙන් ඉල්ලා සිටිමි.

බෞද්ධ වෙහෙර විහාර හා වෙනත් ආගමික ආරාමයන්හි අනාරක්ෂිතව ඇති පුස්කොළ පොත් ඇතුළු ඓතිහාසික ලේඛන සංරක්ෂණය කර ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ආරක්ෂා කෙරෙනු ඇත.

දැනට පුස්තකාල වලින් බැහැර කෙරෙන පොත්පත් ආදියද ජාතික නිදන් පුස්තකාලය වෙත එවිය හැකිය. මේ සියලුම පොතපත හා ලේඛනයක්ම අනාගත ජාතික අවශ්‍යතාවන් සඳහා සංරක්ෂණය කර තැන්පත් කරනු ලැබේ.

මේ පිළිබඳ වැඩිදුර විස්තර ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ/ලේකම් වරයාගෙන් ලබා ගත හැකි බව කාරුණිකව දන්වමි.

තැ. පෙ. 1764
නිදහස් මාවත,
කොළඹ 07.
දුරකථන: 598847, 95200

සභාපති,
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

# ග්‍රන්ථ විචාර

**ග්‍රන්ථනාමය: මිනිස්සු යක්කු සහ දෙවියෝ**

**කතෘ: ජයතිලක කම්මැල්ලවීර**

**මුද්‍රණ වර්ෂය: 1986**

**මුද්‍රණාලය: ඉන්දික මුද්‍රණාලය, කොළඹ.**

**ප්‍රමාණය: ක්‍රවුන් 1/8, පිටු 108**




නවකථා කලාව හා සසඳ බලන විට කෙටිකථා කලාව, ප්‍රගුණ කර ගැනීම එතරම් පහසු නොවන ප්‍රබන්ධ කථා විශේෂයකැයි ලේඛකයන් විසින් මෙන්ම විචාරකයන් විසින් ද සලකන්නට වූයේ කලක සිටය. දිග ප්‍රමාණය, යොදා ගනු ලබන බස් වහර, ඇතුලත් කෙරෙන චරිත ගණන, පුවත විකාශනය වන්නට ගතවන කාලය, සන්දර්භය වැනි කරුණු සම්බන්ධයෙන් එක්තරා ප්‍රබල සම්මතයක් ඇත්තේ කෙටිකතා කලාව සම්බන්ධයෙන් මිස නවකථා කලාව සම්බන්ධයෙන් නොවේ. කෙටිකථා ලියන්නවුන් ඉදිරියේ ඇති සීමා බන්ධන ගණන ඉතා විශාල යැයි යන අදහස කලක සිට පැතිරෙන්නට වූයේ මේ හේතුව නිසා බව අනුමාන කරන්නට පුළුවන. කෙසේ වුවද සිංහල සාහිත්‍යයට අයත් නවකථාව හා කෙටිකථාව යන අංග දෙක එකිනෙක හා සසඳ බලන විට නම් පෙනී යන්නේ ප්‍රමාණාත්මක බවින් කෙසේ වෙතත් ගුණාත්මක බවින් නම් සිංහල කෙටිකථාව නවකථාව පසු කරගෙන බොහෝ දුර ගමන් කර ඇති බවයි. පසුගියදා ජයතිලක කම්මැල්ලවීර විසින් පල කරන ලද **'මිනිස්සු යක්කු සහ දෙවියෝ'** නම් කෙටිකථා සංග්‍රහය මේ සම්බන්ධයෙන් සඳහන් කළ හැකි අලුත්ම නිදසුනයි.

මෙහි දක්නා කෙටිකථා හය තුළින් විවිධ චරිත ඇතියෝ' අප හමුවට එති. ඔවුන් වටා සංකීර්ණ බවින් යුතු පුවත් ගොඩගැසී ඇති සැටිද පෙනෙයි. මෑත යුගයේ දී මෙරට සමාජයෙහි ඇති වූ හැල හැප්පීම් මේ පුවත් වැඩි ගණනකට පසුතලය වී තිබීමද අපේ සැලකිල්ලට ලක්විය යුතු කරුණකි.

මෙම කෙටිකථා සංග්‍රහයෙහි එන පළමුවන කෙටිකථාව වන 'මිනිස්සු යක්කු සහ දෙවියෝ' යන්න ඉහත සඳහන් කරන ලද කරුණට හොඳ නිදසුනක් සේ ගත හැකිය. එයට පසුතලය වී ඇත්තේ මෑතදී මෙරට ඇතිවූ ජාතිවාදී අරගලයයි. කථාව ආරම්භ වන්නේ පාඨකයාගේ කුතුහලය ඇවිස්සෙන අන්දමේ ප්‍රශ්නයකිනි. //................නීතිඥ විජේතුංග හදිසියේ උන් හිටි තැන් අත් හැර දමා අතුරුදහන් වූයේ ඇයි?'' කථාවේ අවසාන අවස්ථාවේදී එහි කථකයා වූ ජයේට නීතිඥ විජේතුංගගෙන් ලැබෙන ලියුමකින් මේ ප්‍රශ්නයට පිළිතුරු ලැබෙයි. ජාතිභේද අරගලය පැවති දිනවල තමාගේ රැකවරණය යටතට ආ දෙමළ දෙස්තර කෙනෙකු වන සුබ්‍රමනියම්ට හා ඔහුගේ තරුණ බිරිඳ වන අයේෂාට විජේතුංග ශක්ති පමණින් ආරක්ෂාව සලසයි. තමා තුළ සිටින දෙවියා ගැන නීතිඥ විජේතුංගට ආඩම්බරයෙක් ද ඇති වෙයි. එහෙත් ඔහු තුළ සිටින යක්ෂයාගේ උනන්දුව අයේෂා වෙත යොමු වෙයි. ඔහු ඇ සිප වැළඳ ගනියි. එහෙත් මේ සිද්ධියෙන් නීතිඥ විජේතුංගට ලැබුණේ ආස්වාදයකට වඩා පසුතැවිල්ලකි. ඔහු පොලීසිය මගින් දෙමළ යුවළ යාපනයට යවා තම ගෙය වසා දමා අතුරුදහන් වන්නේ ඒ පසුතැවිල්ලේ ප්‍රතිඵලයක් වශයෙනි. මේ කාරණය පාඨකයාට දැනගන්නට ලැබෙන්නේ නීතිඥ විජේතුංග ජයේට එවන ලියුමෙනි. කෙනෙකු තුළ දෙවියාද යක්ෂයාද ලැගුම්ගෙන සිටින්නේ ඔවුනොවුන්ට කොතරම් ළඟකින්ද යන්න ප්‍රකට කිරීම මේ කථාවෙන් සිදුවන ප්‍රධාන කාර්යයයි.

"අපෙ අම්මා කිරට ගියා'' නම් කථාවටද පසුතලය වී ඇත්තේ මේ යුගයට විශේෂ වූ ප්‍රශ්නයකි. මේ කථාවේ සඳහන් වන අම්මා සවුදි අරාබියට ගොස් ආපසු ලංකාවට පැමිණ සිටින කාන්තාවකි. තමා එතෙර සිටි කාලයෙහි තම සැමියා අන් ගැහැනුන් හා සම්බන්ධකම් පවත්වන්නට ඇතැයි යන සැකයෙන් ඇ පෙළෙයි. ඒ අතර බිරිඳ අරාබියේ ගත කළ කාලයෙහි නොයෙකුත් දෙනා හා ඇ ලිංගික සම්බන්ධකම් පවත්වන්නට ඇතැයි ඇගේ සැමියා සැකයක් ඇති කර ගෙන සිටියි. මොවුන්ගේ සැකය නිසා දෙදෙනා රණ්ඩු සරුවල් ඇති කර ගනිති. ඉන් වැඩිහරියක් දුක් විඳින්නේ පාසල් යන වයසෙහි සිටින ඔවුන්ගේ පුතාය. මෙම කෙටිකතාවට වස්තු වී ඇත්තේ දුන් සුලභව දක්නා ප්‍රශ්නයක් බව සැබවි. එහෙත් කෙටිකථාවකදී වැදගත් වන්නේ කියන දෙය නොව කියන හැටියි. මව හා පියා අතර ඇතිවන අරගලය පුතාට පෙනෙන හා ඇසෙන අයුරින් දක්වා තිබීම මේ කථාවට කලාත්මක මුහුණුවරක් ලැබීමට බෙහෙවින් හේතු වී ඇති බව පෙනේ.

'රජ්ජුරුවෝ' නම් තුන්වෙනි කථාවෙන් ඉදිරිපත් කෙරෙන පුවතක් නැති තරම්ය. එය මුළුමනින්ම

පාහේ මිඩංගු කොට ඇත්තේ එක් චරිතයක් චිත්‍රනය කිරීමට බව පෙනේ. ඒ යසරත්න වනිගසේකරගේ චරිතයයි. කන්තෝරුවේදී මෙන්ම ගෙදරදීද ඔහු කාලය ගත කරන්නේ නිරන්තර කලකිරීමකින් යුතුවය. තමන්ට කාගෙන් හෝ සිදුවූ අසාධාරණයක් ගැන ඔහු නිතර සඳහන් කරයි. මේ නිසා ඔහු සෙස්සන්ගේ නිරන්තර විහිළු තහළුවලට ලක්වෙයි. මනා ලෙස සකස් කර ගන්නා ලද සැලැස්මකින් තොරවීමේ අඩුව මේ කථාවෙන් ප්‍රකට වේ යැයි සිතමි.

"වෙස් මුහුණ" නම් තරමක් දීර්ඝ වූ හතරවැනි කෙටිකථාවෙහි ප්‍රධාන චරිතය වන්නේ විසිපස් වියෙහි පසුවන නැට්වුවකු වූ සිරිමල්ය. ඔහු පාඨකයාට පළමුවෙන්ම හමුවන්නේ පෙරහැරකට එක්වී ගමන් කරමින් සිටින අතරය. පෙරහැරේදී සිරිමල් පාන අඩව් දැකීමෙන් අවන්ති නම් තරුණියක් ඔහු කෙරෙහි පැහැදෙයි. ඇ ඔහුට සිය ලිපිනය දී තම ගෙදරට එන ලෙස ආරාධනා කරයි. සිරිමල් මිතුරකු ද සමග ඇ දකින්නට යන්නේ නාගරාක්ෂ වෙස් මුහුණක් තෑග්ගක් සේ ගෙනයි. එදින අවන්තිගේ නිවසෙහි බටහිර පන්නයට නැඹුරු වූ ප්‍රිය සම්භාෂණයක් පැවැත්වෙමින් තිබුණි. බීමත් වූ මිනිසුන්ද වේග නැටුම්ද කන් රිදවන සංගීතයද සිරිමල්ගේ සිත් නොගනී. ඔහුගේ සිතට ලොකුම කලකිරීමක් ඇතිවන්නේ අවන්තිගේ පියා විසින් දෙන ලද රුපියල් දෙසීයේ තෑග්ග නිසාය. වර්ණවත් පසුතලයක් මගින් මැනවින් නිරූපනය කොට ඇති සිරිමල්ගේ චරිතයේ ඇතැම් අංග සැලකිල්ලට ගෙන වෙස් මුහුණ නව ආරක කෙටිකතාවක් සේ හැඳින්විය හැකිය.

මව්පියන් වෙනුවෙන් දූ පුතුන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් හා ඔවුන්ගේ ආර්ථික දුෂ්කරතා අතර බොහෝවිට ඇතිවන ගැටුම මුල්කොට ගෙන රචිත කෙටිකථාවක් ලෙස 'තාත්තාගේ මළ ගම' හැඳින්විය හැකිය. මෙහි සඳහන් වන සහෝදරයන් දෙදෙනා කෙරෙහි මෙන්ම පියා කෙරෙහිද පාඨක අනුකම්පාව ලැබෙන්නේ ඔවුන් තමන්ට පාලනය කරගත නොහැකි ප්‍රශ්න රාශියක් හා නිරන්තරයෙන් පොර බදමින් සිටින බැව් පෙනෙන හෙයිනි.

මෙම කෙටිකථා සංග්‍රහයෙහි එන අවසාන කථාව 'පරතරය' නම් වෙයි. විවාහක පිරිමියෙකුත් විවාහක ගැහැණියකුත් අතර බස්රියකදී ඇතිවන හදිසි හාදකම 'පරතරය' නම් කථාවේ එන ප්‍රධාන සිද්ධියයි. ගෙදර සිටින තම බිරිඳ තමන්ට දඩි සේ ප්‍රේම කරන බව පිරිමියා කියයි. ගැහැණිය තම සැමියා ගැන කියන්නේත් එය ම ය. බස් රිය පිකෙන් පික ඇතට ඇදෙන අතර ඔවුන්ගේ ඉරියව් හා කතාබහ ක්‍රමයෙන් පරිවර්තනයකට ලක්වෙයි. තවත් මොහොතකින් ඔවුහු එකිනෙකාගේ ඇඟේ හැපෙන තරමට ළංවෙති. අවසාන ජවනිකාව වන්නේ ඔවුන් දෙදෙනා බස්රියෙන් බැස වීදි ලාම්පු එළියේ පිහිටෙන් පාර දිගේ ගමන් කිරීමයි.

**මිනිස්සු යක්කු සහ දෙවියෝ** යන මෙම කෙටිකථා එකතුවෙහි දී අපට බෙහෙවින් හමුවන්නේ නොයෙක් වර්ගයේ ප්‍රශ්න වලට මැදිවූ පුද්ගලයෝය. බැලූ බැල්මට පෙනෙන්නේ මේ ප්‍රශ්න වලින් සමහරක් ඔවුන් විසින්ම ඇති කර ගන්නා ලද ඒවා සේය. ඇතැම් ප්‍රශ්න හැඳින්විය යුත්තේ ඔවුන් ජීවත් වන යුගය හා සමාජය විසින් ඇති කරන ලද ඒවා ලෙසිනි. ප්‍රශ්න කෙසේ ඇති වුවද ඒවායින් පීඩාවට ලක්වන පුද්ගලයන් වෙත පාඨක අනුකම්පාව නම් නොමඳ ලෙස ලැබෙන්නේමය. කතුවරයාගේ මධ්‍යස්ථ භාවය නිසා මෙය සිදුවන බව පෙනේ. වැරදි කරන්නන් හට වුවද කතුවරයාගේ අනුකම්පාව ලැබෙන විට ඔවුන් කෙරෙහි පාඨකයා දක්වන ආකල්පයද අනුකම්පාව හා ඇඳී පැවතීම බලාපොරොත්තු විය හැක්කකි.

මේ කෙටිකතා හය රචනා කිරීමේදී කතෘ විසින් එකිනෙකට වෙනස් වූ ශිල්ප ක්‍රම භාවිතා කොට ඇති බැව් පෙනේ. නිදසුනක් වශයෙන් මෙහි එන මුල්ම කථාවෙහි පළමුවෙන්ම කතුවරයා විසින්ම ප්‍රශ්නයක් නගා පසුව ඉදිරිපත් කෙරෙන ලියුමකින් පිළිතුරු සපයයි. දෙවන කථාවේ බොහෝ කරුණු හෙළි කරන්නේ දෙමව්පියන්ගේ අරගලයට මැදිවන පුතා විසිනි. තුන්වෙනි කථාවේ 'කථාවක්' ඇත්තේ ම නැති තරම්ය. එය වචන මගින් අඳින ලද කාටූන් චිත්‍රයක් බඳුය. ඊළඟට එන 'වෙස් මුහුණ' සැලැස්ම අතින් ඉහත සඳහන් කරන ලද කථා හතරටම වෙනස් වූ ස්වභාවයක් උසුලයි. තාත්තාගේ මළගම නම් කතාවේ ඇති අමුත්තට විශේෂයෙන් හේතුවී ඇත්තේ එහි පාඨකයාට ඇතින් සිටින අයියාගේ චරිතයයි. 'පරතරය' නම් කථාවේ සඳහන් වන බස්රිය ද චරිතයක් වැනි ය. එය ක්‍රමයෙන් ගමන් කරන විට මුල්ලක වාඩිවී සිටින විවාහක ගැහැණියට හා මිනිහාට තම ගෙදර සිටින සහකාරයන් අමතක වෙයි. කලින් එකිනෙකා අතර හැඳිනීමක් නොවූ මොවුන්ගේ 'ප්‍රේමය' අතර මගදී වර්ධනය වී එහි උච්චම අවස්ථාවට පත්වූ විට ඔවුන් බස් රියෙන් බැස ගන්නේ කථාවට විකට මුහුණුවරක් ගෙන දෙමිනි.

මහාචාර්ය
මිණිවන් පී. තිලකරත්න
සිංහල අංශය,
කැලණිය විශ්ව විද්‍යාලය

නවකතාවක දී මෙන් නොව කෙටිකථාවක දී යොදා ගනු ලබන බස පිළිබඳව ලේඛකයා විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය – යනු විචාර සම්මතයයි. ඒ අතින් කෙටිකථාව ළං වන්නේ නව කථාවට නොව කවියටයි. කවියා ගේ බස භාවිත වචන වලින් මිශ්‍ර වූවක් විය යුතු යැයි බොහෝ විට කියනු ලැබේ. කෙටිකතාවක එන බස බොහෝ විට එබඳු විය යුතුය. ඒ කරුණ මේ කතුවරයා විසින්ද සැලකිල්ලට ගෙන ඇති සැටි මේ කෙටිකතා සංග්‍රහයෙන් ප්‍රකට වෙයි. කම්මැල්ලවීරගේ බස සරල වුවද නිවැරදිය. ව්‍යාකරණය සම්බන්ධයෙන් ඇති සම්මතය ගැන ඔහු හැමවිටක ම සෝදිසියෙන් සිටින බව ද පෙනෙයි. මේ සියලු කරුණු 'මිනිස්සු යක්කු සහ දෙවියෝ' යන කෙටිකතා සංග්‍රහයේ සාර්ථකත්වයට හේතු විණැයි සිතේ.

**ග්‍රන්ථනාමය: විශ්ව සංගීත ක්ෂෙත්‍ර**

**(චීන, ඉන්දීය, ඉස්ලාමික, බටහිර සහ ගම්ලැන් සංගීත පද්ධති පහ ගැන විමර්ශනයක්)**

**කතෘ : සී. ද එස්. කුලතිලක**

**මුද්‍රණ වර්ෂය : 1987**

**මුද්‍රණාලය : මහින්ද මුද්‍රණාලය, අම්බලන්ගොඩ.**

**ප්‍රමාණය : ඩිමයි 1/8, පිටු 88**



ලෝකයේ පවතින්නේ සංගීත පද්ධති හෙවත් සංගීත ක්ෂේත්‍ර දෙකක් බවයි අප රට බොහෝ සංගීතඥයන්ගේ මතය වූයේ.

ඉන්දීය සංගීතය හා බටහිර සංගීතය උගත් අය පමණක් නොව විශ්ව විද්‍යාල මහාචාර්යවරුන් පවා ඒ මතය දරූ බව සත්‍යයකි. කුලතිලක මහතාගේ සංගීත ක්ෂෙත්‍ර ග්‍රන්ථයෙන් ඒ මතයේ ඇති සාවද්‍ය බව ඔප්පු කර ඇත.

සංගීත ක්ෂෙත්‍ර පහ විස්තර කිරීමට පෙර ශබ්ද කෝෂ, විශ්ව කෝෂ හා නවත් පිළිගත් ප්‍රකාශන මගින් ඒ එක එක සංගීත ක්ෂෙත්‍රය හඳුන්වා ඇති සැටි එළි දක්වීම ද වටනේ යැයි සිතන්නේ පිළිගත් මතවලින් කියන්න සනාථ කිරීම වඩාත් සුදුසු හෙයිනි.

ඉන්දීය සංගීතය මුලින් නො- හඳුන්වා චීන සංගීතය හඳුන්වන්න ඇත්තේ ලිඛිත ඉතිහාසයක් ඇති පැරණිම සංගීත සම්ප්‍රදායය චීන සංගීතය වන හෙයින් යැයි සිතමි.

අනෙක් රටවලින් වෙන්ව ගත හැකි, භාණ්ඩ වර්ගීකරණයකට හිමිකම් කියන, තත් භාණ්ඩයකින් නොව සුෂිර වාද්‍ය භාණ්ඩයන්ගෙන් ස්වර ස්ථාන පිහිටුවා ගත්, ලෝකයේ පළමු රාජකීය සංගීත ආයතනයක් පිහටුවා ගත්, චීන සංගීත ක්ෂෙත්‍රයට අදාල තොරතුරු මෙ පොතින් හෙළි කර ඇත.

සංගීත භාණ්ඩ තැනීමට ගත් ද්‍රව්‍ය අනුව භාණ්ඩ වර්ගීකරණයක් (මැටි, ශෛල, ලෝහ, සම්, ලී, උණබම්බු, ලබු හා සේද) චීනයේ දක්නට ඇති බව පවසා ඇත. අනෙක් සංගීත පද්ධතීන් අතර භාණ්ඩ වර්ගීකරණය ඊට වෙනස් ස්වරූපයකින් කර ඇති බව පෙනේ.

බාහිරින් පැමිණි විවිධ භාණ්ඩ තම රටේ සංගීතය පෝෂණයට යොදා ගත්තා මිස ඒවා ඉවත් කිරීමට චීනය උත්සාහ දරා නැති බව "මැද පෙරදිගින සංක්‍රමණයවූ හාප්, ලූට් වර්ගයේ තත් භාණ්ඩ චීනයේ හැඬි- නයට පත්වීම වැදගත් කොට සැලකිය යුතුයි." යන අදහසින් කියැවේ.

**චීන භාෂාවේ උච්චාරණ නාද ක්‍රමය සංගීතයට ද ගෙන ඇති බව කියයි. ඒ චීන සංගීතයේ ජාතික අනන්‍යතාවය රැක ගැනීමට රුකු- ලක් වී ඇතැයි කිය හැකිය.**

"ඉන්දීය සංගීතය කර්ණාටයේ උපත ලබා ඔවුද්හි ව්‍යාප්ත වී පන්- ජාබයෙන් අභාවයට ගියා............ ලක්නව් හා ග්වාලියර්හි මහම්මදික නොවන හින්දු සංගීතය ආදර්ශවත් සංගීතය වශයෙන් කීර්තිය ලබාගෙන තිබේ." යන්න ග්‍රොව්ස් ශබ්ද කෝෂයෙන් උපුටා ගෙන පොතට ඇතුලත් කර ඇති කොටසකි.


ආනන්ද ජයසිංහ

ප්‍රධාන අධ්‍යාපන නිලධාරී

(සංගීත)

අධ්‍යාපන අමාත්‍යාංශය


එක් පද්ධතියකින් රස විඳි ඉන්දීය ජනතාව අද පද්ධති දෙකකින් රස විඳිති. මෝගල් යුගයට පසුව පද්ධති දෙකක් හැටියට බෙදී ගිය බව කියයි. එක් පද්ධතියක තිබුණු අංගෝපාංග රැගෙන නවත් සංගීතයක සම්මිශ්‍ර- ණයෙන් වෙනත් සංගීත පද්ධතියක් ඇති වූ බව ඒ පරිච්ඡේදය කියවන විට හැඟේ.

"භාරත සාහිත්‍යයේ ඉපැරණිම ලේඛන රටාව වුව ද ක්‍රි. පූ. 3 වැනි ශතවර්ෂයට පෙර පැවති බවට සාධක තවම ලැබී නැත."

"ශිල්පීය සංගීතයට අයත් න්‍යාය ධර්ම වන ස්වර, ශ්‍රැති, ග්‍රාම, මූර්- ඡනා, මේල, වේද ග්‍රන්ථ වල සඳහන් නොවේ."

මෙවන් ලෙසින් ඉන්දීය සංගීතයට අදාල කරුණු ඉදිරිපත් කර ඇති "විශ්ව සංගීත ක්ෂෙත්‍ර" **ඉන්දියානු සංගීතය ගැන දැනගත යුතු ඓති- හාසික කරුණු ද, සාහිත්‍යයට අයත් කරුණු ද, ගීත සාහිත්‍යයට අයත් කරුණුද ඇතුලත් කර ඇති බව පෙනේ.**

"පාරසීක, අරාබි, තුර්කි, මිසර පමණක් නොව ඉපැරණි ග්‍රීක සම්- ප්‍රදායයද ඉස්ලාමික සංගීතයේ කොටස් කරුවෝ වූහ." මකාමත් සංගීතය සම්ප්‍රදායයන් කිහිපයක සම්මිශ්‍රණයෙන් සැකැසුණක් බව ඉන් කියැවේ.

මුගන්නියා නම් වහල් ස්ත්‍රීන් ගේ කාව්‍ය ගායන එදා රජවරුන් පවා අගය කළ බව කිමෙන්ද, අද මුවත් **දෙවියන් අදහන විට මුස්ලිම් දේව- ස්ථානවලින් ඇසෙන 'අසාන්'**

**ආමන්ත්‍රණ පාඨය ඉපැරණිතම ජන ගීතය ලෙසින් හඳුන්වා තිබීමෙන් ද ජන ගීත තවමත් රැකී ඇති බවටත් දියුණු සංගීතයකට ඒවා පදනම වූ බවටත් දෙස් දෙයි.**

මේල සතකින් සෑදි දියුණු පර්සියානු සංගීතය පවා ඉස්ලාමික ආධිපත්‍යයට යටත් වූවාට පසු එහි වෙනස්කම් ඇති වූ බව හේතු සහිතව ඉදිරිපත් කර ඇත. "ඉස්ලාමික සංගීතය අරාබියේ යෙමන් සහ හිජාස් වැනි ස්ථානයන්ගෙන් උපත ලැබ පර්සියානු සාහිත්‍යයෙන්ද ග්‍රීක විද්‍යාවෙන්ද ඔපවත් වී විශ්ව කලාවක් වශයෙන් ව්‍යාප්ත වූයේ 9 සහ 10 ශතවර්ෂවලදීය." යි සඳහන් කරන විශ්ව සංගීත ක්ෂෙත්‍රය ඉස්ලාමික සංගීතයේ භාවිත වූ භාණ්ඩ නාම මාලාවක්ද ඉදිරිපත් කර ඇත. ඉන් අදත් පවතින භාණ්ඩ කිහිපයක් දැක ගත හැකි බව පෙනේ.

ස්වර සංවාදය හේතුවෙන් අනෙක් කලා අංගයන්ගෙන් විශේෂයෙන් වෙන් කොට ගත හැකි සංගීතය වන්නේ බටහිර සංගීතයයි. ස්වර අතර ඇති ගණිතමය අනුපාත ක්‍රමය මුලින් පෙන්වා ඇත්තේ ග්‍රීක සංගීතඥයන් විසිනි. බටහිර සංගීතය කෙළින්ම ඒ ගණිත ක්‍රමය වැළඳ ගෙන ඇති බව පෙනේ.

"බටහිර සංගීතය ආරම්භ වූයේ දේව ගීතිකා සමග අන්වැල් බැඳ ගෙනය."

"බටහිර සංගීතයේ මූලික සිද්ධාන්ත ද ගීත ගැයීමේ ක්‍රම විග්‍රහය හා සම්බන්ධ වේ" යනුවෙන් කරුණු දක්වමින් අද පවතින ඉතා දියුණු සංධ්වනි ක්‍රම දක්වා පියවරෙන් පියවර බටහිර සංගීතය දියුණු වූ ආකාරය උදාහරණ දෙමින් පැහැදිලි කිරීමට කර්තෘ උත්සාහ දරා ඇත. ඒ සමගම බටහිර ප්‍රස්තාර කරණයේ ව්‍යාප්තිය ද ඉදිරිපත් කිරීමට ඒ මහතා අමතක කර නැත.

පස්වැනි සංගීත විධිය වශයෙන් විස්තර කොට ඇත්තේ ගැමිලාන් සංගීතයයි. **ජන සංගීත ක්‍රමයක්ව පැවතුණත්, සංගීත පද්ධතියක් ලෙසින් සලකන, අන් පද්ධතීන් ගෙන් වෙන්ව ගත හැකි, ජාවා හා සුමාත්‍රා දූපත් නිජබිම වූ සංගීත ක්‍රමයක් හැටියට ගැමිලාන් හඳුන්වාදෙයි.**

ගැමිලාන් සංගීතයේ භාවිත ස්වර මාලාව බටහිර හෝ ඉන්දීය හෝ ස්වර ස්ථාන නියමයට වෙනස් අයුරකින් පිහිටා ඇති බව දී ඇති ස්වර සාධන සටහන ඔප්පු කරයි.

ඉන්දීය හා චීන සංගීතයේ බලපෑම තිබුණත් ගැමිලාන් සංගීතයේ ඉන්දීය චීන සංගීත අංග දක්නට අපහසු බවත්, සංගීත භාණ්ඩවලට චීන ආභාෂය ලබාගෙන ඇති බවත්, තත් භාණ්ඩ අඩු, තාඩ්‍ය භාණ්ඩ වැඩි වාදනය ප්‍රමුඛ කොට උපන් සංගීත විධියක් බවත් කියයි. එක් එක් භාණ්ඩය සඳහා වැයිය යුතු භාණ්ඩ වර්ග පිළිබඳ නිශ්චිතයක් තිබීම ගැමිලාන් සංගීතයේ දක්නට ඇති වැදගත් අංගයකි. **එලෙසින්ම තාල වාදනයේදී තාල විභාග වෙන් කරන හා ඒ තාල විභාග පෙන්වන විශේෂ ක්‍රමයක් ගැමිලාන් සංගීතයේ ඇති බව උදාහරණ දෙමින් පෙන්වා ඇත.**

අවසානයේ ලංකාවේ පැවැති යුග හා සම්බන්ධ සංගීත ලක්ෂණ ගැන වැදගත් කරුණු කිහිපයක් ද පොතට ඇතුළත් කර තිබේ. කොහොඹා කංකාරිය පැවතුණායි කියන වකවානුව හා ඒ ගැන සඳහන් වන පොත් අතර ඇති වර්ෂ පරතරය කර්තෘගේ විමසුමට ලක්ව ඇත. ගී විරිත ගැන ද කුලතිලක මහතා අදහස් දක්වා තිබේ.

පොතේ ඇති මුද්‍රණ දෝෂ පොත කියැවීමට බාධාවක් යැයි සිතමි.

විශ්ව සංගීත ක්ෂෙත්‍රයෙන් ඉදිරිපත් කර ඇත්තේ කුලතිලක මහතාගේ සිතිවිලි නොවේ. ලෝකයේ තිබෙන්නේ සංගීත පද්ධති දෙකක් යැයි සිතන අයගේ ඇස් පෑදීමට මේ පොත හේතුවනු නොඅනුමානය. එලෙසින්ම ඒ සංගීත පද්ධතීන් ගැන දැනගතයුතු කරුණු කියවන්නාට දීමට ගෙන ඇති තැත අගය කළ යුතුය. සංගීත පද්ධතියක් නැති අප රටටත් පද්ධතියක් තනා ගැනීමට අඩු අංග පුරවා ගැනීමටත් මේ පොත උපකාරකයක් වේ යැයි සිතමි.

2 වැනි පිටුවෙන්

## ජාතික පුස්තකාලය හැඳින්වීමක්

දැනට කොළඹ නිදහස් චතුරශ්‍රයට ආසන්නව නිදහස් මාවතේ වැඩ නිමවෙමින් පවතින ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ලඟදීම මහජනයා සඳහා විවෘත කිරීමට නියමිතය. රුපියල් දස ලක්ෂ පනහක් වැය කොට තැනූ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල ගොඩනැගිල්ල වර්ග අඩි එක්ලක්ෂ විසිපන් දහසක ප්‍රමාණයෙන් යුක්ත වන අතර, එහි ග්‍රන්ථ වෙළුම් පන්ලක්ෂයේ සිට දස ලක්ෂයක් දක්වා ප්‍රමාණයක් තැන්පත් කරලීමට ඉඩ සැලසේ. පාඨකයින් තුන්සිය විසි දෙනෙකුට මේ තුළ පහසුකම් සැලසෙන අතර එය ජාතියේ ප්‍රධාන පර්යේෂණ පුස්තකාලය වනු ඇත.

මෙම වැඩ නිමවෙමින් පවතින පුස්තකාල ගොඩනැගිල්ල තුළ මණ්ඩලයේ අරමුණු ඉටු කරලීම සඳහා පවත්වා ගෙන යන සේවාවන් විස්තර කරලීමට, 'ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය - හැඳින්වීමක්' නමින් නව ප්‍රකාශනයක් නිකුත් කර ඇත.

නිමවෙමින් පවතින ජාතික පුස්තකාල ගොඩනැගිල්ල පසුබිම් කර ගත් කවර චිත්‍රයකින් සැරසුණු මෙම ප්‍රකාශනය සමතල (ඕෆ්සෙට්) මුද්‍රණයෙන් මුද්‍රණය කර ඇත. වර්ණ ඡායාරූප රැසක් සමග පිටු 16 ක් මෙම ප්‍රකාශනයට ඇතුළත්ව ඇත.

# Medical and Health Related Libraries in Sri Lanka

By

L. R. Amarakoon

Librarian National Institute of Health Sciences, Kalutara.

Health sciences literature is growing at a tremendous rate and library clientele such as specialists, administrators, researchers find it difficult to keep pace with all that is being produced in the health sciences field. They have access to such a large amount of literature which cannot go through it all by themselves and need assistance from the health librarians. It is for the use of such readers that the libraries exist. Libraries collect relevant material and make it available to the clientele.

## 1. General Country Information

The Democratic Socialist Republic of Sri Lanka or "Ceylon" as it was known for many centuries is a small Island of approximately 65,610 Sq. Kilometres in area including 959 Sq. Kilometres inalnd waters. It is located in the centre of the Indian Ocean approximately on Northern latitudes 5° to 9° and Eastern Longitudes 79° to 81°.

The estimated mid-year population of Sri Lanka for 1984 was approximately 15.7 million with males slightly out-numbering females 51% to 49%. This population constitutes of multi-racial and multi-religious groups.

In 1984 the per capita GNP at current cost prices was Rs. 8,643 or US $340. At the 1981 population census the literacy rate was found to be 86.5 per cent (95.5%) for males 82.4 per cent for females.

## (2) Health Sciences Libraries

Health and health related labraries in Sri Lanka are located in different organizations engaged in education, training, research and administration related to health. There are 18 such organizations in Sri Lanka. Based on the nature of functions, these organizations can be grouped into the following categories:-

### a. Medical School Libraries

1. University of Colombo.
2. University of Peradeniya.
3. University of Jaffna.
4. University of Ruhuna.
5. Post-Graduate Institute of Medicine, University of Colombo.
6. Institute of Indigenous Medicine, University of Colombo.
7. Gampaha Ayurvedic Medical College.
8. North Colombo (Private) Medical College.

### b. Government Departmental Libraries

9. Department of Labour - Division of Occupational Hygiene.
10. Ministry of Health Reference Library.
11. Nutrition Policy Planning Division of the Ministry of Plan Implementation.
12. Population Information Centre.

### c. Training Institute Libraries

13. National Institute of Health Sciences, Kalutara.
14. Health Education Bureau.
15. Nurses Training School (Colombo).

### d. Research Institute Libraries

16. Medical Research Institute.
17. Bandaranaike Memorial Ayurvedic Research Institute.

### e. Associations.

18. Sri Lanka Medical Association.

Medical and health related libraries in Sri Lanka vary in size and form of their collections as well as in the number and qualifications of their staff members and the services they offer. In addition to the libraries listed above there are many

small collections of books, which are not properly organized and therefore cannot be termed as libraries. Even among those listed above, only the ones regarded as major libraries are listed in the appendix. 1.

## University Medical Libraries

Medical education was introduced to the Island in 1870 with the establishment of the Ceylon Medical College, which amalgamated with the University College in 1942 to form the University of Ceylon. Today there are seven (07) Universities four of which have faculties of Medicine, widely separated from one another in Colombo, Galle, Peradeniya and Jaffna. A Post-Graduate Institute of Medicine (PGIM) was established in 1979. There are also two Medical Colleges dealing with Ayurvedic Medicine. A Private Medical College was also established in 1982.

## University of Peradeniya Medical Library

This library has a stock of 20,893 volumes and receives 180 titles of periodicals. Total number of registered members of the library is 1426. The total budget of the library is Rs. 4,40,000. The library is manned by a science graduate without library qualifications. Total number of staff is 06.

## University of Colombo Medical Library

The Library serves a total of 1279 registered members. It has a stock of 8,560 volumes of books and receives 125 titles of periodicals on subscription and 115 titles on gift and exchange. This library spends Rs. 150,000 on books and Rs. 3,60,905 on periodicals. At the moment a non-medical librarian is overlooking the library until such time a fulltime staff member is appointed. It has a staff strength of 10.

## University of Ruhuna Medical Library

The Library serves both students and academic staff. It has a stock of 5397 volumes of books and receives 77 titles of periodicals. It has a budget of Rs. 3,50,000 for books and Rs. 2,50,000 for periodicals. This library is manned by a professionally qualified librarian. The staff strength is 08.

## University of Jaffna Medical Library

This library has a stock of 4500 volumes of books and receives 65 titles of periodicals. It has a budget of Rs. 1,80,060 for books and Rs. 1,70,000 for periodicals. This library is also manned by a professionally qualified librarian. The staff strength is 07.

## Government Health Libraries

The National Institute of Health Sciences (NIHS) Library has good stock of books related to health sciences subject field. It's resource base is as follows: 6000 books; 35 titles of periodicals; 600 volumes of back issues of periodicals. The staff strength is 03. It caters to a membership or 850.

There are other libraries having collections ranging from 2000 volumes to 5000 volumes. Many of these libraries are without permanent staff. Some of them are manned by librarians having part professional qualifications.

## Sri Lanka Medical Library

The library of the Sri Lanka Medical Association is the oldest medical library in the island dating back to the 1840's. It has a stock of about 30,000 volumes and subscribes to 87 titles of periodicals. Library facilities are available only to the members of the Association.

## (3) Library staff training

Basic training in library science is necessary for proper functioning of a library. This training needs to be updated from time to time. In order to keep in touch with modern trends of all aspects of librarianship, library personnel are being exposed to seminars, workshops, congresses. A library study carried out in 1985 shows that most of the librarians have participated in such meetings and workshops. At the time of the study all the government libraries participated in the HeLLIS (Sri Lanka) Network were manned by qualified staff.

## (4) Library Stocks

Literature in health sciences libraries in Sri Lanka is mostly in English. Very few publications appear in indigenous languages. Most of the literature comes from Europe and United States. The major health sciences libraries have fairly good stocks of books, periodicals and audio-visual materials. Because of the static budgetary provisions, the purchase of books and periodicals has to be restricted.

There is no cooperative acquisition policy among the health sciences libraries due to various constraints such as restricted clientele and library regulations. Wasteful duplication is the result of

this. Year by year cost of publications goes up considerably. Periodical subscription rates are also increasing considerably. Thus there is less number of periodical titles in annual subscription lists of libraries. 4 (23.4%) health sciences libraries in Sri Lanka subscribe less than 25 periodicals and 6 (35.2%) libraries subscribe less than 100 titles. Only 3 (17.6%) libraries subscribe more than 100 titles.

The library authorities have recognized increasing importance of audio-visual materials in libraries. A-V sections have been established in the following libraries:-

UJ (M), NCMC, NIHS, UR (M), UC (M) and PGIM.

## (5) Library equipment

14 (82.3%) libraries do have photocopying equipment. This has facilitated resource sharing. Only 3 (17.6%) libraries do not have this facility.

## (6) Library Services

### 6. 1 Indexing

A good library is judged not only by the size of the collection but also by the quantity of services offered by them to satisfy the information needs of the clientele.

Among the 17 libraries 16 libraries (94.0%) have classified their holdings according to universally accepted schemes of classification such as D. D. C. and U. D. C. 7 (41. 1%) libraries use D. D. C., and another 7 (41. 1%) libraries use U. D. C. Two libraries use IPPF and Bernard Classification Schemes respectively. One Library seem to have not using any sort of classification scheme. 14 (82. 3%) libraries have classified catalogues and 3 (17.6%) do not maintain a catalogue.

### 6. 2 Bibliographical activities / Networking

There are no indexes of current medical literature in the Island. However, the Sri Lanka Scientific and Technical information Centre (SLSTIC) publishes a quarterly index of scientific and technical literature produced in the Island. This includes health sciences literature. One of the participating library of the HeLLIS (S. L.) Network, i.e. National Institute of Health Sciences Library has started bringing out from Dec., 1984 a quarterly News Bulletin titled "NIHS-LDS HSR News bulletin" which is intended to disseminate information related to health services research (HSR) projects in Sri Lanka. NIHS-LDS also maintains a "Union List of Current Titles of periodicals in HeLLIS (Sri Lanka) Network". This union list fulfills a long felt need of the HeLLIS (S.L.) network. This kind of publication promotes inter-library loan by indicating library holdings of participating libraries in a network. It improves periodical acquisition by spotlighting the gaps in library holdings. Furthermore it ensures optimum use of funds of those libraries by avoiding unnecessary duplication.

HeLLIS (S.L.) Network has initiated a Co-operative scheme among health sciences libraries in Sri Lanka since December 1979. At present 17 libraries participate in the network. Since the appointment of the Deputy Director General of Health (L.S.) of the Ministry of Health the first step towards the integration of the above network in the national health planning has been taken place. Now the funds for the network activities are available more easily and the status of it has also been improved. The network is now in a better position to play a major role in the health sciences information transfer, which is vital to health planning and management, health services research and primary health care.

NIHS Library, Kalutara has compiled and edited a "Directory of Health Sciences libraries in Sri Lanka" on behalf of the network in 1982, with a view to identifying and describing resource bases related to health sciences libraries and information centres in Sri Lanka. The revised edition of the directory has been published in December 1984. The same library has published "HeLLIS: Quarterly News Bulletin of the HeLLIS (S.L.) Network". So far 09 issues of this publication have been published. This news bulletin serves as a communication medium for the network.

The number of libraries which issue lists of their acquisitions is 13 (76.4%); those which prepare bibliographies, 6 (35.2%); 10 (58.8%) libraries offer literature searches. 1 (5.8%) library offers POPLINE searches.

### 6. 3 Medlars off-line searches

In Feb. 1983, an agreement was signed between the Karolinska Institute, Stockholm (Sweden) and WHO. SEARO, in New Delhi, for providing free MEDLARS/MEDLINE and SDI searches to the countries of the Region for a period of 3 years starting from 1983.

In Sri Lanka only 10 (58.8%) libraries were aware of the availability of this service.

## 6. 4 Loan Services to Readers

Library facilities are generally restricted to the membership. 11 (64.6%) provide books on loan to students. 2 (11.7%) issue books to research grantees. 15 (88.2%) give books on inter-library loan. Even before the establishment of HeLLIS (Sri Lanka) Network health sciences libraries in the Island had an informal scheme of inter-library co-operation. Two (11.7%) libraries do not send books on inter-library loans. Observations revealed that this restriction is due to either governmental regulations which require the librarian to obtain the head of the institution's approval before a book is sent out of the library or to other rules which restrict the use of the library facilities to members only. 6 (35.2%) libraries had only less than 50 registered membership, and 3 (17.6%) libraries had a membership between 50 — 100. 4 (23.5%) had a membership between 400—500.

## (7) Funds

The need for more financial provision for government libraries is urgent. University medical libraries 5 (29.4%) get more funds than government libraries. Some of the government libraries are even without regular library budgets.

## (8) Library Manpower

While University medical faculty libraries 5 (29.4%) are manned by several library personnel, government libraries are manned by one or two library personnel. 5 (29.4%) of the government libraries are manned by single person. 6 (35.2%) had 2—5 persons while 2 (11.7%) had more than 10 persons.

## (9) Experience of librarians

To run a library efficiently experienced librarians are needed. It is surprise to state here that most of the librarians in-charge of these libraries do not have sufficient number of years of experience as health sciences librarians. 4 (23.5%) were less than two years experience; while 9 (52.9%) less than 4 years experience and 2 (11.7%) had more than 10 years experience.

## (10) Salaries of Librarians

Most of the health sciences and other special librarians in Sri Lanka are not satisfied with their jobs due to the poor salary they draw. But, even a junior Asst. Librarian of a University Medical Library is paid a higher salary than a Government Departmental Librarian, even though such a librarian has higher professional qualifications plus 10—15 years of service. Nine (52. 9%) health sciences librarians draw a gross salary of less than Rs. 1500. 00 (equivalant of US $ 60 p.m.) while 6 (35.2%) librarians draw Rs. 2000 — 2500 and only 2 (11.7%) draw Rs. 2500 — Rs. 3000 p.m.

## 11. Publications of Librarians

In Sri Lanka professional activities of the librarians have very much aimed at compilation of reading lists, current awareness bulletins, News Bulletins, Accessions Lists etc. Very few medical & health related librarians have attempted to prepare bibliographies, directories. Only one health sciences librarian had undertaken a research project in health sciences library field. Research studies in the field of library science, documentation and information science have been one which has not aroused much interest in Sri Lanka.

## 12. Health Literature, Library and Information Services (HeLLIS) Sri Lanka Network Publications.

National Institute of Health Sciences, Kalutara Library had prepared most of the HeLLIS (S.L.) Network publications. Library publications put out by Sri Lanka Librarians are enumerated below:-

### Bibliographies

(a) Bibliography of medical publications relating to Sri Lanka, 1811 — 1976. Compiled by K. Pieris. — Colombo : National Science Council of Sri Lanka. 1980. 453 p.

(b) Bibliography on health in Sri Lanka, 1977-1980. Compiled by K. Pieris. — Colombo : Ceylon College of Physicians, 1983.

(c) Health Planning and Management : Classified Annotated Bibliography Compiled by L. R. Amarakoon. - Kalutara: NIHS Library, 1981.

(d) Population/family planning in Sri Lanka : A classified bibliography. Compiled by L. R. Amarakoon. — Colombo : Family Health Bureau Library. 1976.

(e) Bibliography of literature in the health services research (HSR) collection. Vol. 1 : Health Surveys. Compiled by K. Ekaratne. Colombo: Medical Faculty Library, 1985.

### Directories

(f) Directory of health science libraries in Sri Lanka. — compiled and edited by L. R. Amarakoon. — Kalutara: NIHS Library, 1984. 17p+ Appendix.

### HeLLIS/HSR Newsletter

(g) Health Services Research (HSR) News Bulletin. Vol. 1 No. 1 - Dec. 1984. Edited by L. R. Amarakoon, Kalutara, NIHS Library.

### HSR Publications

(h) Health Sciences libraries in Sri Lanka : A research study. - L. R. Amarakoon. - Kalutara: NIHS Library, 1985. 21p.

### Union Lists

(i) Union list of Current Periodical titles in HeLLIS Sri Lanka) Network libraries. - Compiled and edited by L. R. Amarakoon. Kalutara: NIHS Library, 1984. 21p.

### HeLLIS News Bulletin

(j) HeLLIS : Quarterly News Bulletin of the HeLLIS (S. L.) Network. — edited by L. R. Amarakoon - Kalutara: NIHS Library, 1984 - v. 1 No. 1 - 4; v. 2 No. 1 - 4; v. 3 (1)

### Reports

(k) Report on the training of health sciences librarians — Amarakoon, L. R.

Ministry of Health/WHO/HeLLIS (S.L.) first national training course on health sciences librarianship: Report on training of health sciences librarianship Sri Lanka. - Colombo: HeLLIS: 1986.

## 13. Problems in providing services

Most of the existing problems have already been discussed. The low status of the librarian, continues to be a major drag on the development of good information / documentation resources related to health sciences in Sri Lanka. The status of the librarian within the staff structure of the government departments is too low for the proper discharging of his/her duties. Librarian is not usually included in professional staff meetings, and therefore find it difficult to keep pace with on-going projects and future plans of the institution concerned.

Furthermore, the librarian is usually not included in the decision-making processes which affect allocations for the library. A librarian cannot become an effective manager if he is accorded little authority and no opportunity to participate in budgeting and planning. Therefore the library budgetary needs should be established by the librarian in collaboration with the administrators and regularly reviewed so as to permit increased services. Within an organisation there should be fostered the concept of the professional librarian and/or documentation officer as a colleague of the other professional staff, rather than simply as a provider of a non-professional supporting services.

The priority assigned to the library for the purposes of allocating funds for purchase of books and periodicals and for recruitment of professionally qualified staff is too low to allow for the timely development of the health sciences information system in the Island.

Continuing Education (CE) programmes is not new to medical professionals in Sri Lanka. However, until recent times such activities were mainly restricted to medical officers and para-medicals only. CE for health sciences librarians was never considered as important until the establishment of the 'Health Literature, Library and Information Services' (HeLLIS) Sri Lanka Network on 19th Dec. 1979.

The Sri Lanka Library Association (SLLA), the Sri Lanka National Library Services Board (SLNLSB), the University of Kelaniya - Department of Library Science, the Faculty of Science, University of Colombo etc., where library science courses are conducted produced only a general type of librarian. These institutions do not offer programmes for any specialized librarianship such as medical librarianship. Therefore those general librarians have to be fitted into any type of organization. These librarians did not face any difficulty in the past to manage the libraries since they were not to perform many services beyond basic duties of a librarian. But in the recent years the role of the librarian has changed. They have to provide much more information and documentation services now.

### References

(1) Amarakoon, L. R.

Health sciences libraries in Sri Lanka: A research study. — Kalutara: NIHS Library, 1985. 25p.

(2)..................WHO/Ministry of Health/HeLLIS (Sri Lanka) first national training course on health sciences librarianship 3 — 14 March 1986 : Report on the training of health sciences librarians. — Colombo: HeLLIS (S.L.) Network, 1986. 17p.

(3) ..................Directory of health sciences libraries in Sri Lanka. — 2nd ed. Kalutara: NIHS Library, 1984. 30p.

(4) Brandom, Alfred N. "Emrgence of the modern medical library (In) Handbook of medical library practice. — 3rd ed. — Chicago: MLA.., 1970: 1—15p.

(5) Buckner, Bates, "Problems, realities and needs" **(In) Overview** Vol. 3 (3) :pp 10—12.

(6) INTERNATIONAL CONGRESS ON MEDICAL LIBRARIANSHIP **(4th: 1980: Yogoslavia)** Proceedings.

**Appendix. 1**

## List of major medical and health related libraries in Sri Lanka.

(1) The Library,
Institute of Indigenous Medicine (IIM)
University of Colombo,
Bandaranaike Pura,
**Rajagiriya.**

(2) The Library,
Medical Research Institute (MRI),
Baseline Road,
**Colombo 8.**

(3) The Library,
National Institute of Health Sciences (NIHS),
P. O. Box 28,
**Kalutara.**

(4) The Library,
North Colombo Medical College (NCMC),
P. O. Box 6,
**Ragama.**

(5) The Library,
Post-Graduate Institute of Medicine (PGIM),
160, Norris Canal Road,
**Colombo 8.**

(6) Sri Lanka Medical Library (SLML),
6, Wijerama Mawatha,
**Colombo 7.**

(7) Medical Library,
Faculty of Medicine,
University of Colombo, (UC(M),
Kynsey Road,
**Colombo 8.**

(8) Medical Library,
Faculty of Medicine,
University of Jaffana, (UJ(M),
Adiyapatam Road,
Kokuvil,
**Jaffna.**

(9) Medical Library,
Faculty of Medicine,
University of Peradeniya, UP(M)
**Peradeniya.**

(10) Medical Library,
Faculty of Medicine.
University of Ruhuna, (UR(M)
Karapitiya,
**Galle.**

# COLLECTION OF BOOKS FOR THE SRI LANKA NATIONAL LIBRARY

Sri Lanka National Library Services Board (SLNLSB) has started collecting materials for deposit in the National Library of Sri Lanka which is to be opened shortly.

The Board would be grateful for any gifts, donation of books, periodicals and other documents relevant to Sri Lanka for deposit in the National Library.

Books weeded out from libraries may also be transported to the National Library for deposit in its repositories which will be made available for reference in the event of such a need arising.

Librarians please contact the Director or if you have unwanted publications.

P. O. Box 1764,
Independence Avenue,
Colombo 7.
Telephone : 598847
95200 - 2

**CHAIRMAN**
Sri Lanka National Library Services Board.

# ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය

## පූර්ව කාලීන කලාප

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ 1974 වාර්ෂික වෙළුම දැන් නිකුත් වී ඇත.

**පිටපතක මිල රු. 80. 00 කි.**

මුදල් ඇණවුම් හා චෙක්පත් ''සභාපති, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය'' නමින් එවන්න.

දුරකතන : 598847
95200

විමසීම්;-

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
නිදහස් මාවත,
කොළඹ - 07.

# අන්තර් ජාතික ප්‍රමිති

## ● අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය (ISBN) යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද? :

ISBN (අයිඑස්බීඑන්) යනු International Standard Book Number යන්නට භාවිතා වන හැකුළුම් පදයයි. ඉලක්කම් දහයකින් සමන්විතවූ මෙම අංකය සඳහා යොදාගෙන ඇත්තේ 0 – 9 දක්වාවූ අරාබි ඉලක්කම් සහ රෝම ඉලක්කමක් වන X ය. අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය, මුද්‍රිත පොත් සහ පුස්තිකා, සූක්ෂම රූපන ප්‍රකාශන, බ්‍රේල් ප්‍රකාශන, බහු මාධ්‍ය ප්‍රකාශන, අධ්‍යාපනික කට්ටල යනාදිය නියත වශයෙන් හඳුනාගැනීමට ඉවහල් වේ. ග්‍රන්ථයක ග්‍රන්ථ නාම පිටුවෙහි පිටුපස, කවරයේ පිටුපස, පොත් නාරටිය ආදී වශයෙන් කැපී පෙනෙන ස්ථාන කිහිපයක මෙම අංකය මුද්‍රණය කරනු ලැබේ.

## ● අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ක්‍රමයෙහි පසුබිම :

ග්‍රන්ථ සඳහා අංක ක්‍රම භාවිතා කිරීම ප්‍රකාශන ක්ෂෙත්‍රයට පිවිසි නව අංගයක් යයි කිව නොහැක. ප්‍රකාශයට පත්වූ ග්‍රන්ථ සඳහා අංක ක්‍රම භාවිතා කිරීම ප්‍රකාශකයින් විසින් අරඹන ලද්දේ මීට වසර සියයකටත් වැඩි කාලයක සිටය. සිය ප්‍රකාශන ආයතනයන්හි ප්‍රකාශන සහ වෙළෙඳ කටයුතු කිරීමෙහි පහසුව පිණිස, ප්‍රකාශයට පත්වූ පොත පත හඳුනා ගැනීම සඳහා තම තමන්ට ආවේනිකවූ අංක යෙදීමේ ක්‍රම ප්‍රකාශකයන් විසින් භාවිතා කළ අතර, එම ක්‍රම ආයතනික කටයුතුවලට පමණක් සීමා විණි. එමෙන්ම එකී ක්‍රම කිසියම් ප්‍රමිතියකට අනුව සකස් වූ ඒවා නොවීය.

පොත් සඳහා ජාත්‍යන්තර අංක ක්‍රමයක අවශ්‍යතාව පිළිබඳ ප්‍රශ්නය ප්‍රථමයෙන් ම සාකච්ඡා කරන ලද්දේ 1966 නොවැම්බර් මස නැගෙනහිර ජර්මනියේ බර්ලින් නුවර (ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව) පැවති පොත් වෙළෙඳම පිළිබඳ තෙවැනි ජාත්‍යන්තර සම්මේලනයේදීය. මෙම වකවානුවේදී යුරෝපයේ සිටි පොත් ප්‍රකාශකවරුන් සහ පොත් බෙදාහරින්නන් විසින් පොත් ඇණවුම් කිරීම සහ තොග පාලන කටයුතු සඳහා පරිගණක යන්ත්‍ර භාවිතය ගැන සිය සැලකිල්ල යොමු කොට තිබිණි. පරිගණක යන්ත්‍ර භාවිතයේදී ප්‍රකාශයට පත්වූ පොත පත හඳුනා ගැනීමට ඉතා ම යෝග්‍යවූ ද, එමෙන් ම අවශ්‍යවූ ද ලක්ෂණයක් ලෙස අංක ක්‍රමයක් භාවිතා කිරීමේ අවශ්‍යතාව ඔවුනට ඒත්තු ගොස් තිබුණි.

පොත් පිළිබඳ කටයුතු සඳහා පරිගණක යන්ත්‍රය භාවිතා කරන, එමෙන් ම පරිගණක යන්ත්‍රය භාවිතා කිරීමට බලාපොරොත්තු වන ප්‍රකාශකයින්, පොත් වෙළෙඳුන්, පුස්තකාලයාධිපතීන්, තොග වෙළෙඳුන්, අධ්‍යාපන බලධාරීන් සහ අනෙකුත් අයගේ අවශ්‍යතා පිළිබඳ පරීක්ෂාකිරීමෙන් අනතුරුව, අංක ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස බ්‍රිතාන්‍යයේ ප්‍රකාශකයන්ගේ සංගමය විසින් කරන ලද ඉල්ලීමක ප්‍රතිඵලයක් වශයෙන් ලන්ඩනයේ සුප්‍රකට ප්‍රකාශන ආයතනයක් වන සීමාසහිත විටේකර් සහ පුත්‍රයන් විසින් (J. Whitaker & Sons) 1967 දී ග්‍රන්ථ අංක ක්‍රමයක් එක්සත් රාජධානියට හඳුන්වා දෙන ලදී.

## ★ පසුබිම හා ආරම්භය

## ★ ගොඩනැගුණු අයුරු

## ★ අංක ලබාදෙන හැටි

මේ ක්‍රමය හඳුන්වනු ලැබුවේ 'ප්‍රමිති ග්‍රන්ථ අංක ක්‍රමය' යනුවෙනි. (Standard Book Numbering Scheme–SBN) 1968 දී ආර්. ආර්. බවුකර් ප්‍රකාශන සමාගම විසින් (R. R. Bowker Company) ප්‍රමිති ග්‍රන්ථ අංක ක්‍රමය අමෙරිකා එක්සත් ජනපදයට හඳුන්වා දෙනු ලැබීය. අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ක්‍රමය නමින් අද හඳුන්වන මෙම ක්‍රමය (International Standard Book Numbering – ISBN) එවකටවූ අවශ්‍යතාව සපුරාලීමට සමත් විය. මේ ක්‍රමය එක්සත් රාජධානියේ සහ අමෙරිකා එක්සත් ජනපදයේ භාවිතා වූ 'ප්‍රමිති ග්‍රන්ථ අංක ක්‍රමය' තුළින් වර්ධනය වූවකි.

බොහෝ ප්‍රකාශකයන් පොත් වෙළෙඳම හා අදාල කාර්යයන් සඳහා පරිගණකය භාවිතා කිරීමට පටන්ගැනීමේ හේතුවෙන් එවකට පැවති අංක ක්‍රම සඳහා ප්‍රමිතිකරණයක් ඇතිකිරීමේ අවශ්‍යතාව ඉස්මතු විය. ලන්ඩන්හි විසූ ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය එෆ්. ජී. ෆ්‍රොස්ටර් මහතා 'පොත් වෙළෙඳම සඳහා ප්‍රමිති අංක ක්‍රමයක් හඳුන්වා දීමේ අවශ්‍යතාව ඉතා පැහැදිලි දෙයක් බවත්, එයින් සියලු දෙනාට ම විපුල ප්‍රයෝජන ලැබෙන බවත්' සඳහන් කරමින් බ්‍රිතාන්‍යයේ ප්‍රකාශකයන්ගේ සංගමය වෙත වාර්තාවක් ([1]) ඉදිරිපත් කරන ලදී. මේ වන විට එක්සත් රාජධානියේ ග්‍රන්ථ අංක කිරීමේ ක්‍රමය භාවිතා වුණ ද, ප්‍රමිති ග්‍රන්ථ අංක භාවිතය පිළිබඳව විස්තරාත්මක සැලැස්මක් ඉදිරිපත් කර නොතිබිණි. ෆ්‍රොස්ටර් මහතාගේ යෝජනාව අනුව වැඩි දුරටත් අධ්‍යයනය කිරීමෙන් පසු ප්‍රමිති ග්‍රන්ථ අංක ක්‍රමයක් සඳහා සවිස්තර සැලැස්මක් ඉදිරිපත් කරන ලදී.

---

1 ISBN Users Manual. (Berlin : International Standard Book Numbering Agency, 1986,) P. 2.

# ග්‍රන්ථ අංක ක්‍රමය

**ජානකී ප්‍රනාන්දු**
**පුස්තකාලයාධිපතිනි,**
**ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.**

එක්සත් රාජධානියේ භාවිතාවූ ග්‍රන්ථ අංක ක්‍රමය ජාත්‍යන්තර ක්‍රමයකට යොදා ගැනීමට ඇති හැකියාව පිළිබඳව පරීක්ෂා කර බැලීම සඳහා මේ කාලය තුළදීම ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානයේ (International Standard Organisation) ප්‍රලේඛන විද්‍යා අංශය විසින් ක්‍රියාකාරී තාක්ෂණික කමිටුවක් පිහිටුවන ලදී. එය හඳුන්වනු ලැබුවේ ISO/TC 46 නමිනි. මෙහි ලේකම් කාර්යාලය ලෙස කටයුතු කෙළේ බ්‍රිතාන්‍ය ප්‍රමිති ආයතනයයි. (British Standard Institution)

ඩෙන්මාර්කය, ප්‍රංශය, ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුව, අයර්ලන්තය, නෙදර්ලන්තය, නෝර්වේ, එක්සත් රාජධානිය, අමෙරිකා එක්සත් ජනපදය, යන ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානයට අයත් රටවල නියෝජිතයන් සහ යුනෙස්කෝවේ නිරීක්ෂකයකුගෙන්ද සැදුම්ලත් පිරිසක් 1968 දී ලන්ඩන්හි රැස්වීමක් පැවැත්වූහ. අනෙකුත් රටවල් විසින් ජාත්‍යන්තර ප්‍රමිති ග්‍රන්ථ අංක ක්‍රමය පිළිබඳව සිය ලැදියාවන් සහ යෝජනා ලිඛිතව ඉදිරිපත් කරන ලදී. මෙම රැස්වීමේ වාර්තාවක් ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානයට අයත් සියලුම රටවල් වෙත බෙදා හරිනු ලැබීය. මෙම වාර්තාව සම්බන්ධයෙන් ඉදිරිපත්වූ සියලු ම යෝජනා 1969 දී බර්ලින් සහ ස්ටොක්හෝම් යන නගරවල පැවැති රැස්වීම්වලදී සැලකිල්ලට භාජනය විය.

එක්සත් රාජධානියේ සහ අමෙරිකා එක්සත් ජනපදයේ භාවිතා වුණු ප්‍රමිති ග්‍රන්ථ අංක ක්‍රමය (SBN) ජාත්‍යන්තර ස්වරූපයකට වර්ධනය කිරීමට ජාත්‍යන්තර ප්‍රමිති ආයතනය විසින් 1969 දී කටයුතු අරඹන ලදී. පවත්වනු ලැබූ රැස්වීම්වල ප්‍රතිඵලයක් වශයෙන් ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානයේ අංක 2108 දරන නිර්දේශය අනුව අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ක්‍රමය සඳහා මූලධර්ම සහ ක්‍රියාපටිපාටිය සකස් කැරිණි. (2)

ජාත්‍යන්තර ප්‍රමිති සංවිධාන නිර්දේශයේ අරමුණ වූයේ ග්‍රන්ථ සඳහා අංක භාවිතා කිරීම ජාත්‍යන්තර වශයෙන් සම්බන්ධීකරණය කිරීමත් ඒ සඳහා ප්‍රමිතිකරණයක් ඇති කිරීමත් ය. මේ අනුව අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය (ISBN) මගින් කිසියම් ප්‍රකාශකයෙකු විසින් ප්‍රකාශයට පත් කරනු ලැබූ ග්‍රන්ථයක් හෝ එකී ග්‍රන්ථයේ සංස්කරණයක් හඳුනා ගැනීමට හැකිවන අතර, එකී අංකය යෙදිය හැක්කේ එම ග්‍රන්ථයට හෝ එහි සංස්කරණයට පමණි.

2 ISO RECOMMENDATION No. 2108 Documentation - International Standard Book Numbering (ISBN). ISO Standards Handbook 1, 2nd ed. (Paris: Unesco, 1982) pp. 105-106.

අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය උපත ලැබුවේ මේ අයුරිනි. මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අන්තර් ජාතික ආයතනයක් පිහිටුවීමේ අවශ්‍යතාව පැන නැගිණි. එම ආයතනය සතු බලතල, වගකීම් සහ එහි කාර්යයන් මොනවාද යන්න 1969 දී බර්ලින් නුවර පැවති රැස්වීමේදී තීරණය කරනු ලැබීය. මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ජාත්‍යන්තර ආයතනය වශයෙන් කටයුතු කිරීමට බර්ලින්හි පිහිටි (Staatsbibliothek Preussischer Kulturbesitz) නමින් හැඳින්වෙන ජර්මන් රාජ්‍ය පුස්තකාලයට ඉඩකඩ සහ කාර්ය මණ්ඩලය ලබාදීමටත්, ගෙවීම් කටයුතු කිරීමටත් හැකියාවක් ඇති බව 1972 ලිස්බන් නුවර පැවති ISO/TC 46 නමින් හඳුන්වනු ලැබූ ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානයේ තාක්ෂණික කමිටුවේ 13 වෙනි රැස්වීමේදී එහි ලේකම් කාර්යාලය විසින් ප්‍රකාශයට පත් කරන ලදී. මේ අනුව 1972 ජූලි මාසයේදී අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ අන්තර් ජාතික ආයතනය බර්ලින්හි පිහිටි ජර්මන් රාජ්‍ය පුස්තකාලයෙහි පිහිටුවන ලදී. මෙම ආයතනය අංක ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ මූලස්ථානය ලෙස කටයුතු කරයි.

## ● අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය ගොඩ නැගී ඇති අයුරු :

අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකයක් හැම විට ම ඉලක්කම් දහයකින් යුක්ත වේ. අංකය ඉදිරියෙන් ම ISBN අකුරු හතර දක්වේ. ඉලක්කම් දහයකින් යුත් අංකය කොටස් හතරකට බෙදා ඇත. අංකය මුද්‍රණය කිරීමේදී කොටස් හතර පැහැදිලිව හඳුනා ගැනීම සඳහා සෑම කොටසක්ම කෙටි හරස් ඉරකින් හෝ හිස් ඉඩකින් වෙන් කරනු ලැබ ඇත. කෙටි හරස් ඉරක් වෙනුවට හිස් ඉඩක් තැබිය හැකි වුව ද, කෙටි හරස් ඉරක් යෙදීම වඩා ප්‍රායෝගික වේ.

නිදසුන් : ISBN 955-20-0026-2
ISBN 955-557-006-X

අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකයේ කොටස් හතර පහත දක්වේ :

1. කලාපීය හැඳුනුම් අංකය (Group Identifier)
2. ප්‍රකාශක හැඳුනුම් අංකය (Publisher Identifier)
3. ග්‍රන්ථ නාම හැඳුනුම් අංකය (Title Identifier)
4. පරීක්ෂක අංකය (Check Digit)

ISBN 955 — 584 — 002 — 4

| කලාපීය හැඳුනුම් අංකය | ප්‍රකාශක හැඳුනුම් අංකය | ග්‍රන්ථ නාම හැඳුනුම් අංකය | පරීක්ෂක අංකය |
|---|---|---|---|

**කලාපීය අංකය :**

කිසියම් ග්‍රන්ථයක් ප්‍රකාශයට පත්වූ රට කුමක් ද යන්න හැඳින්වීම කලාපීය අංකය මඟින් සිදුවේ. මෙම අංකය තීරණය කිරීමේදී ජාතික, භාෂාමය, භූගෝලීය හෝ වෙනත් කරුණු මත අංකය තීරණය කරනු ලැබේ. එක් එක් රටෙහි ප්‍රකාශයට පත්කරනු ලබන ග්‍රන්ථ සංඛ්‍යාව අනුව, ඒ ඒ රට සඳහා දෙනු ලබන අංකයෙහි ඉලක්කම් සංඛ්‍යාව වෙනස් වේ. රට හැඳින්වීමේ අංකය ලබා දෙනුයේ ජර්මනියේ පිහිටි අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ආයතනය විසිනි.

කලාපීය අංක සඳහා නිදසුන් :

0 එක්සත් රාජධානිය, අමෙරිකා එක්සත් ජනපදය, කැනඩාව, ඕස්ට්‍රේලියාව, සිම්බාබ්වේ
3 ජර්මනිය
81 ඉන්දියාව
951 පින්ලන්තය
955 ශ්‍රී ලංකාව
974 තායිලන්තය
9971 සිංගප්පූරුව
9980 පැපුවා නිව් ගිනි

**ප්‍රකාශක හැඳුනුම් අංකය :**

කිසියම් ග්‍රන්ථයක ප්‍රකාශකයා කවරෙක් ද යන්න හඳුනාගත හැකි වන්නේ ප්‍රකාශක හැඳුනුම් අංකය මගිනි. ප්‍රකාශයට පත් කරනු ලබන ග්‍රන්ථ සංඛ්‍යාව අනුව ප්‍රකාශක හැඳුනුම් අංකය දීර්ඝ වීම හෝ කෙටි වීම සිදුවේ. ඉතා විශාල ග්‍රන්ථ සංඛ්‍යාවක් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශකයෙකුට කෙටි ප්‍රකාශක හැඳුනුම් අංකයක්ද, අඩු ග්‍රන්ථ සංඛ්‍යාවක් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශකයෙකුට දීඝී ප්‍රකාශක හැඳුනුම් අංකයක් ද නියම කරනු ලැබේ. නිදසුනක් මගින් මෙය පැහැදිලි කිරීමට පුළුවන.

**ග්‍රන්ථ නාම හැඳුනුම් අංකය :**

කිසියම් ප්‍රකාශකයෙකු විසින් ප්‍රකාශයට පත් කරනු ලැබූ ග්‍රන්ථ අතුරින් කිසියම් ග්‍රන්ථයක් හෝ එකී ග්‍රන්ථයෙහි සංස්කරණයක් හඳුනා ගැනීමට මෙම කොටසින් හැකිවේ. ග්‍රන්ථ නාම හැඳුනුම් අංකයෙහි ඉලක්කම් සංඛ්‍යාව තීරණය වනුයේ කලාපීය අංකයෙහි සහ ප්‍රකාශක හැඳුනුම් අංකයෙහි ඉලක්කම් සංඛ්‍යාව අනුවය.

**පරීක්ෂක අංකය :**

'පරීක්ෂක අංකය' අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකයක දහවෙනි මෙන්ම අවසාන ඉලක්කම වන අතර, එම ඉලක්කම නිර්ණය කරනු ලබන්නේ ඉතිරි ඉලක්කම් නවය පිළිබඳව කෙරෙන සංකීර්ණ ගණනය කිරීමකින් පසුවය. කිසියම් ග්‍රන්ථයක් සඳහා දෙන ලද අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකයේ නිරවද්‍යතාවය පරීක්ෂා කරනු ලබන්නේ මෙම පරීක්ෂක අංකය මගිනි. පරීක්ෂක අංකය සෑම විටම තනි ඉලක්කමකි. පරීක්ෂක අංකය 10 වන අවස්ථාවන්හිදී ඒ වෙනුවට රෝම ඉලක්කමක් වන X භාවිතා කරනු ලැබේ.

**● ප්‍රකාශක කවරෙක්ද ? :**

අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ කාර්යයෙහිදී පොතක් නිකුත් කරනු ලබන සහ ප්‍රකාශයට පත් කරනු ලබන ඕනෑම පුද්ගලයෙක්, සමාගමක්, සංගමයක්, කණ්ඩායමක්, හෝ ආයතනයක් ප්‍රකාශක යනුවෙන් හැඳින්වේ. මෙහිදී පොතක් ප්‍රකාශයට පත් කිරීම යනු පොතක් මුද්‍රණය කිරීම නොවේ. මුද්‍රණකරු ප්‍රකාශකයා ද වන අවස්ථාවලදී හැරුණු විට, අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ලබා දෙනුයේ ප්‍රකාශකයාට පමණී. ප්‍රකාශක යනු ග්‍රන්ථය සඳහා මුදල් ආයෝජනය කරනු ලබන පුද්ගලයා හෝ ආයතනයයි.

| ප්‍රකාශකයා | අවුරුදු 20 ක් තුළදී ප්‍රකාශයට පත් කෙරෙතැයි බලාපොරොත්තු වන ග්‍රන්ථ සංඛ්‍යාව | ප්‍රකාශන හැඳුනුම් අංකය |
|---|---|---|
| ඇම්. ඩී. ගුණසේන සහ සමාගම | 10,000 | 21 |
| බෞද්ධ ප්‍රකාශන සමිතිය | 10,000 | 24 |
| පියවි පොත් ප්‍රකාශකයෝ | 1,000 | 557 |
| ශ්‍රී ලංකා පදනම් ආයතනය | 1,000 | 592 |
| ප්‍රිමියර් ප්‍රකාශකයෝ | 100 | 9002 |
| ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය | 100 | 9011 |
| ධර්මප්‍රිය වෙසුම්පෙරුම | 10 | 95123 |
| සමිත රත්ගම | 10 | 95135 |

## ● අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය ලබාදිය හැකි සහ ලබා දිය නොහැකි ප්‍රකාශන :

අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය මුලින්ම භාවිතා කරන ලද්දේ පොත් සඳහාය. මේ හෙයින් මූලික වශයෙන් මුද්‍රිත පොත් සඳහා මෙම අංකය යෙදුණ ද ප්‍රකාශකයකු විසින් නිකුත් කරනු ලබන එසේ නැතහොත් පුස්තකාලවලට අත්පත් කරගන්නා විවිධ මාධ්‍යයේ ප්‍රකාශන සඳහා ද මේ අංකය භාවිතා කෙරේ. අංක ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී 'පොත්' යන වචනය යොදාගෙන ඇත්තේද, පුළුල් අර්ථයෙනි. ජර්මනියේ පිහිටි අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ආයතනය විසින් මෙම අංකය ලබා දිය හැකි ප්‍රකාශන සහ ලබා දිය නොහැකි ප්‍රකාශන මොනවාද යන්න පැහැදිලිව දක්වා ඇත.

● ප්‍රථම වරට ප්‍රකාශයට පත් කරනු ලබන සෑම ග්‍රන්ථයක් සඳහාම අංකයක් ලබා ගත යුතු වේ.

නිදසුන් : වාරුලතා - ISBN 955-9001-00-0
මකරන්දය- ISBN 955-594-003-7

● ප්‍රකාශයට පත් කරනු ලැබූ ග්‍රන්ථයක සෑම සංස්කරණයක් සඳහාම අංකයක් ලබාගත යුතුවේ. මෙහිදී මුල් ග්‍රන්ථයට වඩා පෙළෙහි වෙනසක්, සැකැස්මෙහි වෙනසක්, බැම්මෙහි වෙනසක්, කඩදාසියෙහි වෙනසක් හෝ මුද්‍රණයේ වෙනසක් තිබිය යුතුය. පෙළෙහි වෙනසක් නොමැති නැවත මුද්‍රණයක් නම් ඒ සඳහා අංකයක් ලබා නොගත යුතුය. එබඳු නැවත මුද්‍රණ සඳහා මුල්

---

අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකයක් ලබාදිය හැකි ප්‍රකාශන ලෙස පහත සඳහන් දෑ දැක්විය හැක.

- මුද්‍රිත පොත් සහ පුස්තිකා (Printed Books and Pamphlets)
- සූක්ෂම රූපන ප්‍රකාශන (Micro – form Publications)
- බ්‍රේල් ප්‍රකාශන (Braille Publications)
- බහු මාධ්‍ය ප්‍රකාශන (Mixed Media Publications)
- අධ්‍යාපන චිත්‍රපට/වීඩියෝ සහ පාර දෘශ්‍ය ප්‍රකාශන (Educational Films/Video and Transparencies)
- විද්‍යුත මාධ්‍ය ප්‍රකාශන (Electronic Publications)
  - මුද්‍රිත පිටපත් ලබාගත හැකි පරිදි සකස් කරන ලද යන්ත්‍රයක් මගින් කියවිය හැකි පටි (Machine readable tapes designed to produce readable print outs)
- පරිගණක මෘදු භාණ්ඩ (Micro computer Software)
- බයිබල් සහ යාඥා පොත් (Bibles and Prayer Books)
- වාර ප්‍රකාශන ගනයට ඇතුලත්වන වාර්ෂික ග්‍රන්ථ, වාර්ෂික සංග්‍රහ, ග්‍රන්ථ මාලා සහ නාමාවලී සඳහා අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ලබා දීමට පුළුවන. (Year Books, Annuals, Monagraphic Series, Directories)

---

අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකයක් ලබා දිය නොහැකි ප්‍රකාශන ලෙස පහත සඳහන් දෑ දැක්වීමට පුළුවන :

- දිනපොත්, දින දර්ශන, වෙළඳ දැන්වීම් වැනි තාවකාලික භාවිතය සඳහා වන මුද්‍රිත ද්‍රව්‍ය
- ග්‍රන්ථ නාම පිටුවක් සහ පෙළක් නො මැති මුද්‍රිත චිත්‍ර සහ නමා සකස් කරන ලද චිත්‍ර පත්‍රිකා
- ශබ්ද තැටි සහ පටි
- වාර ප්‍රකාශන ගණයට ගැනෙන ප්‍රකාශන

● අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකයක් ලබාගැනීමට ඉල්ලුම් කළ යුතු අවස්ථා :

කිසියම් ප්‍රකාශකයකු තමන් විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ග්‍රන්ථ සඳහා අංක ලබා ගැනීමට ඉල්ලුම් කළ යුතු විවිධ අවස්ථා ඇත. එම අවස්ථා මොනවාද යන්න පහත දැක්වේ :

ග්‍රන්ථයට ලබාගත් අංකයම භාවිතා කළ යුතුවේ.

නිද : භෞතික රසායනය II කාණ්ඩය, තෙවන සංශෝධිත සංස්කරණය– එම්. සෙල්වරත්නම් ISBN 955-552-008-9

● කිසියම් ප්‍රකාශකයෙකු විසින් එකම ග්‍රන්ථයක් විවිධ ආකාරයේ බැමි වලින් යුතුව ප්‍රකාශයට පත් කරනු ලබන විට (තද බැම්ම, කඩදාසි කවර බැම්ම ආදී වශයෙන්) එක් එක් ආකාරයේ බැම්ම සහිත ග්‍රන්ථය සඳහා වෙන් වෙන් වශයෙන් අංක ලබා ගත යුතුවේ.

නිද: The Kandyan Kingdom 2nd revised edition (Soft Cover) ISBN 955-555-018-6
The Kandyan Kingdom 2nd revised edition (Hard Cover) ISBN 955-555-019-4

● කිසියම් ග්‍රන්ථයක් භාෂාවන් කිහිපයකට පරිවර්තනය කොට ප්‍රකාශයට පත් කරන විටදී ඒ ඒ භාෂා අනුව වෙන් වෙන් වශයෙන් ග්‍රන්ථ සඳහා අංක ලබා ගත යුතුවේ.

නිදසුන්:

| | |
|---|---|
| Road Map For Your Life | ISBN 955-587-000-4 |
| ඔබේ ජීවිතයට මග පෙන්වීමක් | ISBN 955-587-001-2 |
| உமது வாழ்விற்குப் பாதைகாட்டி | ISBN 955-587-002-0 |

● වෙළුම් කිහිපයකින් සමන්විත ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කරන විට, එක් එක් වෙළුමට අංකය බැගින් ලබාගත යුතු අතර, මුළු කට්ටලය සඳහා ද වෙනම අංකයක් ලබා ගත යුතුවේ.

නිදසුන් :

ISBN 0-670-01039-1 (පළවෙනි වෙළුම)
ISBN 0-670-01045-6 (වෙළුම් හයකින් යුත් කට්ටලය)

● කිසියම් ග්‍රන්ථයක අනුජායා මුද්‍රණයක් (Facsimile Reprint) මුල් ග්‍රන්ථයේ ප්‍රකාශක නොවන ප්‍රකාශකයෙකු විසින් නිකුත් කළ විට ඊට අළුත් අංකයක් ලබා ගත යුතුවේ.

● පාඨ ග්‍රන්ථ වලට අදාලව ප්‍රකාශයට පත් කරනු ලබන කෘතීන් සඳහා අංක ලබා ගත යුතු වේ.

නිදසුන් :

The Teachers Manual Work Book
Test Manual

● නොබැඳි පිටු වශයෙන් ප්‍රකාශණට පත්වන ප්‍රකාශන (Loose-Leaf Publications) හඳුනා ගැනීම සඳහා සෑම විටම අංකයක් දෙනු ලැබේ. එහෙත් ඊට එකතු කරන අමතර කොටස් හෝ තිබෙන පිටු වෙනුවට වෙනත් පිටු ඇතුලත් කරන අවස්ථාවලදී අලුතින් අංකයක් ලබා ගත යුතුවේ.

● ප්‍රකාශකයෙකු විසින් කලින් ප්‍රකාශයට පත් කරන ලද එහෙත් අංක ලබා නොගත් ප්‍රකාශනවල ලබා ගත හැකි පිටපත් සංඛ්‍යාවක් ඇත්නම්, එවැනි ග්‍රන්ථ නාම සඳහා අංක ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. එසේ ලබා ගත් අංක ප්‍රකාශක නාමාවලී, වෙළඳ නාමාවලී, වෙළඳ දැන්වීම් ආදියට ඇතුලත් කිරීමට කටයුතු සැලසිය යුතුය.

එමෙන්ම ප්‍රකාශක විසින් එකී ග්‍රන්ථ වල නැවත මුද්‍රණ (reprints) ප්‍රකාශයට පත්කරන විට ලබා ගත් අංක නැවත මුද්‍රණයේදී ග්‍රන්ථවල මුද්‍රණය කළ යුතු වේ.

## ● අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකයක් ලබාගැනීමේදී ප්‍රකාශකයෙකු විසින් ඉල්ලුම් කළ යුතු ආකාරය :

මේ අංක ක්‍රමය ක්‍රියාත්මක කරන ලෝකයේ රටවල් 75 ක් පමණ දැනට ඇති අතර, මේ සෑම රටකම අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ ජාතික ආයතන ඇත. මේ රටවල බොහෝ අවස්ථාවලදී ජාතික ආයතනය වශයෙන් කටයුතු කරනුයේ ජාතික පුස්තකාලය, ජාතික ලේඛනාගාරය හෝ පොත් පත් ලියා පදිංචිකිරීමේ කාර්යාලයයි. ජාතික ආයතන නම් කිරීම කරනුයේ මව් ආයතනය ලෙස කටයුතු කරන ජර්මනියේ බර්ලින් නුවර පිහිටි අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ආයතනයයි. නිදසුන් : ශ්‍රී ලංකාවේ ජාතික ආයතනය - ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, කැනඩාව - කැනඩා ජාතික පුස්තකාලය, නයිජීරියාව - නයිජීරියානු ජාතික පුස්තකාලය, සිම්බාබ්වේ - ජාතික ලේඛනාගාරය, හොංකොං - පොත් පත් ලියාපදිංචි කිරීමේ කාර්යාලය.

ප්‍රකාශකයින් විසින් තමන්ගේ ග්‍රන්ථ සඳහා අංක ලබා ගැනීමේදී තම රටේ ඇති ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ආයතනය වෙත ඉල්ලුම් කළ යුතුය. ප්‍රථමයෙන් ම ප්‍රකාශක හැඳුනුම් අංකයක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. ප්‍රකාශකයා විසින් සපයනු ලබන සිය ග්‍රන්ථ නිෂ්පාදන තොරතුරු අනුව ඔහුට හිමි ප්‍රකාශක හැඳුනුම් අංකය ලැබේ. ප්‍රකාශකයෙකුට ලැබෙන ප්‍රකාශක හැඳුනුම් අංකයේ ස්වභාවය අනුව ග්‍රන්ථ සඳහා භාවිතා කළ හැකි අංක සංඛ්‍යාව තීරණය වේ. ග්‍රන්ථ සඳහා අංක ලබා ගැනීම කළ යුත්තේ ග්‍රන්ථයක් මුද්‍රණයට යැවීමට පෙර ය. මේ හෙයින් ප්‍රකාශයට පත්කිරීමට සැලසුම් කරන අවස්ථාවේදී ම ග්‍රන්ථ සඳහා කල්තබා අංක ලබා ගැනීමට කටයුතු කිරීම මැනවි. ග්‍රන්ථ සඳහා අංක ලබා ගැනීමට ඉල්ලුම් කිරීමේදී පහත සඳහන් විස්තර දක්වමින් තම ඉල්ලීම ඉදිරිපත් කළ යුතුය. -

කර්තෘ :
ග්‍රන්ථ නාමය :
සංස්කරණය : (1 වෙනි, 2 වෙනි ආදී වශයෙන්)
ප්‍රකාශයට පත් කරනු ලබන වර්ෂය :
මුද්‍රණය කරනු ලබන පිටපත් සංඛ්‍යාව :
මිල :
විෂය :

කිසියම් ග්‍රන්ථයක් සඳහා භාවිතා කරන ලද අංකයක් මොනම හේතුවක් නිසාවත් වෙනත් ග්‍රන්ථයකට යෙදිය නොහැක. එමෙන් ම වරක් ග්‍රන්ථයකට අංකයක් ලබාගත් පසු නැවත එම ග්‍රන්ථයට අංකයක්

ලබා නොගත යුතුය. එසේ සිදුවුවහොත් ඉන් ද්විත්වකරණයක් ඇතිවීමට ඉඩ ඇති බැවින් ප්‍රකාශක-යින් විසින් අංක ලබාගැනීමට ඉල්ලුම් කිරීමේදී ඉතා සුපරීක්ෂාකාරී විය යුතුයි.

## ● ISBN ලේඛනයක් පවත්වාගෙන යාම :

මේ ක්‍රමයට ඇතුලත් සෑම ප්‍රකාශකයකු විසින්ම ISBN ලේඛනයක් පවත්වාගෙන යායුතුය. ප්‍රකාශයට පත් කරනු ලැබූ ග්‍රන්ථ සහ ප්‍රකාශයට පත් කිරීමට සැලසුම් කර ඇති ග්‍රන්ථ සඳහා ලබාගත් ප්‍රමිති ග්‍රන්ථ අංකය, කතෘ, ග්‍රන්ථ නාමය, සංස්කරණය, ප්‍රකාශන වර්ෂය ආදී විස්තර මෙම ලේඛනයෙහි ඇතුලත් කළ යුතු වේ.

ISBN ලේඛනය පිළියෙළ කළයුතු ආකාරය පහත දැක්වෙන සටහනින් පැහැදිලි වේ.

අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය මුද්‍රණය කිරීමේදී පියවි ඇසින් බලා ගැනීමට හැකි වන පරිදි මුද්‍රණ අකුරු සහ ඉලක්කම් සඳහා පොයින්ට් 12 භාවිතා කිරීම නිර්දේශ කෙරේ.

අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථඅංක ක්‍රමය ආරම්භවී දැනට වසර 15 ක් ගෙවී ඇතත්, 1986 වර්ෂයේදී මෙම ක්‍රමය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය සමත්වීම අප ලැබූ ජයග්‍රහණයක් ලෙස සැලකිය හැක. ආරම්භක වර්ෂය තුළ මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී ලැබූ අත්දැකීම් තුළින් අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ක්‍රමය ශ්‍රී ලංකාවේ සාර්ථකව ක්‍රියාත්මක කරවීමට ජාතික ආයතනය ලෙස කටයුතු කරන ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට ඇති හැකියාව තහවුරු වී තිබේ.

| ISBN අංකය | කතෘ | ග්‍රන්ථ නාමය | සංස්කරණය | වර්ෂය |
|---|---|---|---|---|
| ISBN 955 - 9011 - 00 - 6 | විජේසිංහ, පීටර් | ඌවේ ජනකවි | .............. | 1986 |
| ISBN 955 - 9011 - 01 - 4 | | International Standard Book Numbering in Sri Lanka | .............. | 1986 |
| ISBN 955 - 9011 - 02 - 2 | අමරසිරි, උපාලි | නව තොරතුරු මාධ්‍ය සහ පාසල් පුස්තකාල | .............. | 1984 |
| ISBN 955 - 9011 - 03 - 0 | | Book Promotion Project | | 1986 |

## ● ISBN අංකය ග්‍රන්ථයක මුද්‍රණය කිරීම :

මෙම අංකය අදාල ග්‍රන්ථයෙහි මුද්‍රණය කිරීම මේ ක්‍රමයෙහි සාර්ථකත්වය සඳහා අත්‍යවශ්‍යවේ. අංකය මුද්‍රණය කිරීම පහත සඳහන් අයුරින් කළ යුතුවේ :

(1) ග්‍රන්ථයක ග්‍රන්ථ නාම පිටුවෙහි පිටුපස ප්‍රකාශන අයිතිය දැක්වෙන පේළියට පහළින් මේ අංකය මුද්‍රණය කළ යුතුය. මේ ස්ථාන-යේ මුද්‍රණය කිරීමට අපහසුවන අවස්ථාවකදී පමණක් ග්‍රන්ථ නාම පිටුවෙහි පහළ අංකය මුද්‍රණය කිරීමට පුළුවන.

(2) පොත් කවරයේ පිටුපස දකුණු පැත්තේ පහළ පාදයේ සිට අඟල් 1 ක් පමණ ඉහළින් මේ අංකය මුද්‍රණය කළ යුතුය.

(3) පොත් කංචුකයක් ඇති පොතක නම් ( Book Jacket ) එම කංචුකයේ පිටුපස දකුණු පැත්තේ පහළ පාදයේ සිට අඟල් 1 ක් පමණ ඉහළින් මෙම අංකය මුද්‍රණය කළ යුතුවේ.

(4) පොත් නාරටිය මෙම අංකය මුද්‍රණය කරනු ලබන තවත් ස්ථානයකි.

### ආශ්‍රිත ග්‍රන්ථ


International Standard Book Number. Nigeria : International Standard Book Numbering Agency, 1978. /9/ p.

International Standard Book Number : Users' Manual for the ISBN System in Papua New Guinea. Papua New Guinea : National Library, 1984. 24 p.

International Standard Book Numbering in Sri Lanka. Colombo : Sri Lanka National Library Services Board, 1986.

International Standard Book Numbering in Zimbabwe. Harare : National Archives of Zimbabwe, 1983. 7 p.

ISBN International Standard Book Number Users' Manual. Carribbean. Guyana : Carribbean Community Secretariat, 18 p.

The ISBN System. Berlin : International ISBN Agency, 13 p.

The ISBN System Users Manual 2nd ed. Berlin : International ISBN Agency, 1978. 16 p.

The ISBN System Users Manual 3rd revised and enlarged ed., Berlin : International ISBN Agency, 1986. 25 p.

ISBN Users' Manual. Canada : National Library, 1984. 25 p.

Plaister, Jean M. " ISBN in Inter - Library Lending Systems in the United Kingdom ". ISBN Review 1 (1977):37-39.

Wawersig, Klaus D. "Status Report of the International ISBN Agency ". ISBN Review 1 (1977) : 9-18.

Whitaker, David. "The International Agency is Ten Years Old". ISBN Review 5 (1981/83) : 3-7.

# පරිගණකය හා පුස්තකාල ග්‍රන්ථ සංසරණය

## ග්‍රන්ථ සංසරණ ක්‍රමවල විකාශනය

ක්ෂණික විඥපන ව්‍යාප්තිය (**information explosion**) යනුවෙන් පොදුවේ හඳුන්වනු ලැබූ, ප්‍රකාශන නිකුත් කිරීම සම්බන්ධයෙන් ඇති වූ සීඝ්‍ර හා අනපේක්ෂිත සංවර්ධනය හේතුකොට ගෙන මීට දශක දෙකකට පමණ පෙර, විශේෂයෙන් බටහිර රටවල පුස්තකාල කටයුතු වල විශාල පරිවර්තනයක් ඇති විණි. පුස්තකාලයේ ද්‍රව්‍ය සම්භාරය හා පාඨක සංඛ්‍යාව ව්‍යාප්ත වන විට ග්‍රන්ථ බැහැර දීමේ කටයුතු සම්බන්ධයෙන් පුස්තකාලයට මහත් දුෂ්කරතා වලට මුහුණ පෑමට සිදු-වුණි. එවකට පැවති ග්‍රන්ථ සංසරණ (**circulation**) ක්‍රම විශාල හා ක්‍රියාශීලී පාඨක සංඛ්‍යාවක් සඳහා කාර්යක්ෂම හා ඵලදායී සේවාවන් පවත්වා ගෙන යාමට උපකාරී නොවිණි. ග්‍රන්ථ බැහැර ගෙන යාමේදී හා ආපසු බාර-දීමේදී ඇතිවූ ප්‍රමාදයන් හේතුකොට ගෙන පුස්තකාල සංසරණ කවුන්ටර අසල දිගු පෝලිම් ඇති විණි. ග්‍රන්ථ නිකුත් කිරීම පිළිබඳ වාර්තා සංවිධාන කිරීමේ අඩුලුහුඩුතා නිසා බොහෝ විට පුස්තකාල ග්‍රන්ථ බැහැර ගෙනයාමට පාඨකයන් උනන්දු නොකරන අන්දමට ග්‍රන්ථ සංසරණ කටයුතු අවුලට පත්වී තිබිණි.

නිවාක් හා බ්‍රවුන් ආදී සංසරණ ක්‍රම පුස්තකාල අතර ජනප්‍රියව පැවතිණි. පාඨකයා තෘප්තිමත් වන ආකාරයට සේවාවන් පවත්වා ගෙන යාමට මෙම ක්‍රම උපකාරී වූයේ කුඩා පුස්තකාල සඳහායි. මෙම සංසරණ ක්‍රම පදනම් කරගෙන, පොත් බැහැර ගෙන යාමේදී පාඨකයා සංසරණ කවුන්ටරය අසළ ගත කරන කාලය කෙටි කරනු වස් පොත් නිකුතුව පිළිබඳ තොරතුරු වහා සටහන් කර ගැනීම සඳහා සංසරණ ක්‍රියාපරිපාටියේ ඇතැම් අංග යාන්ත්‍රිකරණයට ඇතැම් පුස්තකාල උනන්දු විණි.

පොත් නිකුතුව පිළිබඳ තොරතුරු, ඡායාරූප ගත කිරීම, පටිගත කිරීම, අච්චු තහඩු මගින් පිටපත් කිරීම මෙහිලා අනුගමනය කළ ඇතැම් ක්‍රම වේ. මෙම ක්‍රම මගින් ග්‍රන්ථ සංසරණයේදී මතුවන සියලුම ගැටලු විසඳාලිය නොහැකි බව ඉතා ඉක්මනින් පුස්තකාල වලට වැටහිණ. නිකුත් කිරීම වහා කළ හැකි වුවත් සංසරණ ක්‍රියාපටිපාටියේ සෙසු කාර්ය ඉටු වූයේ සෙමෙන්ය. විඥපන ගබඩා කිරීම හා සමුද්ධරණය සඳහා ඉතා කාර්යක්ෂමව යොදා ගත හැකි පරිගණක යන්ත්‍රය පුස්තකාල කටයුතු සඳහා හඳුන්වා දෙනු ලැබුයේ මේ අවධියේය. විශාල තොරතුරු සම්භාරයක් ක්‍රමානුකූලව ගබඩා කිරීමටත් එම ගබඩාවෙන් අවශ්‍ය තොරතුරු මූලයක් වහා ලබා ගැනීමටත් පරිගණක යන්ත්‍රයට ඇති හැකියාව ග්‍රන්ථ සංසරණ කටයුතු සඳහා යොදා ගත හැකි බව පුස්තකාලයාධිපතීහු වටහා ගත්හ.

ආරම්භයේදී ග්‍රන්ථ සංසරණ තොරතුරු ගබඩා කිරීම සඳහා සිදුරුපත් යොදා ගන්නා ලදී. එවකට පැවති පරිගණකවලට දත්ත ප්‍රවිෂ්ට කිරීම සඳහා වඩාත්ම කාර්යක්ෂම ක්‍රමය වූයේ සිදුරුපත් යොදා ගැනීමයි. ග්‍රන්ථ හඳුනා ගැනීමේ තොරතුරු ඇතුලත් ග්‍රන්ථ පත්‍රිකාව සඳහා සිදුරුපතක් යොදා ගන්නා ලදී. සාමාජිකයා හඳුනා ගන්නා සාමාජික පත්‍රයද සිදුරු පතකි. පොත් නිකුතුව පිළිබඳ සටහන සම්පූර්ණ කිරීම සඳහා මෙම සිදුරුපත් දෙක යොදා ගන්නා ලදි. පරිගණක වලට දත්ත ප්‍රවිෂ්ට කිරීම සඳහා නව ක්‍රම නිර්මාණයවූ විට එම ක්‍රම ග්‍රන්ථ සංසරණ ක්‍රියා වලියට ඇතුලත් කරනු ලැබීය.

## පරිගණක උපකාරක සංසරණ ක්‍රම

පරිගණකය පුස්තකාලය සඳහා යොදා ගත හැකි කර්තව්‍යයන් අතුරින් ප්‍රමුඛ ස්ථානය ලැබුයේ ග්‍රන්ථ සංසරණය බව මෙහිදී දක්විය යුතුය. මෙම ප්‍රකාශය වඩාත් නිවැරදි වන්නේ විශාල මහජන පුස්තකාල හා විශ්ව විද්‍යාල පුස්තකාල සම්බන්ධයෙනි. පුස්තකාල සේවක ශ්‍රම පිරිවැය අධික වීම, ග්‍රන්ථ හා වෙනත් පුස්තකාල ද්‍රව්‍යවල මිල අධික වීම, පරිගණක දෘඩ භාණ්ඩ වල මිල පහත වැටීම, ආදී හේතූන් නිසා පරි-ගණක උපකාරක ග්‍රන්ථ සංසරණ ක්‍රම සකස් කිරීමට පුස්තකාල පෙළඹුණි.

පරිගණක උපකාරක සංසරණ ක්‍රම වර්ග තුනකට බෙදිය හැක.

(i) කාණ්ඩ පිරිසැකසුම් ක්‍රම
(ii) හවුල් පිරිසැකසුම් ක්‍රම
(iii) මාර්ග ගත ක්‍රම යනු මේවායි.

මේ අතුරින් ප්‍රථම ක්‍රම දෙක දැන් ක්‍රමයෙන් භාවිත-යෙන් ඉවත් වෙමින් පවතියි.

කාණ්ඩ පිරිසැකසීමේදී පොත් නිකුතුවට හා ආපසු බාරදීමට අදාල තොරතුරු පමණක් පුස්තකාලයේ ඇති පරිගණක මගින් මධ්‍යම පරිගණකයට යවනු ලැබේ. මෙම දත්ත තාවකාලිකව ගබඩා කොට තබා වරින් වර කාණ්ඩ වශයෙන් පිරිසකසා සංසරණ ක්‍රියාපටිපාටියේ සෙසු කටයුතු සම්පූර්ණ කරනු ලැබේ. උදාහරණ වශ-යෙන් ප්‍රමාදිත දැන්වීම් සකස් කිරීම, දඩ ගාස්තු ගණනය, සංඛ්‍යා ලේඛන වාර්තා සකස් කිරීම මධ්‍යම පරිගණකය මගින් ඉටු කෙරේ. ආයතනයේ වෙනත් කටයුතු ඉටු කරනු ලබන මධ්‍යම පරිගණකය පුස්තකාලයේ කටයුතු සඳහා සාමාන්‍යයෙන් යොදා ගන්නේ සති අන්තය හෝ රාත්‍රි කාලය වැනි කාර්ය හීන වේලාවන්හිය.

# එන්. යූ. යාපා

**අධ්‍යක්ෂ, විඥාපන, ස්වාභාවික සම්පත්, බලශක්ති හා විද්‍යා අධිකාරිය**

භාණ්ඩ පිරිසැකසුම භාවිතා කරන වාණිජමය සංසරණ ක්‍රම අතුරින් ප්ලෙසි (**Plessey**) ක්‍රමය ප්‍රධාන තැනක් ගනී. මෙය 1960 දශකය තුළ පුස්තකාල අතර ජනප්‍රියව පැවතිණි.

හවුල් පිරිසැකසුම් ක්‍රම නිර්මාණය වී ඇත්තේ දත්ත පිරිසැකසුම පරිගණක කිහිපයක ආධාර ඇතිව ඉටු කිරීම සඳහාය. පොත් නිකුතුව හා ආපසු බාරදීම පිළිබඳ දත්ත කුඩා පරිගණක යන්ත්‍රයක ගබඩා වන අතර පිරිසැකසීම මධ්‍යම පරිගණකයකදී ඉටු කෙරේ. කුඩා පරිගණකයකට ඉටු කළ හැක්කේ සංසරණ ක්‍රියා-පටිපාටියේ ඇතැම් කාර්ය පමණකි. සෙසු කාර්ය ඉටු කරනුයේ මධ්‍යම පරිගණකය විසිනි. නිකුතු වාර්තා තත්කාලීන කිරීම, සමුද්ධරණයට අවශ්‍ය අනුක්‍රමණිකා සකස් කිරීම මධ්‍යම පරිගණකය ඉටුකරන සමහර කාර්ය වේ. ගේලෝර්ඩ්, ඒ. එල්. එස්., අට්ලස්, වාණිජමය හවුල් පිරිසැකසුම් සංසරණ ක්‍රම කිහිපයකි.

මාර්ගගත (**online**) පිරිසැකසුමේදී දත්ත ප්‍රවිෂ්ට කිරීම හා පිරිසැකසුම පරිගණකයක් හෝ පරිගණක පද්ධතියක් මගින් සිදු කෙරේ. ග්‍රන්ථ හා පාඨකයන් පිළිබඳවත් නිකුත් කිරීම් පිළිබඳවත් තොරතුරු ක්ෂණිකව ලබාගත හැක. සී. එල්. එස්., ගෙයැක්, යුලිසිස් මාර්ගගත පිරිසැකසුම් සංස්කරණ ක්‍රම කිහිපයකි.

## පරිගණක උපකාරක සංසරණ පද්ධතියක් පිහිටුවීම

පරිගණක උපකාරක සංසරණ ක්‍රමයක් සකස් කිරීම සඳහා විකල්ප කිහිපයක් වේ.

(අ) පුස්තකාල සේවකයන් විසින් පද්ධතිය නිර්මාණය කිරීම. මෙහිදී පද්ධතිය සඳහා අවශ්‍ය ප්‍රක්‍රම පුස්තකාලය විසින්ම සම්පාදනය කළ යුතු වේ.

(ආ) පූර්ණ නිර්මිත (**turn key**) ක්‍රමයක් ලබා ගැනීම. මෙහිදී පුස්තකාලය විසින් මොනම ආකාරයක ප්‍රක්‍රම හෝ පද්ධති සැකසීමක් නොකෙරේ.

(ඇ) දත්ත පදනම් පාලන පද්ධතියක් (**Data base management system**) ආධාරයෙන් පද්ධතියක් නිර්මාණය කිරීම. මෙහිදී පුස්තකාලය විසින් ප්‍රක්‍රම සකස් නොකරන අතර පද්ධතිය නර්මාණය කිරීම කළ යුතු වේ.

ආරම්භයේදී පුස්තකාලවලට ඉහත කී දෙවැනි හා තෙවැනි විකල්ප නොවූයෙන් තමන් විසින්ම පද්ධති හා ප්‍රක්‍රම සම්පාදනය කිරීමට සිදුවුණි. මේ සඳහා ප්‍රක්‍රම සම්පාදකයන්, ක්‍රම විශ්ලේෂකයින් ආදී පරිගණක සේවකයන් පුස්තකාලයට බඳවා ගැනීමට සිදුවුණි. මෙම විශේෂඥ පිරිස සඳහා අධික වැටුප් ගෙවීමටත් ඔවුන් පුස්තකාල ක්‍රම පිළිබඳ අවබෝධයෙන් තොර්වූ හෙයින් ඒ සම්බන්ධයෙන් පුහුණුවක් ලබා දීමටත් පුස්තකාල වලට සිදුවුණි. වෙනත් විකල්පයක් නොවූයෙන් බටහිර රටවල පුස්තකාල, විශේෂයෙන් පරිගණක උපකාරක සංසරණ ක්‍රම තම කටයුතු සඳහා යොදා ගැනීම අවශ්‍ය-යෙන්ම කළ යුතුව තිබුණු විශ්ව විද්‍යාල පුස්තකාල, පරිගණක සේවක පිරිස් බඳවා ගත්හ. මෙහි ප්‍රතිඵලය වූයේ එකිනෙකට වෙනස් වූ පරිගණක උපකාරක සංසරණ පද්ධති කිහිපයක් යුරෝපයේ බිහිවීමයි. ජර්මනියේ ඩොර්ඩ්මුන්ඩ් හා නෙදර්ලන්තයේ ලුවන් යන විශ්ව විද්‍යාල එකතුවී නිර්මාණය කළ ඩෝබිස්/ලිබිස් (**DOBIS/LIBIS**), නෙදර්ලන්තයේ වාගනින්ගන් කෘෂි-කාර්මික විශ්ව විද්‍යාලය නිර්මාණය කළ ඇග්‍රලින් (**AGRALIN**) මේ සඳහා උදාහරණ ලෙස දැක්විය හැක.

පුස්තකාල සංසරණ ක්‍රම පිළිබඳව ආරම්භයේදී පරිගණක මෘදු භාණ්ඩ සම්පාදන ආයතන (**Software Houses**) වැඩි අවධානයක් යොමු නොකරන ලද නමුත් පසුව ඉල්ලුම් වැඩිවත්ම ආයතන කිහිපයක් විශේෂයෙන් පුස්තකාල සඳහා පූර්ණ නිර්මිත ක්‍රම (**turn-key**) සකස් කිරීමට උනන්දු වූහ. පූර්ණ නිර්මිත ක්‍රමයට පරිගණන දෘඩ භාණ්ඩ, මෘදු භාණ්ඩ හා පාරිභෝගික භාණ්ඩ ඇතුළත් වේ. මෙම ක්‍රමයක් පුස්තකාලයට ලබාගත් වහාම ක්‍රියාත්මක කළ හැක. මෙවැනි ක්‍රමයක් සොයා ගන්නේ නම් පුස්තකාලය එම ක්‍රමයට ගැලපෙන ලෙස තම ක්‍රියාපටිපාටි වෙනස් කළ යුතු වේ. උදාහරණයක් වශයෙන් පූර්ණ නිර්මිත ක්‍රමය මගින් ග්‍රන්ථ අංක සඳහා රේඛාවලි (**bar-code**) උපයෝගී කර ගන්නේ නම් පුස්තකාලය සියලුම ග්‍රන්ථ සඳහා එතෙක් භාවිතා කළ අංක ක්‍රමය වෙනුවට රේඛාවලි සහිත ලේබල් යොදාගත යුතුය. පූර්ණ නිර්මිත ක්‍රමය වියදම් අධික වන නමුත් පරිගණක ගත කිරීමේ ඉතා ඉක්මන් ක්‍රමය එය වේ.

සංසරණ ක්‍රම නිර්මාණය සඳහා දත්ත පදනම් පාලන පද්ධතියක් යොදා ගත හැක. මෙහිදී සංසරණ ක්‍රමය නිර්මාණය කිරීම සඳහා සීමිත නිදහසක් ලැබෙන අතර ප්‍රක්‍රම සැකසීම අවශ්‍ය නොවේ. දත්ත ගොනු, දත්ත ගොනුවලට ඇතුළත් වන දත්ත මූලයන්, සමුද්-ධරණය සඳහා අවශ්‍ය වන පරිවර්තන ගොනු ආදිය පිළිබඳ තීරණ ගැනීමට පුස්තකාලයාධිපතිට සිදුවේ. දත්ත පදනම් ගැන පද්ධති බිහිකරනු ලබන්නේ කිසියම් පරිගණක වර්ගයක් අරමුණු කරගෙනය. එබැවින් එම පරිගණක වර්ගය පුස්තකාලයට ලබා ගැනීම පූර්ව අවශ්‍යතාවකි.

පරිගණක උපකාරක සංසරණ පද්ධතියක් නිර්-මාණ කිරීමේදී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගතයුතු වේ.

(අ) පද්ධතියට ඇතුලත් කරනු ලබන්නේ කුමන කාර්යයන්දැයි තීරණය කිරීම: උදා: ග්‍රන්ථ බැහැරදීම, ආපසු ලබා ගැනීම, ප්‍රමාදිත ගාස්තු අයකිරීම, ප්‍රමාදිත දැන්වීම් නිකුත් කිරීම, සාමාජිකයන් ලියා පදිංචි කිරීම, අන්තර් පුස්තකාල පිරුළු.

(ආ) පද්ධතිය කුමන ද්‍රව්‍ය සඳහා ප්‍රයෝජනයට ගැනේද යන්න තීරණය කිරීම: උදා: ග්‍රන්ථ, වාර සඟරා කලාප, බැඳි සඟරා, ශ්‍රව්‍ය දෘශ්‍ය, සූක්ෂම පත්‍රිකා, සිතියම්

(ඇ) පාරිසරික පද්ධති සමග ඇති සම්බන්ධතාවය තීරණය කිරීම: උදා: පරිපාලනය, ප්‍රතිගහණය, විමර්ශන, සූචිකරණය, වර්ගීකරණය ආදී පද්ධති සංසරණ පද්ධතියට සම්බන්ධවන ආකාරය දැනගැනීම වැදගත්ය. පරිපාලන පද්ධතිය මගින් සාමාජිකයන්, දඩ මුදල් අයකිරීම පිළිබඳව ගන්නා තීරණ සංසරණ පද්ධතියට බලපානු ලබයි. සූචි පද්ධතිය මගින් බිහි කරනු ලබන සූචිය සංසරණ පද්ධතිය මගින් ප්‍රයෝජනයට ගැනේ.

සංසරණ පද්ධතියට ඇතුලත් විය හැකි කාර්ය මෙහිදී සලකා බැලීම සුදුසුය. මෙම කාර්යයන් සියල්ලම හෝ සමහරක්, පද්ධතියට ඇතුලත් කළ හැක. සංසරණ පද්ධතියක් බිහි කිරීමේදී ඉහත දැක්වූ විකල්ප තුනෙන් එකක් තෝරා ගැනීමේදී පද්ධතියට ඇතුලත් කළ හැකි කාර්යය පිළිබඳ විමසා බැලීම සුදුසුය. සංසරණ පද්ධතියකට ඇතුලත් විය හැකි කාර්යයන් පහත දක්වා ඇත.

(1) පුස්තකාල ද්‍රව්‍යයක් නිකුත් කිරීම පිළිබඳ සටහන් තබා ගැනීම (අවම වශයෙන් පාඨකයා, ග්‍රන්ථය හා දිනය)
(2) පුස්තකාලයකට බාරදුන් ද්‍රව්‍යයකට අදාල නිකුතු සටහන අවලංගු කිරීම.
(3) පාඨකයා ද්‍රව්‍යයක් ලබා ගැනීමට සුදුසු අයෙකුදැයි නිශ්චය කිරීම (පාඨකයාගේ සාමාජිකත්වය අවලංගුව හෝ අත්හිටුවා තිබිය හැක. එවැනි පාඨකයෙකුට ද්‍රව්‍ය නිකුත් කිරීම වැළැක්විය යුතුය.)
(4) පාඨකයා ඉල්ලුම් කරන ද්‍රව්‍ය ලබා ගැනීමට සුදුසු අයෙකුදැයි නිශ්චය කිරීම (පුස්තකාලයේ ද්‍රව්‍ය වර්ගයක්, නිබන්ධන වැනි යමක්, කිසියම් පාඨක වර්ගයකට පමණක් නිකුත් කරනවා විය හැක.)
(5) පාඨකයා ඉල්ලුම් කරන ද්‍රව්‍ය බැහැර දිය හැකිදැයි නිශ්චය කිරීම. (මෙම ද්‍රව්‍ය පුස්තකාලය තුළ පමණක් විමර්ශනය කළ යුතු ග්‍රන්ථයක් විය හැක.)
(6) පාඨකයා ඉල්ලුම් කරන ද්‍රව්‍ය වර්ගය අනුව බැහැර දෙන කාර්ය නිශ්චය කිරීම (පාඨ ග්‍රන්ථ සඳහා වැඩි කාලයක්ද, නිතර භාවිත වන ග්‍රන්ථ සඳහා අඩු කාලයක්ද බැහැරදීම පුස්තකාලයේ ප්‍රතිපත්තියක් විය හැක.)
(7) පාඨක වර්ගයා අනුව බැහැරදීමේ කාලය නිශ්චය කිරීම. (විශ්ව විද්‍යාලයක නම් ආචාර්ය මණ්ඩලයට වැඩි කාලයකටද හා ශිෂ්‍යයන්ට අඩු කාලයකටද ග්‍රන්ථ බැහැර දිය හැක.)
(8) පාඨකයාට වරකට තමන් වෙත රඳවා ගත හැකි ග්‍රන්ථ සංඛ්‍යාව නිශ්චය කිරීම හා එම සංඛ්‍යාව ඉක්මයන්නේ දැයි දැන ගැනීම.
(9) පාඨකයා ඉල්ලුම් කරන ද්‍රව්‍ය වෙන් කරනු ලැබූ (**reserved**) ද්‍රව්‍යයක් දැයි දැන ගැනීම.
(10) කිසියම් පාඨකයෙකු වෙත ඇති ද්‍රව්‍ය පිළිබඳ විස්තර
(11) කිසියම් ද්‍රව්‍යයක් ලබා ගෙන ඇති පාඨකයා දැනගැනීම.
(12) කිසියම් ද්‍රව්‍යයක් අවශ්‍ය වූ විට එය කැඳවීම.
(13) ප්‍රමාදිත ද්‍රව්‍ය හඳුනා ගැනීම හා ඒවා සඳහා සිහි කැඳවීම් යැවීම.
(14) ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් පාඨකයාට එතෙක් යැවූ සිහි කැඳවීම් සංඛ්‍යාව දැන ගැනීම.
(15) ග්‍රන්ථයක් අතිප්‍රමාදිත නම් ඒ සඳහා අය කළ යුතු අලාභය නිශ්චය කිරීම.
(16) ප්‍රමාදිත ගාස්තු ගණනය කිරීම.
(17) පාඨකයෙකු හිඟ හිටවා ඇති ප්‍රමාදිත ගාස්තු ප්‍රමාණය දැන ගැනීම.
(18) ද්‍රව්‍යයක් පාඨකයෙකු සඳහා වෙන් කිරීම.
(19) ආපසු බාරදුන් ද්‍රව්‍යයක් වෙන් කරනු ලැබූවක් දැයි දැන ගැනීම.
(20) වෙන් කරනු ලැබූ ද්‍රව්‍යයක් පුස්තකාලයට ලැබුණු පසු ඒ බව අදාල පාඨකයාට නිවේදනය කිරීම.
(21) සංසරණ පිළිබඳ සංඛ්‍යා ලේඛන රැස් කිරීම. (පාඨක වර්ග, ග්‍රන්ථයේ විෂය, ද්‍රව්‍ය භාවිතය, දඩ මුදල් ගෙවීම, ප්‍රමාදවීම් පිළිබඳ සංඛ්‍යා ලේඛන පරිපාලන තීරණ සඳහා අවශ්‍ය වේ.)
(22) පාඨකයෙකුට ද්‍රව්‍ය නිකුත් කිරීම අත්හිටුවීම.
(23) ග්‍රන්ථයක් බැහැර ගෙනයාම අත්හිටුවීම.

සංසරණ පද්ධතියක් මගින් ඉහත සඳහන් කාර්යයන් ඉටු කළ හැකිවාක් මෙන්ම ඇතැම් කාර්යයන් ඉටු කිරීම වැළැක්විය යුතුය. පහත සඳහන් කාර්යයන් පරිගණක සංසරණ පද්ධතියකට පහසුවෙන් ඉටු කළ හැකි නමුත් එසේ කිරීම සම්මත චර්යා ධර්මවලට පටහැනි බැවින් එම කාර්යයන් ඉටුවීම වැළැක්වීමට පියවර ගත යුතුය.

1. පාඨකයෙකු කියවා ඇති ග්‍රන්ථ පිළිබඳ විස්තර දැනගැනීම. (පරිගණකයේ පාඨකයා බැහැර ගෙනගිය ග්‍රන්ථ පිළිබඳ විස්තර ඇතුලත් බැවින් පාඨකයා ලබාගත් ග්‍රන්ථ ලැයිස්තුවක් පරිගණකයෙන් ලබා ගත හැක.)
2. කිසියම් ග්‍රන්ථයක් ලබාගෙන ඇති පාඨකයන් පිළිබඳ විස්තර නිකුත් කිරීම.
3. කිසියම් ග්‍රන්ථයක් එවකට ලබා සිටින පාඨකයා පිළිබඳ විස්තර අනෙකුත් පාඨකයන්ට සැපයීම.

(33 පිටුව බලන්න.)

# ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතිය
# ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතියේ අනුග්‍රහයෙන් පහත සඳහන් කෘතීන් 1987 වසරේ ජනවාරි සිට ජූනි දක්වා පළ කර ඇත.

| විෂය | කර්තෘ නාමය | ග්‍රන්ථ නාමය | මිල |
|---|---|---|---|
| දර්ශනය | ආචාර්ය නලින් ද සිල්වා | මගේ ලෝකය | 21.00 |
| | ආනන්ද විජයවීර | හදවතේ සටහන් | 27.00 |
| ආගම | ප්‍රේමචන්ද්‍ර ද සිල්වා | සූත්‍ර පිටක සූචිය සහිත සූත්‍ර සම්පිණ්ඩනය | 27.00 |
| | ආචාර්ය ඩබ්. එස්. කරුණාරත්න | බෞද්ධ සංස්කෘතික ලිපි | 42.00 |
| | වී. බී. කාන්ගහ ආරච්චි | භාරත ලංකා බෞද්ධ සංස්කෘතිය | 24.00 |
| වාණිජ හා ආර්ථික විද්‍යා | එස්. සී. සමරනායක | කළමනාකරණ ගණකාධිකරණය | 48.00 |
| | ප්‍රියරාජ් මුදලිගේ | සරල ගණකාධිකරණය .. | 36.00 |
| | කේ. ඩී. නන්දසේන | දේශීය බැංකු ක්‍රමයේ විවිධ ලක්ෂණ | 42.00 |
| | ආචාර්ය ඩබ්. ඒ. ජයතිස්ස | මූලික සංඛ්‍යාන විද්‍යාව — 1 | |
| නීතිය | ආචාර්ය ජයතිස්ස ද කොස්තා | අන්තර් ජාතික නීතිය | 24.00 |
| අධ්‍යාපනය | එල්. සී. සමරකෝන් | කාර්යක්ෂමතා සංවර්ධනය සඳහා ගුරු සේවය ඇගැයීම | 24.00 |
| | දයාරෝහණ අතුකෝරාල | භාෂාව ඉගැන්වීමේ ක්‍රම | 27.00 |
| සිරිත් විරිත් හා ජනශ්‍රැති | පොලොම්මාරුවේ හේමසිරි හිමි | රුහුණේ ඇදහිලි හා විශ්වාස | 30.00 |
| | අමුනුපුරේ සීලවංශ හිමි | බුදු සමයෙන් සැකසුණු ලක්දිව ජන ඇදහිලි | 26.40 |
| භාෂාව හා සාහිත්‍ය විචාර | නිමල් ජේ. ගමගේ | සිංහල ජන කවියේ සාහිත්‍යමය අගය හා සංස්කෘතික ලක්ෂණ | 60.00 |
| | මහාචාර්ය ඒ. වී. සුරවීර | කලාව යනු කුමක්ද? | 51.00 |
| | කුලතිලක කුමාරසිංහ | සිංහල කෙටිකතාවේ වර්ධනීය අවස්ථාවක් | 21.60 |
| | වී. බී. කාන්ගහ ආරච්චි | සිංහල සාහිත්‍යයේ සංක්ෂිප්ත ඉතිහාසය | 28.80 |
| නව කතා | සුමිත්‍රා රාහුබද්ධ | සුර අසුර | 39.00 |
| | අසිලින් සිරිවර්ධන | බලන් හරිම් කඩතුරාව | 54.00 |
| | ඩී. එම්. කරුණාරත්න | වෙස් හළ පිරිමියෙක් | 27.00 |
| | කඳපොල කුමාරතුංග | තරු මල් යට | 36.00 |
| | පී. එච්. වෙදගේ | වලගම්බා හටන | 24.00 |
| | සෝමපාල දෙමටපිටිය | ගුරු සිත නොරිදවා | 33.00 |
| කෙටි කතා | ආචාර්ය සුනන්ද මහේන්ද්‍ර | කතාවෙන් කතාව | 18.00 |
| | ආරියවංශ අබේසේකර | නාඩගම්කාර පළගැටියා සහ තවත් කතා | 21.60 |
| | කරුණාරත්න මාකඩුවාව | ඉර පායා ඉර මුදුනට එන්ට එපා | 27.00 |
| | පියදාස රත්පත්විල | වැස්සට පසු පිපිරුණු අකුණු | 18.00 |
| | ධර්මා එස්. සමරනායක | සංහිඳියාව | 24.00 |
| | පියසීලි විජේමාන්න | වංක ගිරිය | 29.40 |
| | ලෙනින් අමරවික්‍රම | ඇස් දෙක වගේ මිනිසෙක් | 21.00 |
| | ආචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු | භක්තිවන්ත මිත්‍රයා සහ තවත් කතා | 24.00 |
| | රෝහණ ලක්ෂමන් පියදාස | පිට්ටනියේ අපේ පස්වැනි පන්තිය | 21.00 |
| | දෙනගම සිරිවර්ධන | ඇමති මුහුණ | 28.80 |
| | සේපාල සමරතුංග | පුනරුදය | 27.00 |
| | ආචාර්ය සුනන්ද මහේන්ද්‍ර | සැබෑ ලොවින් බිඳක් | 15.00 |

| විෂය | කතෘ නාමය | ග්‍රන්ථ නාමය | මිල |
|---|---|---|---|
| නාට්‍ය | රෝලන්ඩ් අබේපාල | ශ්‍රී ලංකාවේ නාට්‍ය හා රංග කලාව | 33.00 |
| | ආචාර්ය සුනන්ද මහේන්ද්‍ර | ඔහුගේ ලෝකය සහ තවත් ගුවන් විදුලි නාට්‍ය | 24.00 |
| | ජයන්ත චන්ද්‍රසිරි | අත් | 21.00 |
| පද්‍ය | සමිත රත්ගම | මකරා මිය ගිය පසු | 15.00 |
| | කේ. ඩී. ඒ. නානායක්කාර | හමුවිණි අපට මහවැලි නව රුසිරු ළඳ | 24.00 |
| ළමා සහ යොවුන් සාහිත්‍යය | සමන් තිලකසිරි | පැණි රූපය | 24.00 |
| | එස්. තිලකරත්න | සිහිනි රස | 24.00 |
| | ප්‍රේමසිරි කාරියවසම් | සෙල්ලම් පහුර | 24.00 |
| | ර්. ගල්ලොළුවෙ | වැරදුණු දඩයම | 24.00 |
| | දයා ජයවර්ධන | නුවණැති බූරුවා සහ වෙනත් කතා | 24.00 |
| | සිබිල් වෙත්තසිංහ | ගිනි කුකුලන් තුන් දෙනයි | 24.00 |
| | කමලා අමරවීර | බක බක අයියා | 18.00 |
| | SUJATHA UDUGAMA | THE HOLIDAY | 22.20 |
| පරිවර්තිත කෘති (නවකතා) | ආරියදාස සෝමතිලක (C. ACHIBI) | මුහුදු ගොඩගලා (THINGS FALL APART) | 36.00 |
| | ඩී. ආර්. ඒ. සෙනෙවිරත්න (CARLO COLLODI) | පිනෝකියෝ (PINOCCHIO) | 48.00 |
| පරිවර්තිත කෘති (කෙටිකතා) | ආර්. එච්. එම්. පියසේන | කුකුල් පොරය | 27.00 |
| පරිවර්තිත කෘති (නාට්‍ය) | පී. වැලිකල (R. C. SHERIFF) | දවසක වෙනස (HOME AT SEVEN) | 24.00 |
| විද්‍යාව | චන්ද්‍රා සමරසිංහ | අතිරේක කියවීමට විද්‍යාව | 30.00 |
| | ඩබ්. ජයතිලක | පරමාණුක න්‍යෂ්ටිය | 24.00 |
| සෞඛ්‍ය විද්‍යාව | විමල් ගාමිනී යාපා | හෝමියෝපති වෛද්‍ය ක්‍රමය | 30.00 |
| උද්භිද විද්‍යාව | කුසුම් පතිනායක | ශාක ලෝකය හඳුනා ගන්න | 27.00 |
| | ආර්. එන්. ද පොන්සේකා | වර්ගීකරණය නාමකරණය සහ ශාකකුල | 36.00 |
| ගීත | ප්‍රේමදාස ශ්‍රී අලවත්තගේ | මල් වැස්ස | 28.80 |
| | සී. ද එස්. කුලතිලක | විශ්ව සංගීත ක්ෂේත්‍ර | 33.00 |
| | දයාරත්න රණතුංග | සංගීත විමර්ශන | 27.00 |
| | පියසිරි විජයරත්න | මකුළු දැලට පිනි වැටිලා | 30.00 |
| | ඩබ්. ඒ. අබේසිංහ | විකසිත වන්නට මලක් වෙලා | 18.00 |
| චිත්‍ර පට | පරාක්‍රම නිරිඇල්ල | කඩ ඉම | 21.00 |
| | හඳුජී මහින්ද ජයතිලක | අතරමග නවාතැන | 21.00 |
| | සේනාරත්න වීරසිංහ | සිර මැදුර | 27.00 |
| ක්‍රීඩා | චන්ද්‍රා වික්‍රමරත්න | මලල ක්‍රීඩා නීති | 24.00 |
| ඉතිහාසය | අරිසෙන් අහුබුදු | ලංකා ගම් නම් වහර | 36.00 |
| | එම්. එච්. සිරිසෝම | හෙළ උරුමය | 30.00 |
| | මහාචාර්ය විමල විජේසූරිය | රුහුණේ අප්‍රකට පුරා වෘත්ත | 21.00 |
| | ජේ. ඇලෙක්ස් ප්‍රනාන්දු | ඊශ්‍රායල් ඉතිහාසය | 48.00 |
| දේශපාලන විද්‍යාව | පී. ජේ. ජී. සිල්වා | සම්භාව්‍ය දේශපාලන දර්ශනය | 27.00 |
| දේශ විස්තර | කෝ. කෝ. විජේරත්න | මා දුටු ලෝකය | 27.00 |

ඉහත සඳහන් සියලුම කෘති විශේෂ වෙළෙඳ මට්ටම් යටතේ මහජන පුස්තකාල, පාසල් පුස්තකාල, දෙපාර්තමේන්තු පුස්තකාල හා සුභ සාධක පුස්තකාල සඳහා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයෙන් මිල දී ගත හැකිය.

# පුස්තකාල ප්‍රවෘත්ති

## ත්‍රෛමාසික ප්‍රකාශනය

ආරම්භය : 1973

**සංස්කරණය හා ප්‍රකාශනය :**

පුස්තකාල පර්යේෂණ හා සංවර්ධන අංශය

ප්‍රකාශන ඒකකය,

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

සෑ. යු.

**මෙම ප්‍රකාශනයෙහි පළවන ලිපිවල සඳහන් අදහස් අනිවාර්යයෙන් ම ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අදහස් නොවන අතර, ඒ පිළිබඳ වගකීම් අදාළ ලේඛකයන් වෙත පැවරේ.**

| | |
|---|---|
| **කලාපයක මිල** | **රු: 5. 00** |
| **වාර්ෂික දායක මුදල** | **රු: 20. 00** |
| **(තැ. ගා. සමග)** | |

දායක මුදල්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය නමට ලියනු මැනවි.

විමසීම් හා ලිපි :

අධ්‍යක්ෂ / ලේකම්
**ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය**
නිදහස් මාවත, කොළඹ 7. ටෙලි. 598847

# පුස්තකාල විද්‍යාර්ථීන් ගේ
# දැනුම වඩන ප්‍රකාශන පෙළක්

| | | |
|---|---|---|
| 1. | පුස්තකාල බලය (පරිවර්තනයකි) – ජේම්ස් තොම්සන් | 38. 50 |
| 2. | නව තොරතුරු මාධ්‍ය සහ පාසල් පුස්තකාල – උපාලි අමරසිරි | 30. 00 |
| 3. | කුඩා කාර්මික ආයතන පුස්තකාල (පරිවර්තනයකි) – ඩී. ජේ. කැම්බල් | 31. 00 |
| 4. | මූලික සුචිකරණය – ධනපාල ගුණසේකර | 37. 00 |
| 5. | ඌවේ ජනකවි – පීටර් විජේසිංහ | 15. 00 |
| 6. | මහජන පුස්තකාල ප්‍රමිති | 4. 00 |
| 7. | පුස්තකාල ප්‍රවෘත්ති (ත්‍රෛමාසික) වාර්ෂික | 20. 00 |
| 8. | ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය (ත්‍රෛමාසික) වාර්ෂික | 80. 00 |
| 9. | කාර්මික විද්‍යාල පුස්තකාල තොරතුරු සංග්‍රහය – උපාලි අමරසිරි | |
| 10. | Catalogue of Post Graduate Theses – N. Amarasinghe | 74. 00 |
| 11. | Directory of Technical College Libraries – Upali Amarasiri | |

මුදල් හෝ තැපැල් ඇණවුම්, චෙක්පත් – සභාපති, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය නමට ලියනු මැනවි.

විමසීම් හා ලිපි :


අධ්‍යක්ෂ / ලේකම්,
**ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,**
තැ. පෙ. 1764 නිදහස් මාවත. කොළඹ 07. ටෙලි 598847

28 වැනි පිටුවෙන්

## පරිගණකය හා . . . .

4. කිසියම් පාඨකයෙකු එවකට ලබාගෙන තිබෙන ග්‍රන්ථ පිළිබඳ විස්තර අනෙකුත් පාඨකයන්ට සැපයීම.

### පරිගණක උපකාරක වාණිජමය සංසරණ ක්‍රම

පරිගණක යොදා ගන්නා සංසරණ ක්‍රම ගණනාවක් විවිධ ආයතන මගින් නිර්මාණය කොට ඇත. පුස්තකාල කාර්ය, වර්ගය, ප්‍රමාණය අනුව මේ අතුරින් වඩාත්ම ගැලපෙන ක්‍රමය තෝරාගත යුතුය. පූර්ණ නිර්මිත ක්‍රම වශයෙන් වෙළඳ පොළෙන් මිලට ගත හැකි මෙම ක්‍රම අතුරින් දෙකක් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

### (අ) ගෙයැක් සංසරණ ක්‍රමය (Geak Circulation System)

උතුරු ඇමරිකාවේ, විශේෂයෙන් විශ්ව විද්‍යාල පුස්තකාල බොහොමයක් අනුගමනය කරන මෙම ක්‍රමය පූර්ණ නිර්මිත ක්‍රම අතුරින් ජනප්‍රිය සංසරණ ක්‍රමයක් ලෙස හැඳින්විය හැක. කැනඩාවේ ගෙයැක් ආයතනය මගින් නිර්මාණය කරනු ලැබූ මෙම ක්‍රම කැනඩාවේ වෙස්ටර්න් ඔන්ටේරියෝ විශ්ව විද්‍යාලයේදී මට අත්-දැකීමට ලැබුණි. ගෙයැක් ක්‍රමයට මධ්‍යම පරිගණකයක් හා එයට සම්බන්ධ කැරුණු ආන්තික (Terminals) පද්ධතියක්ද වේ. පුස්තකාල ශාඛාවල ඇති ආන්තික මගින් එයින් නිකුත් කරන හා එයට ලැබෙන ග්‍රන්ථ පිළිබඳ තොරතුරු මධ්‍යම පරිගණකයේ ගබඩා කරනු ලබයි. මධ්‍ය පරිගණකය වශයෙන් කුඩා පරිගණකයක් (Mini Computer) භාවිතා වන අතර ආන්තික 100 දක්වා ප්‍රමාණයක් එයට සම්බන්ධ කිරීමට පහසුකම් ඇත. පුස්තකාල පද්ධතියේ ඉටු වූ හා ඉටුවන ඕනෑම ග්‍රන්ථ නිකුත් කිරීමක්, වෙන් කිරීමක් සිහිකැඳවීමක් හෝ ආපසු බාරදීමක් පිළිබඳ තොරතුරු ක්ෂණිකව දැන ගත හැක. මෙම ක්‍රමය මගින්, ග්‍රන්ථ නිකුත් කිරීමේ තොරතුරු ආශ්‍රයෙන් සූචියක් නිර්මාණය කරනු ලබයි. පුස්තකාලයේ සූචිය පරිගණකගත නොවූ අවස්ථා-වලදී මෙම උප සූචිය බොහෝ විට පුස්තකාල සේවක-යන්ට තොරතුරු ලබා ගැනීමට උපකාරී වේ.

ශාඛාවල ඇති ආන්තිකයකට අංග තුනක් ඇතුළත් වේ.

(1) කියවීම් යන්ත්‍රය
(2) යතුරු පුවරුව හා
(3) වීඩියෝ දර්ශකය යන ඒවායි.

ග්‍රන්ථ හඳුනාගැනීමේ අංක (බොහෝ විට ඇමතුම් අංක) ග්‍රන්ථයේ සටහන් කර ඇත්තේ රේඛාවලි (bar code) ලේබලයක් ඇලවීමෙනි. මෙය ග්‍රන්ථයේ ඇතුළු කවරයේ කෙළවරක අලවා ඇත. සාමාජික බලපත්‍රය ප්ලාස්ටික් තහඩුවකි. මෙහි සාමාජිකයාගේ අංකය සටහන්වී ඇත්තේ රේඛාවලි ලේබලයක් මගිනි. රේඛා-වලියේ දැක්වෙන අංකය හඳුනා ගැනීම පිණිස රේඛාවලි කියවීම් යන්ත්‍රයක් (bar code reader) භාවිතා කෙරේ. පෑනක් වැනිවූ මෙම උපකරණයේ කෙළවරින් නික්-මෙන ආලෝකය රේඛාවලිය මත පතිත වී පරාවර්තනය වන ආලෝකය මගින් රේඛාවලියේ අන්තර්ගත අංකය හඳුනා ගත හැකි වේ. රේඛාවලිය මත යන්ත්‍රය ගමන් කරවූ විට යන්ත්‍රය මගින් එහි අංකය හඳුනාගෙන එය පරිගණකයකට ප්‍රවිෂ්ට කෙරේ. මේ ආකාරයට සාමාජික බලපත්‍රයේ අංකයද පරිගණකයට ප්‍රවිෂ්ට කළ හැක. ගෙයැක් ක්‍රමය අනුව ග්‍රන්ථයක් නිකුත් කිරීමට වැය වනුයේ තත්පර කිහිපයකි. යන්ත්‍රය ක්‍රියා විරහිත වූ අවස්ථාවක යතුරු පුවරුව මගින් අදාල අංක පරිගණක-යට ඇතුළු කළ හැකිය.

ග්‍රන්ථයේ අංකය යන්ත්‍රය මගින් කියවූ වහාම ග්‍රන්ථය පිළිබඳ කිසියම් ප්‍රශ්නයක් වෙතොත් ඒ පිළිබඳ පණිවුඩයක් වීඩියෝ දර්ශකයේ ප්‍රදර්ශනය වේ. සාමාජික අංකය කියවූ විට සාමාජිකයා පිළිබඳ ප්‍රශ්නවලට අදාල පණිවුඩයක් වීඩියෝ දර්ශකයේ ප්‍රදර්ශනය වේ. මෙවැනි ප්‍රශ්න ඇති අවස්ථාවක ග්‍රන්ථ නිකුත් කිරීම පරිගණකය මගින් ප්‍රතික්ෂේප කරනු ලබයි.

ගෙයැක් ක්‍රමය මගින් සංසරණ ක්‍රියාපටිපාටියේ ඇතැම් කාර්යයන් ඉටු කරනු ලබන්නේ පරිගණකයට කාර්ය හීන රාත්‍රි කාලයේදීය. ප්‍රමාදවීම්, හදිසි කැඳවීම්, දඩ, ග්‍රන්ථයේ වැය අයකර ගැනීම් ආදිය අදාල නිවේදන ලිපි සකස් කරනු ලබන්නේ රාත්‍රි කාලයේදීය. ප්‍රමාදවීම් පිළිබඳ නිවේදන ලිපි දිනපතා පිළියෙළ කිරීම, ප්‍රමාද පැය ගණන අනුව දඩ අයකර ගැනීම, ග්‍රන්ථයක් දින කිහිපයකම වෙන්කර තැබීම හෝ බැහැර ගෙනයාම වැළැක්වීම, පාඨමාලාවකට අයත් ශිෂ්‍ය කණ්ඩායමකට ග්‍රන්ථ නිකුත් කිරීම, වැනි විශේෂ කාර්යයන් ගෙයැක් ක්‍රමයට ඉටු කළ හැක.

ගෙයැක් ක්‍රමයේ විශේෂ අංගය වනුයේ එමගින් සපයනු ලබන පරිපාලන තොරතුරුයි. සංසරණ සංඛ්‍යා ලේඛන විවිධාකාරව ලබා ගැනීම, වර්ග අංකය, පාඨක වර්ගය, පාඨමාලාව, අනුව නිකුත් කිරීම් විශ්ලේෂණය කිරීම, පුස්තකාලයේ ඉවත් කළයුතු හෝ අතිරේක පිටපත් ලබාගත යුතු ග්‍රන්ථ හඳුනා ගැනීම, අලුත්වැඩියා කළයුතු ග්‍රන්ථ හඳුනා ගැනීම ආදී කාර්යයන්ද ගෙයැක් ක්‍රමය මගින් ඉටු කළ හැක.

### ඒ.එල්.එස්. සංසරණ ක්‍රමය (ALS Circulation System)

ඒඑල්එස් ක්‍රමය ගෙයැක් ක්‍රමය වැනි පූර්ණ නිර්මිත (turn key) පද්ධතියකි. නෙදර්ලන්තයේ මෑ ගතකළ කාලයේදී රොටර්ඩෑම් මහජන පුස්තකාලයේ

භාවිතා කළ මෙම ක්‍රමය වඩාත් මගේ සිත්ගත් ක්‍රමය වූයේය. ඒඑල්එස් ක්‍රමයේ මූලික පරමාර්ථය වූයේ හැකි ඉක්මනින් ග්‍රන්ථයක් නිකුත් කිරීමයි. විශාල පාඨක සංඛ්‍යාවකින් හා ග්‍රන්ථ සම්භාරයකින් යුතු ජනාකීර්ණ නගරයක කාර්ය බහුල මහජන පුස්තකාලයකට මෙම ක්‍රමය වඩාත් සුදුසු වේ.

සංසරණ පද්ධතියේ කාර්ය ස්ථාන දෙකක් හෝ තුනකට වඩා නැත. මෙම කාර්ය ස්ථානයකින් ග්‍රන්ථයක් නිකුත් කිරීම හෝ ආපසු බාරගැනීම සිදු කෙරේ. කාර්ය ස්ථානයේ ඇත්තේ විදුලි බුබුලු මගින් ආලෝකමත් වන පුවරුවකි. මෙහි විදුලි බුබුලු ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වීම මගින් ගැටලුවක් පිළිබඳව පුස්තකාල සහායකට සංඥා කෙරේ. දල්වෙන විදුලි බුබුලේ පිහිටීම අනුව ප්‍රශ්නය කුමක්දැයි පුස්තකාල සේවකයා වහා හඳුනා ගනී.

ග්‍රන්ථයේ අංකය හා සාමාජික අංකය හඳුනා ගැනීම සඳහා යොදා ඇත්තේ කුඩා ඇළුමිනියම් වෘත්තයි'අංකය අනුව මෙම වෘත්ත ඝන කඩදාසියක අලවා ඇත. ඇළුමිනියම් වෘත්ත සහිත ග්‍රන්ථ පත්‍රිකාව ග්‍රන්ථයේ ඝන කවරය තුළ නිශ්චිත ස්ථානයක බහා ඇත. එය ඉතා උවමනාවෙන් පරීක්ෂා නොකළහොත් පාඨකයෙකුට දැක ගත නොහැක. පාඨකයාගේ සාමාජික පත්‍රයද එලෙස ඇළුමිනියම් වෘත්ත ඇලවූ ඝන කඩදාසියකි.

ග්‍රන්ථයක් නිකුත් කිරීමේදී සාමාජික පත්‍රය සංසරණ පුවරුවේ විශේෂ තව්වකට ඇතුළු කරනු ලැබේ. සාමාජිකයා පිළිබඳ ප්‍රශ්නයක් වේ නම් (දඩ මුදල් නොගෙවීම, නියමිත ග්‍රන්ථ සංඛ්‍යාව දැනටමත් ලබා සිටීම) විදුලි බුබුලක් දල්වේ. එසේ ප්‍රශ්නයක් නොවිණි නම් බැහැර ගෙන යන ග්‍රන්ථය සංසරණ පුවරුව හරහා රූටා යවනු ලැබේ. මෙසේ යැවීමේදී කවරයේ බහා ඇති ග්‍රන්ථ අංක යන්ත්‍රය මගින් කියවා එම ග්‍රන්ථය පිළිබඳ තොරතුරු පරිගණක යන්ත්‍රයට යවනු ලබයි. ග්‍රන්ථය පිළිබඳ යම් ප්‍රශ්නයක් වෙතොත් (වෙන් කළ ග්‍රන්ථයක්, විමර්ශන ග්‍රන්ථයක්) රූටා ගමන් කරන ග්‍රන්ථය අඩුවක් එසවීමෙන් නතර කරනු ලැබේ. ඒ සමගම පුවරුවේ ඇති විදුලි බුබුලක් මගින් අදාල ගැටලුව සංඥා කෙරේ.

ගැටලුව පිළිබඳ විශේෂ තොරතුරු ලබාගත යුතු නම් පුස්තකාල සේවකයාට සංසරණ කවුන්ටරයේ අසල පිහිටි පරිගණක ආන්තික මගින් විමසීමක් කළ හැක.

ඒ. එල්. එස්. ක්‍රමය මාර්ග ගත ක්‍රමයක් ලෙස හැඳින්විය නොහැක. එමගින් තොරතුරු ලබාගත හැක්කේ ඊට කලින් දිනයේ තිබුණු පරිදිය. දිනය ඇතුළත සිදුවූ සංසරණ කටයුතු වහා දැනගත නොහැක.

මෙම ක්‍රමය මගින්ද ග්‍රන්ථ සංසරණ තොරතුරු ආශ්‍රයෙන් උප සූචියක් බිහි කරනු ලබයි. මෙම උප සූචියේ ඇත්තේ බැහැර ගෙන ගිය ග්‍රන්ථ පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු වේ. කියවීම් ශාලාවේ එක් කෙළවරක තබා ඇති පරිගණක ආන්තික රාශියක් මගින් මහජනතාවට මෙම උප සූචිය ගවේශණය කළ හැක.

## ශ්‍රී ලංකාවේ පුස්තකාලවල පරිගණක සංසරණ පද්ධති පිහිටුවීම

ශ්‍රී ලංකාවේ පුස්තකාල අතුරින් දැනට පරිගණක භාවිතා කරන්නේ පුස්තකාල තුන හතරක් පමණි. පුස්තකාල කිහිපයක් පුස්තකාල කටයුතු සඳහා පරිගණක යොදා ගැනීමට සැලසුම් සම්පාදනය කරමින් සිටියි. එසේ වුවද නුදුරු අනාගතයේදී ශ්‍රී ලංකාවේ පුස්තකාලයක් ස්වයංක්‍රීය සංසරණ පද්ධතියක පිහිටුවෙතැයි සිතීම අපහසුය. මෙම නිගමනයට හේතු වශයෙන් පහත දැක්වෙන කරුණු ඉදිරිපත් කළ හැක.

(අ) දැනට පුස්තකාලවල භාවිතයේ පවතින හා නුදුරු අනාගතයේදී පුස්තකාල විසින් භාවිතයට ගනු ලැබීමට සැලසුම් කර ඇති පරිගණක යොදා ගැනීම අදහස් කරනු ලබන්නේ සංසරණ ක්‍රියාපටිපාටිය සඳහා නොව ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත පදනම් බිහි කිරීම සඳහායි. ශ්‍රී ලංකාවේ පුස්තකාලයාධිපතීන් බහුතරය ප්‍රමුඛත්වය දෙනු ලබන්නේ පුස්තකාලයේ ඇති ග්‍රන්ථ, සඟරා වැනි ද්‍රව්‍ය පහසුවෙන් ගවේශනය කළ හැකි වන පරිදි සූචි හා අනුක්‍රමණිකා සකස් කිරීමට.

(ආ) පූර්ණ නිර්මිත පද්ධති මිල අධික ඒවා බැවින් ශ්‍රී ලංකාවේ පුස්තකාල කිසිවකට එවැනි ක්‍රමයක් ලබාගෙන නඩත්තු කළ නොහැක. මෙවැනි ක්‍රමයක් නොමිලේ ස්ථාපනය කරනු ලැබුවත් එම ක්‍රමය පවත්වාගෙන යාම සඳහා අධික වියදමක් දැරීමට සිදුවේ. පද්ධතිය නඩත්තු කිරීම හා එයට අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය වහා සැපයීම සඳහා නියෝජිතවරුන් ශ්‍රී ලංකාව තුළින් ලබාගත නොහැකිය.

(ඇ) දත්ත පදනම් පාලන පද්ධතියක් ආශ්‍රයෙන් සංසරණ ක්‍රමයක් බිහි කිරීම දුෂ්කර වනුයේ ඒ සඳහා සුදුසු පාලන පද්ධතියක් නොමැති නිසයි. සූක්ෂම පරිගණක සඳහා නිර්මාණ කොට ඇති අයි. එස්. අයි. එස්. **(ISIS)**, ඉන්මැජික් **(INMAGIC)**, ඩිබේස් **(Debase)** වැනි පාලන පද්ධති මගින් සංසරණ පද්ධති ඇති කිරීම සඳහා සහායක් නොලැබේ.

(ඉ) මෘදු භාණ්ඩ සපයන ආයතන මගින් පරිගණක පද්ධතියක් පිහිටු වන්නේ නම් ඒ සඳහා අධික මුදලක් මෙන්ම දිගු කාලයක් වැය කිරීමට සිදුවේ. මෙම ආයතනවල ක්‍රම විශ්ලේෂකයන්ට හා ප්‍රක්‍රම සම්පාදකයන්ට පුස්තකාලවල සංසරණ පද්ධති පිළිබඳ නිවැරදි හා පූර්ණ වැටහීමක් නොමැතිවීම මෙම කාර්ය වියදම් අධික වීමට ප්‍රධාන හේතුවක් විය හැකිය.

එසේ වුවද කොළඹ මහජන පුස්තකාලය, විශ්වවිද්‍යාල පුස්තකාල, බ්‍රිතාන්‍ය කවුන්සල පුස්තකාලය හා අනාගතයේදී බිහිවන ජාතික පුස්තකාලය වැනි කාර්ය බහුල සංසරණයක් ඇති පුස්තකාල පරිගණක සංසරණ පද්ධති පිහිටුවීම ගැන අවධානය යොමු කිරීම සුදුසු බව මගේ හැඟීමයි.

# පුවත් ලුහුඬින්

## වැඩ බලන අංශාධිපති

කැලණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශයේ වැඩ බලන අංශාධිපති තනතුරට එල්. ඒ. ජයතිස්ස මහතා පත්කර ඇත. එම අධ්‍යයන අංශයේ කථිකාචාර්යවරයෙකු වශයෙන් අවුරුදු පහක් පමණ කාලයක් සේවය කළ ජයතිස්ස මහතා මෙම තනතුරට පත්වීමට කලින් කැලණිය හා රුහුණු විශ්ව විද්‍යාල පුස්තකාල වල සහකාර පුස්තකාලයාධිපති තනතුරේ කටයුතු කර ඇත.

## පුස්තකාල විද්‍යා ආයතනයක්

ශ්‍රී ලංකාවේ පුස්තකාල විද්‍යා ආයතනයක් පිහිටුවීමේ මූලික පදනම දැන් සකස් වී ඇත.

මෙවැනි පුස්තකාල විද්‍යා ආයතනයක අවශ්‍යතාව ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගෙන ඇති උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම එය පිහිටුවීම සඳහා මූලික කටයුතු සැලසුම් කර ඇත. මේ සඳහා යුනෙස්කෝ ආධාර ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් ඒ පිළිබඳ යෝජනා යුනෙස්කෝ ආයතනයට දන්වා ඇති බව ද දැන ගන්නට තිබේ.

මේ ආයතනය පිහිටුවන ස්ථානය ගැන තවම තීරණයක් ගෙන නැති නමුත් එය කොළඹ පිහිටුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## පරිගණක යන්ත්‍රයට හෝඩිය සකස් වේ.

පරිගණක යන්ත්‍ර භාවිතයට සුදුසු වන අන්දමට සිංහල හෝඩියේ අක්ෂර මාලාව සකස් කිරීම පිළිබඳව විශේෂඥවරුන් ගේ අවධානය දැන් යොමු වී ඇත. මේ ගැන කරුණු සලකා බලන කමිටුවකට, භාෂා විශේෂඥයෝද, පරිගණක යන්ත්‍ර පිළිබඳ විද්‍යාඥයෝද, මුද්‍රණ ශිල්පය පිළිබඳ විශේෂඥයෝද ඇතුලත් වෙති.

හෝඩියේ සමහර අකුරු හල් කිරීමේදී විවිධ ස්වරූපයන් හා හැඩයන් ගන්නා ලකුණු ඒකාකාරී කිරීම අවශ්‍යද යනාදී කරුණු ගැන මේ කමිටුවේ සැලකිල්ල යොමු කෙරෙනු ඇත.

මෙවැනි වෙනස්කම් කිරීම් ගැන මෙයට පෙරත් විවිධ අවස්ථාවන් හි දී උගතුන් විවිධ මත පළ කළ නමුත් ඒ කිසිවක් ක්‍රියාත්මක නොවිණි.

## පුස්තකාල කළමණාකරණය පිළිබඳ සම්මන්ත්‍රණයක්

පුස්තකාල කළමණාකරණය පිළිබඳ සම්මන්ත්‍රණයක් ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පසුගියදා පැවැත්වුණි.

සම්මන්ත්‍රණය දින දෙකක් (1987 මැයි 2, 3) පුරා පැවැත්වුණු අතර එක්සත් රාජධානියේ, වේල්ස් විශ්ව විද්‍යාලයේ, පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ විද්‍යාලයේ ප්‍රධානාචාර්ය – මහාචාර්ය ප්‍රැන්ක් හොග් හා ඇමරිකා එක්සත් ජනපදයේ මේරිලැන්ඩ් විශ්ව විද්‍යාලයේ පුස්තකාල හා ප්‍රවෘත්ති විද්‍යා දෙපාර්තමේන්තුවේ මහාචාර්ය පෝල් වෙසමන් මහත්වරු ප්‍රධාන දේශන පැවැත්වූහ.

සම්මන්ත්‍රණයේ ආරම්භක උත්සවයට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය එෆ්. එස්. සී. පී. කල්පගේ, අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ ලේකම් ඇම්. බී. සී. සිල්වා, කැලණිය විශ්ව විද්‍යාලයේ වැඩ බලන උප කුලපති ආචාර්ය ඇම්. ඇම්. ජේ. මාරසිංහ, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති, සුගුණදස අතුකෝරාළ, බ්‍රිතාන්‍ය මණ්ඩලයේ නියෝජිත රෙක්ස් බාකර්, එක්සත් ජනපද ආර්ථික අරමුදලේ සභාපති රොබට් ලෙන්ග් යන මහත්වරු සහභාගි වූහ. සම්මන්ත්‍රණය ආරම්භක උත්සවයේදී විශේෂ දේශනයක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්, මහාචාර්ය එෆ්. එස්. සී. පී. කල්පගේ මහතා විසින් පවත්වන ලදී.

මේ සම්මන්ත්‍රණයට ජාතික පුස්තකාලය, විශේෂ පුස්තකාල, විශ්ව විද්‍යාල පුස්තකාල හා මහජන පුස්තකාලවල පුස්තකාලයාධිපතිවරුන් සහභාගි වූ අතර, මෙය පැවැත්වුනේ කැලණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, ශ්‍රී ලංකා පදනම් ආයතනය, බ්‍රිතාන්‍ය මණ්ඩලය හා එක්සත් ජනපද ආර්ථික අරමුදල අනුග්‍රහයෙනි.

# ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

## ප්‍රකාශන නාමාවලියක්

ශ්‍රී ලංකාවේ ප්‍රකාශකයන් ගේ නාමාවලියක් ප්‍රකාශයට පත්කිරීම සඳහා අදල මූලික වැඩ කටයුතු නිමවා ඇත. මොවුන්ගේ තොරතුරු එක්රැස් කර නාම ලේඛණ ද සකස් කැර ඇත. මේ අතර වාණිජ ප්‍රකාශකයෝ 95 ක් වෙති. රජයේ සහ රජයේ නොවන ප්‍රකාශකයෝ 94 ක්ද පෞද්ගලික ප්‍රකාශකයෝ (කතෘ / ප්‍රකාශක) 149 ක්ද වෙති. මෙයින් අන්තර්ජාතික ප්‍රමිත ග්‍රන්ථ ව්‍යාපෘතියට ඇතුලත්ව එහි ක්‍රියාකාරී ප්‍රකාශකයන් ලෙස කටයුතු කරන වාණිජ ප්‍රකාශකයෝ 46 ක්ද, රජයේ සහ රජයේ නොවන ප්‍රකාශකයෝ 41 ක්ද, කතෘ ප්‍රකාශකයෝ 147 ක්ද වෙති.

## පුස්තකාල ව්‍යවස්ථා කමිටුව රැස්වෙයි.

මහජන පුස්තකාල ව්‍යවස්ථා කමිටුවේ රැස්වීමක් 1987 පෙබරවාරි 24 වැනිදා පැවැත්විණි.

පසුගිය රැස්වීම් වලදී කරන ලද සාකච්ඡාවන්ට අනුකූලව සකස් කැරුණු ශ්‍රී ලංකා මහජන පුස්තකාල පනතේ කෙටුම්පත මේ රැස්වීමේදී සාකච්ඡාවට භාජනය විය.

පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ, සහකාර නීති කෙටුම්පත් සම්පාදක, මහනුවර මහජන පුස්තකාලයාධිපතිනිය, කොළඹ මහජන පුස්තකාලයාධිපති හා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති යන අය මේ කමිටුවට අයත් වෙති.

## තැපැල් මාර්ගික පාඨමාලාව හදරා සමත් වෙති

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් පවත්වා ගෙන යන පුස්තකාල විද්‍යා ප්‍රලේඛන සහ විඥපන විද්‍යා තැපැල් මාර්ගික පාඨමාලාව හැදෑරූ විසිපස් දෙනෙක් ඉන් සාමාර්ථය ලබා සිටිති. කේ. කේ. අබේවික්‍රම මෙනෙවිය, ඩී. අමරසේකර මහත්මිය, ඩබ්ලිව්. ඒ. ධනවතී මහත්මිය, එම්. එම්. දයාවතී මහත්මිය, එච්. කේ. ග්‍රෙස් මහත්මිය, එම්. ඒ. ගුණපාල මහතා, කේ. පී. ගුණවීර මහතා, පී. පී. ජයසේන මහතා, කේ. ඒ. ජයතිලක මහතා, එම්. බී. කරුණාදාස මහතා, ඩී. එච්. එම්. කරුණාරත්න මහතා, ඩී. කේ. කරුණාවතී මෙනවිය, ජී. කොඩිකාර මෙනවිය, එම්. ඒ. කුසුමාවතී මහත්මිය, ඩබ්. ඒ. නන්දාවතී මහත්මිය, සී. නිකහැටිය මහතා, එස්. ඩී. ප්‍රේමසිලී මෙනවිය, පී. ඩී. ජයතිස්ස මහතා, කේ. පුෂ්පා පෙරේරා මහත්මිය, ඩී. එම්. රණ්බණ්ඩා මහතා, ජේ. ඒ. ඩී. රත්නාවතී මහත්මිය, ඩබ්. එම්. සීලවතී මහත්මිය, අයි. එම්. සෝමාවතී මහත්මිය, ජේ. එම්. සුදුමැණිකා මහත්මිය, අයි. ආර්. සුමනදාස මහතා

පහත සඳහන් අය ඌන සාමාර්ථය ලබා සිටිති.

ඩබ්. එම්. කේ. වාසල මෙනවිය, ඩබ්. එල්. කරුණාවතී මහත්මිය, කේ. එස්. එම්. සිරිවර්ධන මහත්මිය, ආර්. බී. වල්පොල මහත්මිය

## ශ්‍රී ලංකා - ඕස්ට්‍රේලියානු පොත් හුවමාරුවක්

අන්තර්ජාතික හුවමාරු වැඩ පිළිවෙළක් යටතේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයත්, ඕස්ට්‍රේලියානු ජාතික පුස්තකාලයත් අතර පොත් හුවමාරුවක් 1987 ජනවාරි මස 08 වැනිදා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ දී සිදුවිය. මේ අනුව ඕස්ට්‍රේලියාවේ ජාතික පුස්තකාලය පළ කරන සුදුසු ග්‍රන්ථ ශ්‍රී ලංකාවට ද, ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලය පළ කරන ග්‍රන්ථ ඕස්ට්‍රේලියාවටද පිරිනැමේ.

## ගුවන් හමුදා පුස්තකාල පිළිබඳ පුහුණුවක්

ගුවන් හමුදා පුස්තකාලයාධිපතිවරුන් පුහුණු කිරීමේ පාඨමාලාවක් 1987 ජනවාරි 19 වැනිදා සිට පෙබරවාරි 13 වැනිදා දක්වා කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. ගුවන් හමුදා පුස්තකාල පිළිබඳ කටයුතු සම්බන්ධයෙන් ගුවන් හමුදාවේ දස දෙනෙකුට මෙහිදී පුහුණුව ලබා දෙන ලදී. මෙය සංවිධානය කරන ලද්දේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අධ්‍යාපන හා පුහුණු අංශය මගිනි.

## පුස්තකාල සඳහා ආධාර

පුස්තකාල සංවර්ධන ආධාර යටතේ උඩුගම මහජන පුස්තකාලයට හා ඇල්පිටිය ඥානප්‍රදීප පුස්තකාලයට පොත් ආධාර සපයා ඇත. පාසැල් පුස්තකාල සංවර්ධනය සඳහාද පාසැල් 28 කට පුස්තකාල උපකරණ, ලිපිද්‍රව්‍ය හා පොත් පත් සපයා දී ඇත. මීට අමතරව අලුතින් ආරම්භ කරන ලද පාසල් පුස්තකාල 09 කට පුස්තකාල උපකරණ ද්‍රව්‍ය සපයා දී ඒවා සංවිධානය කොට විවෘත කරන ලදී. රදාවඩුන්න මහා විද්‍යාලය, දීගල්ල මහා විද්‍යාලය, දෙලන සිල්වතැන්න විද්‍යාලය, නාරංගොඩ විද්‍යාලය, හම්මලව විද්‍යාලය, සුසමයවර්ධන මහා විද්‍යාලය, මතුගම ශාන්ත මේරි විද්‍යාලය, කන්දේගෙදර විද්‍යාලය සහ මාතර කනංකේ සිරි පැරකුම්බා විද්‍යාලය මේ පාසැල් නවයයි.

විශේෂ පුස්තකාල සංවර්ධනය යටතේ ඇඹිලිපිටිය ග්‍රාම නායකයන් පුහුණු කිරීමේ ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ පුස්තකාලය සඳහා ලී බඩු උපකරණ පරිත්‍යාග කරන ලදී.

## ජාතික ග්‍රන්ථ නාමාවලිය

1974 පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලිය ප්‍රකාශයට පත් කිරීම 1987 දී සිදු විය. මෙය පළ කිරීම නිසා 1962 සිට වර්තමානය දක්වා වූ ජාතික ග්‍රන්ථ නාමාවලිය අඛණ්ඩ ප්‍රකාශනයක් බවට පත්විය.

## ජාතික ඒකාබද්ධ සූචිය

ජාතික පුස්තකාල සේවාවක අත්‍යාවශ්‍ය අංගයක් වූ ජාතික ඒකාබද්ධ සූචිය, ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් ආරම්භ කර ඇත. දැනට දිවයිනේ පුස්තකාල දහයකට අධික සංඛ්‍යාවක් මෙහි සාමාජිකත්වය ලබා ඇත.

## පොත් පිරුළු සේවය

පොත් පිරුළු සේවය යටතේ කෝට්ටේ අධ්‍යාපන මණ්ඩලයේ පාසැල් 10 කට ද, කොළඹ පාසැල් 08 කට ද, කොලොන්නාව මණ්ඩලයේ පාසැල් 13 කටද, ගම්පහ පාසැල් 07 කට ද නව වාරය සඳහා පොත් පෙට්ටි සපයන ලදී.

### පිරිවෙන් පුස්තකාල පිළිබඳ තොරතුරු සංග්‍රහයක්

පිරිවෙන් පුස්තකාල පිළිබඳ සම්පූර්ණ තොරතුරු ලබාගෙන එම තොරතුරු ආශ්‍රිතව තොරතුරු සංග්‍රහයක් සකස් කිරීමේ අරමුණින් තොරතුරු ලබා ගැනීමේ පත්‍රිකාවක් සියලුම පිරිවෙන් පුස්තකාල වලට යොමු කර ඇත. මේ සඳහා පිරිවෙන් පුස්තකාල නාම ලේඛනයක් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ලබා ගෙන ඇත. එම ලේඛනයට අනුව පවතින පිරිවෙන් පුස්තකාල සංඛ්‍යාව හාරසිය විසි දෙකකි. මෙම තොරතුරු පත්‍රිකාව ලැබී නොමැති පිරිවෙන් පුස්තකාල මේ පිළිබඳව ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ, පර්යේෂණ හා සංවර්ධන අංශයේ සහකාර අධ්‍යක්ෂගෙන් විමසිය යුතුවේ.

### දිස්ත්‍රික්ක නවයක පුස්තකාල පිළිබඳ තොරතුරු රැස් කිරීම

ගාල්ල, මහනුවර, බදුල්ල, රත්නපුර, මොනරාගල, අනුරාධපුර, නුවරඑළිය, මාතර, කුරුණෑගල දිස්ත්‍රික්ක තුළ ඇති පුස්තකාල පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. විශ්ව විද්‍යාල පුස්තකාල හා බහුතාක්ෂණික විද්‍යාල පුස්තකාල මෙම ව්‍යාපෘතියට ඇතුලත් නොවන අතර, අනික් සියලුම පුස්තකාල වල තොරතුරු දිස්ත්‍රික්ක මට්ටමින් ලබා ගැනීම සිදු වෙමින් පවතී.

## විශේෂ පුස්තකාල

### NIHS LIBRARY EXPANDS ITS SERVICES

"New Building Block for the NIHS Library & Documentation Centre was ceremonially opened by the Hon. Minister of Health, Dr. Ranjith Atapattu on April 29, 1987.

The new Centre is housed in this spacious building block which is 3500 sq. ft. in area. It includes a Reference Section, Lending Section, Reading Room, Seminar Room, Document Reproduction Room and a periodicals room etc. Seating capacity has been increased from 35 seats to 125 seats.

This Library & Documentation Centre is a part of new building complex which was ceremonially opened by Hon. Minister of Health. Ministry of Health received financial assistance for this project from the United States Agency for International Development (USAID). Total cost of the project was 53.2 million rupees.

## විශ්ව විද්‍යාල පුස්තකාල

### නව තනතුරකට

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයීය පුස්තකාලයේ සහකාර පුස්තකාලයාධිපති තනතුරකට ජී. එම්. පුංචි බණ්ඩා මහතා පත් කර ඇත. ඒ මහතා මීට කලින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පුස්තකාලයාධිපති තනතුරේ සේවය කළේය.

## මහජන පුස්තකාල

### කරුණානායක විශ්‍රාම යයි

පුස්තකාලයාධිපතිවරයකු මෙන්ම ලේඛකයකු වශයෙන්ද ප්‍රසිද්ධියක් ඉසිලූ සරත් කරුණානායක මහතා මහජන පුස්තකාල සේවයෙන් විශ්‍රාම ගෙන ඇත. මාවතගම, පානදුර, මොරටුව, කුරුණෑගල, මහනුවර, කොළඹ මහජන පුස්තකාල වල කරුණානායක මහතා සේවය කර ඇත. විශ්‍රාම ගන්නා විට ඒ මහතා සේවය කළේ කොළඹ මහජන පුස්තකාලයේය.

### ශෝක ජනක පුවතක්

දෙහිවල මධ්‍ය පුස්තකාලයේ පුස්තකාලයාධිපතිනි සුනීතා සෙනෙවිරත්න මහත්මිය කලක් රෝගාතුරව සිට අභාවප්‍රාප්ත වූ පුවත පුස්තකාල ප්‍රවෘත්ති සංවේගයෙන් වාර්තා කරයි. දෙහිවල මධ්‍ය පුස්තකාලයේ වර්තමාන දියුණුවේ පුරෝගාමී වූ සෙනෙවිරත්න මහත්මිය මීට කලින් මාතර හා කෝට්ටේ මහජන පුස්තකාල වල සේවයේ යෙදුනි.

## ශ්‍රී ලංකා පුස්තකාල සංගමය

### පුස්තකාල සංගමයේ නව නිලධාරි මණ්ඩලය

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වාර්ෂික රැස්වීම පසුගියදා කෘෂිකාර්මික පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන දේශනාගාරයේදී පවත්වන ලදී. එම රැස්වීමේදී පහත සඳහන් නිලධාරි මණ්ඩලය 1987 / 88 වසර වෙනුවෙන් පත්කර ගන්නා ලදී. සභාපති: ඩබ්. බී. දෙරකුඹුර මහතා, උප සභාපතිවරු: සී. එල්. එම්. නෙත්තසිංහ මෙනවිය, එම්. එස්. යූ. අමරසිරි මහතා, ලේකම්: ඩබ්. රණසිංහ මහතා; උප ලේකම්: ඊ. කේ. ගුණරත්න මහතා, අධ්‍යාපන නිලධාරි: එන්. යූ. යාපා මහතා, සහකාර අධ්‍යාපන නිලධාරි: පී. විදනපතිරණ මහතා, භාණ්ඩාගාරික: ඇම්. එෆ්. හමීඩ් මහතා, ප්‍රකාශන නිලධාරී: එස්. එන්. නාවාන මෙනවිය, පුස්තකාලයාධිපති: එස්. ජයතිලක මහතා

### ගෞරව සම්මාන සාමාජිකත්වය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සංගමය විසින් එම සංගමයේ ගෞරව සම්මාන සාමාජිකත්වය ශ්‍රී ලංකාවේ පුස්තකාල සේවයට කළ උපරිම සේවාව අගය කිරීමක් වශයෙන් ප්‍රධාන පෙළේ පුස්තකාලයාධිපතිවරුන් තිදෙනෙකුට පසුගියදා පැවති වාර්ෂික රැස්වීමේදී පිරිනමන ලදී. පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ හිටපු පුස්තකාලයාධිපති - එච්. ඒ. අයි. ගුණතිලක මහතා, කැලණිය විශ්ව විද්‍යාලයේ හිටපු පුස්තකාලයාධිපති ටී. ජී. පියදාස මහතා, කොළඹ මහජන පුස්තකාලයේ හිටපු පුස්තකාලයාධිපතිනි ඊශ්වරී කොරයා මහත්මිය, ගෞරව සම්මාන සාමාජිකත්වය ලැබූ අය වූහ.

නියමිත ප්‍රමිතියට අනුකූලව පිළියෙළ වූ

# පුස්තකාල ලිපිද්‍රව්‍ය හා උපකරණ

| | | | | | |
|---|---|---|---|---|---|
| 01. | පොත් තුණ්ඩු | 100 | — | රු. | 10. 00 |
| 02. | දින පත්‍රිකා | 100 | — | රු. | 10. 00 |
| 03. | පාඨක බලපත්‍ර | 100 | — | රු. | 21. 00 |
| 04. | නියමු ලේබල් (ඉංග්‍රීසි, සිංහල) | 100 | — | රු. | 29. 18 |
| 05. | සුචි පත්‍රිකා | 100 | — | රු. | 15. 00 |

විමසීම්,

**සභාපති,**
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
තැ. පෙ. 1764,
නිදහස් මාවත,
කොළඹ 07.


දුරකතන: 598847
95200

# පුස්තකාල සංවර්ධන සේවා


දිවයිනේ මධ්‍යම හා කුඩා ප්‍රමාණයේ පුස්තකාල සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය වැඩ පිළිවෙළ ගණනාවක්ම ක්‍රියාත්මක කරගෙන එයි. ඉන් එකක් වන පොත් පත් ආධාර දීමේ සේවාව යටතේ 1986 වර්ෂය තුළ පහත සඳහන් ප්‍රදනයන් කර ඇත.

| පුස්තකාල වර්ගය | සංඛ්‍යාව | පොත් ගණන | වටිනාකම |
|---|---|---|---|
| පාසල් පුස්තකාල | 67 | 5894 | 133938. 88 |
| මහජන පුස්තකාල | 21 | 4583 | 109817. 30 |
| වෙනත් පුස්තකාල | 78 | 8377 | 190057. 36 |
| **එකතුව** | 166 | 18854 | 433815. 54 |

# අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක හඳුන්වා දෙයි.



අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක මෙරටට හඳුන්වා-දීම සඳහා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ මෙහෙයීමෙන් ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවැත්වුණු ප්‍රථම රැස්වීම ආරම්භ කරමින් චාරිත්‍රානුකූල පොල්තෙල් පහන දල්වීමේ කාර්යයට මණ්ඩලයේ සභාපති සුගුණදස අතුකෝරාළ, අධ්‍යක්ෂ එන්. අමරසිංහ යන මහත්වරුද ප්‍රමිති ග්‍රන්ථ අංක ව්‍යාපෘතිය භාර නිලධාරිනී ජානකී ප්‍රනාන්දු මහත්මියද, ප්‍රකාශකයන් වෙනුවෙන් මර්වින් පෙරේරා මහතාද එක්වූ අයුරු.




අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ලබා ගත් ප්‍රකාශන ආයතනයක නියෝජිතවරියක් ඒ පිළිබඳ සහතිකය සභාපති එස්. අතුකෝරාළ මහතා අතින් ලබා ගනී. වමේ සිට දකුණට අධ්‍යක්ෂ එන්. අමරසිංහ, නියෝජ්‍ය අධ්‍යක්ෂ උපාලි අමරසිරි යන මහත්වරු සහ ව්‍යාපෘතිය භාර නිලධාරිනී ජානකී ප්‍රනාන්දු මහත්මිය ද වෙති.

★ ★ ★



එම රැස්වීමට සහභාගී වීමට පැමිණි විවිධ ප්‍රකාශන ආයතනවල නියෝජිතයෝ.



ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ලේඛකයන්ට හා ප්‍රකාශකයන්ට පොත් පළ කිරීම සඳහා අනුග්‍රහය දක්වන අතරම පාඨකයාට ද අඩු මිලට පොත් සපයා දීමයි. මේ අරමුණ ඇතිව පොත් ප්‍රදර්ශන හා පොත් අලෙවි හල් දෙකක් පසුගිය කාලය තුළදී පැවැත්විණි. 1987 කතරගම ගම් උදාව ප්‍රදර්ශන භූමියේදී පැවති අලෙවි හලට පැමිණි අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් ඊ. එල්. විජේමාන්න මහතා ද අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ ලේකම් එම්. ඩී. සී. සිල්වා මහතා ද ව්‍යාපෘතියෙන් පළ කරන ලද පොතක් පිළිබඳව පුස්තකාල මණ්ඩලයේ සභාපති සුගුණදාස අතුකෝරාළ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ උපාලි අමරසිරි යන මහත්වරුන් සමග කතාබහක යෙදී සිටිති.

# ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතියේ පොත් අලෙවි හල්



මෙවැනිම පොත් අලෙවි හලක් මාතර ශ්‍රී රාහුල විද්‍යාලයයේදී ද පැවැත්විණි. එම අලෙවි හලට පැමිණි රාජ්‍ය සාහිත්‍ය සම්මාන දිනූ ලේඛක ලේඛිකාවන් චිරාගත පොල්තෙල් පහන දල්වීමෙන් පොත් දැක්ම විවෘත කළ අවස්ථාව. මෙහි පින්තූරයේ වමේ සිට දකුණට පුස්තකාල සේවා මණ්ඩලයේ නෙල්සන් පීරිස්, ජී. එම්. පුංචි බණ්ඩා, ලේඛක පියදාස වැලිකන්නගේ, මණ්ඩලයේ සභාපති එස්. අතුකෝරාළ, ලේඛක ආචාර්ය සුනිල් ආරියරත්න, ලේඛක ලීල් ගුණසේකර යන මහත්වරුද, ලේඛිකා හේමා චන්ද්‍රිකා ලියනගේ මහත්මිය ද වෙති.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් ගල්කිස්සේ ඩබ්ලිව්. ඩී. සී. ග්‍රෑප් (ප්‍රින්ටර්ස්)හි මුද්‍රණය කරවන ලදී.

**National Digitization Project**

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07

2. Date Scanned : 2017/10/10

3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara

4. Scanning Officer

Name : N.D.R. Gamage

Signature : ..........

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ..........

Date : 2017/10/10

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*